# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,870 — 1969 සැප්තැම්බර් 5 වැනි සිකුරාද — 1969.9.5

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1521 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 1560 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1538 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1538 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1558 | විවිධ දැන්වීම් ... ... ... | 1561 |


## තනතුරු – ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ජෛවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවය වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්තම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) විශිෂ්ට චරිතයෙන් සහ හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1969. 9. 19 වැනි දිනට වයස අවුරුදු 30 කට නොවැඩිබව (දැනට රජයේ සේවයේ නියුක්ත අයවළුන්ට මෙහි උපරිම වයස් සීමාව අදාල නොවනු ඇත.)

(ඇ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංජිනේරු උපාධියක්, හෝ,

(ii) මූලික ගණිතය දෙවන විෂය සහිතව භෞතික විද්‍යාවෙන් ලබාගත් 1 වැනි පංතියේ හෝ 2 වැනි පංතියේ හෝ උපාධියක්, හෝ,

(iii) භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, මූලික ගණිතය සහිත 1 වැනි පංතියේ හෝ 2 වැනි පංතියේ හෝ උපාධියක් හෝ ඇති බව. ඉංජිනේරු සුදුසුකම් ඇති අයට වැඩි කැමැත්ත දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ).

(බී) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එවවේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ('' බී '' සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡෙදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද ('' ඒ '' සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

9–141/1—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ. 65/එක්ස්. 2138/69.

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ක්‍රම විශ්ලේෂක තනතුර

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ක්‍රම විශ්ලේෂක තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත්, පහත සඳහන් දිනට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 සැප්තැම්බර් මස 19.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 සැප්තැම්බර් මස 26.

**සටහන්.**—(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු, රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූ ද, මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයින්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට, නියමිත කාල සීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගත් අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම තනතුරට පත්කරනු ලබන පිරිමි අපේක්ෂකයින් පත් කිරීමේ දින සිට තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්වනු ඇත. පත්කරනු ලබන අපේක්ෂිකාවන් පළමුවෙන් අර්ථසාධක අරමුදල් ක්‍රමය යටතේ පත්කරනු ඇත. ඔවුන් පත්වීමේ දින සිට අවුරුදු තුනක පරීක්ෂණ කාලසීමාවකට යටත්වනු ඇත. එම අපේක්ෂිකාවන්ට අවුරුදු දහයක සේවය සම්පූර්ණ කිරීමට පෙර ඊනැම් අවස්ථාවකදී විශ්‍රාම වැටුප් ලබන තත්ත්වයට පැමිණීමට කැමැත්ත ප්‍රකාශ කළ හැකිය. එසේ කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් පසුව නැවත එය අවලංගු කළ හැකි නොවේ.

දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් තනතුරක් දරන නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත්, ඔහු නියමිත කාලසීමාවක් සඳහා වැඩ බැලීමට පත් කරනු ඇත.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය: වර්ෂයකට රු. 4,080 න් පටන් ගෙන රු. 360 බැගින් වාර්ෂික වැඩිවීම් 12 ක් හා රු. 480 බැගින් වාර්ෂික වැඩිවීම් 6 ක්ද සහිතව රු. 11,280 දක්වා වේ. මේ වැටුප් ක්‍රමයේ රු. 8,880 වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

**සටහන.**—තෝරාගනු ලබන අපේක්ෂකයාගේ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව ඔහු වැටුප් ක්‍රමයේ ආරම්භක වැටුපට වඩා ඉහළ වැටුපක තැබීමට සුදුසු වන්නේ නම්, භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව, ඔහු එවැනි වැටුප් පියවරක තැබිය හැක. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයෙකු තෝරාගනු ලැබුවහොත්, ඔහුගේ වැටුප නිශ්චය කරනු ලබන්නේ අංක 492 හා 59.6.13 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් සංශෝධනය කරන ලද අංක 361 හා 57.2.26 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ දක්වෙන නීතිරීති අනුවය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(ඒ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1969 සැප්තැම්බර් 19 වැනිදා තමන්ගේ වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි. (දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක අර්ථශාස්ත්‍රය, ගණිතය හෝ සංඛ්‍යාති යන විෂයයන් එකකින් ලබාගත් පළමුවැනි හෝ දෙවැනි පෙළ ගෞරව උපාධියක් සහ කොම්පියුටර් ක්‍රමවල වැඩ සටහන් සම්පාදනය කිරීම පිළිබඳ යටත් පිරිසෙයින් එක් අවුරුද්දක පළපුරුද්ද.

(ඩී) සියළුම අයදුම්කරුවන් දක්ෂතා පරීක්ෂණ එකකට හෝ වැඩි ගණනකට පෙනී සිටිය යුත්තාහ. එම පරීක්ෂණයෙන්/පරීක්ෂණ යන්ගෙන් ප්‍රමාණවත් පරිදි උසස් තත්ත්වයක් අත්කර ගන්නා අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා සලකා බලනු ඇත.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ල අවශ්‍ය වූ විටෙක ඉදිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ).

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(සී) චරිත සහතික දෙකක්, (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැළකිය යුතුය.**—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන් ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබුනා වූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ 1, තැ. පෙ. 500,
ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

9–141/2—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ. 66/එක්ස්. 2139/69.

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### වැඩ සටහන් සම්පාදක තනතුර

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වැඩ සටහන් සම්පාදක තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත්, පහත සඳහන් දිනට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 සැප්තැම්බර් මස 19 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 සැප්තැම්බර් මස 26 වැනිදා.

**සටහන.**—(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරනවිට අයදුම්කරු, රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″ × 4″ ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දාවූ ද මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම් කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට, නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවෙන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු:**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි, දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගත් අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම තනතුරට පත්කරනු ලබන පිරිමි අපේක්ෂකයින් පත් කිරීමේ දින සිට තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්වනු ඇත. පත්කරනු ලබන අපේක්ෂකාවන් පළමුවෙන් අර්ථසාධක අරමුදල් ක්‍රමය යටතේ පත්කරනු ඇත. ඔවුන් පත්වීමේ දින සිට අවුරුදු තුනක පරීක්ෂණ කාලසීමාවකට යටත්වනු ඇත. එම අපේක්ෂිකාවන්ට අවුරුදු දහයක සේවය සම්පූර්ණ කිරීමට පෙර ඕනෑම අවස්ථාවකදී විශ්‍රාම වැටුප් ලබන තත්ත්වයට පැමිණීමට කැමැත්ත ප්‍රකාශ කළහැකිය. එසේ කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් පසු ව නැවත එය අවලංගු කළහැකි නොවේ.

දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් තනතුරක් දරන නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත්, ඔහු නියමිත කාලසීමාවක් සඳහා වැඩ බැලීමට පත්කරනු ඇත.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය—වර්ෂයකට රු. 4,080 න් පටන් ගෙන රු. 360 බැගින් වාර්ෂික වැඩිවීම් 12 ක් සහිතව රු. 8,400 දක්වා වේ.

**සටහන.**—තෝරාගනු ලබන අපේක්ෂකයාගේ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව ඔහු වැටුප් ක්‍රමයේ ආරම්භක වැටුපට වඩා ඉහළ වැටුපක තැබීමට සුදුසුවන්නේ නම්, භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව, ඔහු එවැනි වැටුප් පියවරක තැබිය හැක. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයෙකු තෝරාගනු ලැබුවහොත්, ඔහුගේ වැටුප නිශ්චය කරනු ලබන්නේ අංක 492 හා 59.6.13 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් සංශෝධනය කරන ලද අංක 361 හා 57.2.26 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ දැක්වෙන නීතිරීති අනුවය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1969 සැප්තැම්බර් 19වැනිදා තමන්ගේ වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි. (දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක අර්ථ ශාස්ත්‍රය, ගණිතය හෝ සංඛ්‍යාති යන විෂයයන්ගෙන් එකක් සහිත උපාධියක් වැඩ සටහන් සම්පාදනය කිරීම හෝ කොම්පියුටර් යන්ත්‍ර ක්‍රම හෝ පිළිබඳ දැනීමක් දැනටමත් ලබා ඇති අයදුම්කරුවන්හට විශේෂ සැළකීමක් දක්වනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—වාර්ෂිකව රු. 4,080 ට නොඅඩු වැටුපක් ලබන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරීන්, අධ්‍යාපනික සුදුසුකම් නොසළකා මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වන්නාහ.

(ඩී) සියලුම අයදුම්කරුවන් දක්ෂතා පරීක්ෂණ එකකට හෝ වැඩි ගණනකට පෙනීසිටිය යුත්තාහ. එම පරීක්ෂණයෙන්/පරීක්ෂණයන්ගෙන් ප්‍රමාණවත් පරිදි උසස් තත්ත්වයක් අත්කර ගන්නා අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා සළකා බලනු ලබන්නෝය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ල අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය, (සෑ.යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(සී) චරිත සහතික දෙකක්, (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.)

(ඩී) වෘත්තීය සහ හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැළකිය යුතුය.**—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම් පත් ගැන සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන්

සභාවේ ලේකම්ට දනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද (''බී'' සළකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිත කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වන ඡෙදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද (''ඒ'' සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිලිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දන්වීමක් නොලැබුනාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අගෝස්තු මස 29 ද,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

9–141/3—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ. 67/එක්ස්. 2140/69.

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### දත්ත සැකසුම් අධිකාරි තනතුර

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත සැකසුම් අධිකාරි තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත්, පහත සඳහන් දිනට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර 1969 සැප්තැම්බර් මස 19 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 සැප්තැම්බර් මස 26 වැනිදා.

**සටහන්.**—(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු, රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″ × 4″ ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දාවූ ද, මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හා ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාල වලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට, නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවෙන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි, දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගත් අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපි අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම තනතුරට පත් කරනු ලබන පිරිමි අපේක්ෂකයින් පත් කිරීමේ දින සිට තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්වනු ඇත. පත්කරනු ලබන අපේක්ෂිකාවන් පළමුවෙන් අර්ථසාධක අරමුදල් ක්‍රමය යටතේ පත්කරනු ඇත. ඔවුන් පත්වීමේ දින සිට අවුරුදු තුනක පරීක්ෂණ කාලසීමාවකට යටත්වනු ඇත. එම අපේක්ෂිකාවන්ට අවුරුදු දහයක සේවය සම්පූර්ණ කිරීමට පෙර ඕනෑම අවස්ථාවකදී විශ්‍රාම වැටුප් ලබන තත්ත්වයට පැමිණීමට කැමැත්ත ප්‍රකාශ කළහැකිය. එසේ කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් පසුව නැවත එය අවලංගු කළ හැකි නොවේ.

දනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් තනතුරක් දරන නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත්, ඔහු නියමිත කාලසීමාවක් සඳහා වැඩ බැලීමට පත්කරනු ඇත.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය :—වර්ෂයකට රු. 4,080 න් පටන්ගෙන රු. 360 බැගින් වාර්ෂික වැඩිවීම් 12 ක් හා රු. 480 බැගින් වාර්ෂික වැඩිවීම් 6 ක් ද සහිතව රු. 11,280 දක්වා වේ. මේ වැටුප් ක්‍රමයේ රු. 8,880 වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

**සටහන.**—තෝරාගනු ලබන අපේක්ෂකයාගේ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව ඔහු වැටුප් ප්‍රමයේ ආරම්භක වැටුපට වඩා ඉහළ වැටුපක තැබීමට සුදුසු වන්නේ නම්, භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව, ඔහු එවැනි වැටුප් පියවරක තැබිය හැක. දනටමත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයෙකු තෝරාගනු ලැබුවහොත්, ඔහුගේ වැටුප නිශ්චය කරනු ලබන්නේ අංක 492 හා 59.6.13 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් සංශෝධනය කරන ලද අ,ක 361 හා 57.2.26 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ දක්වෙන නීතිරීති අනුවය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1969 සැප්තැම්බර් මස 19 වැනිදා තමන්ගේ වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි. (දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක අර්ථ ශාස්ත්‍රය, ගණිතය හෝ සංඛ්‍යාති පිළිබඳ පළමු හෝ දෙවැනි පෙළ ගෞරව පංතියේ උපාධියක් සහ දත්ත සැකසුම් වැඩ පිළිබඳ කළමනාකාර හෝ සමාන තනතුරක යටත්පිරිසෙයින් අවුරුදු දෙකක පළපුරද්ද.

(ඩී) සියලුම අයදුම්කරුවන් දක්ෂතා පරීක්ෂණ එකකට හෝ වැඩි ගණනකට පෙනී සිටිය යුත්තාහ. එම පරීක්ෂණයෙන්/පරීක්ෂණයන්ගෙන් ප්‍රමාණවත් පරිදි උසස් තත්ත්වයක් අත්කර ගන්නා අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා සළකා බලනු ඇත.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ල අවශ්‍යවූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය, (සැ.යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(සී) චරිත සහතික දෙකක්, (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.)

(ඩී) වෘත්තීය සහ හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැළකිය යුතුය.**—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගෙන් අයදුම් පත් ගැන සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද (''බී'' සළකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිත කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සාභවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගෙ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වන ඡෙදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද (''ඒ'' සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිලිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණ බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දන්වීමක් නොලැබුනාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය,
තැ. පෙ. 500.

9–141/4—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 80/එක්ස්. 2141/69.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### කෘෂිකාර්මික ආර්ථික විද්‍යාඥ සහ ගොවිපල සැළසුම්කරු තනතුර

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කෘෂිකාර්මික ආර්ථික විද්‍යාඥ සහ ගොවිපල සැළසුම්කරු තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්‍යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ.පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි:—

(ඒ) මෙරට ඉල්ලුම්පත්—1969.9.19 වැනි ද.

(බී) විදේශීය ඉල්ලුම්පත්—1969.9.26 වැනි ද.

**සටහන් :**

(I) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″ × 4″ ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(II) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරාගත යුතුය.

(III) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්‍යාලවලින් ලබාගත හැක. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්‍යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(IV) **වෛද්‍ය පරීක්ෂණ හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවනු ඇත. මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ලෙස ප්‍රකාශ කිරීමට ඉක්මණින් ක්‍රියාකරගෙන යනු ලැබේ. එසේ කිරීමෙන් පසු වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය:— රු. 13,800—රු. 600 බැගින් වූ වාර්ෂික වැටුප් වැඩිවීම් 3 ක් මගින් රු. 15,600 දක්වා.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය:—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1969.9.19 දිනදී වයස අවුරුදු තිස්පහට නොඅඩු සහ අවුරුදු හතලිස් පහට නොවැඩි බව. (දනටමත් රජයේ සේවයේ හෝ සංස්ථාවන්හි ස්ථිර සේවයේ නියුතුවූවන් හට මෙම වයස් සීමාව බල නොපානු ඇත.)

(සී) (අ) අර්ථ ශාස්ත්‍රය, කෘෂිකර්මය හෝ කෘෂිකාර්මික අර්ථ ශාස්ත්‍රය පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරයෙකු විය යුතු අතර කෘෂිකාර්මික අර්ථ ශාස්ත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක්

සහ

(ආ) රජයේ දෙපාර්තමේන්තුවක හෝ නම් දැරූ වෙළඳ ආයතනයක හෝ පර්යේෂණ කාර්‍යයන්හි යටත් පිරිසෙයින් අවුරුදු දහයක පළපුරුද්දක් ලබා ඇති බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපෙක්ෂකයෙකුම සූදනම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ.යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂතැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්‍යවරයාගෙන් හෝ මහාචාර්‍යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.

(I) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(II) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවන ලද (''ආ'' සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද ''අ'' සලකුණ දරණ මුද්‍රිත තැපැල් පත එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හෝ අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969.8.29 දින,
කොළඹ 1, තැ.පෙ 500,
ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලයේ දී ය.

9–141/5—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

අංකය : ඒජ්. 80/එක්ස් 2144/69

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ඉලෙක්ට්‍රෝනික් පිළිබඳ II වැනි ශ්‍රෙණියේ කථිකාචාර්ය තනතුර හෝ එම තනතුරට පුහුණුවන්නකුට ශිෂ්‍යත්වයක් පිරිනැමීම

අධ්‍යාපන හා සංස්කෘතික් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ඉලෙක්ට්‍රෝනික් පිළිබඳ II වැනි ශ්‍රෙණියේ කථිකාචාර්ය තනතුර හෝ එම තනතුරට පුහුණුවන්නකුට ශිෂ්‍යත්වයක් පිරිනැමීම සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 සැප්තැම්බර් මස 19 වැනි දා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 සැප්තැම්බර් මස 26 වැනි දා.

**සටහන.**—(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″ × 4″ ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දාවූද, මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුයි.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුලතදී භාරදීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනිසිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය :— වාර්ෂිකව රුපියල් 4,080—360—රු. 8,400.

**සටහන.**—(i) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධිධරයින් හෝ ඉලෙක්ට්‍රෝනික් විද්‍යාවෙන් එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. වැනි පශ්චාත් උපාධි ලබා ඇත්තාවූ අය වාර්ෂිකව රු. 5,160 ක ආරම්භක වැටුපක් ලැබීමට හිමිකම් ලබති.

(ii) ගුරු අභ්‍යාස විද්‍යාලයක හෝ ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයක හෝ කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ හෝ එවැනි උසස් තත්ත්වය කට සමාන හෝ උසස් පිළිගත් ආයතනයක අවුරුදු 3 ක ඉගැන්වීමේ පළපුරුද්ද ඇති උපාධිධරයින්ට ද වාර්ෂිකව රු. 5,160 ක ආරම්භක වැටුපක් නියම කරනු ලැබේ.

(iii) එම්. අයි. ඊ. ඊ. සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ඇත්නම් ඔවුනට ද වර්ෂයකට රු. 7,320 ක ආරම්භක වැටුපක් හිමි වේ.

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංජිනේරු උපාධි ලත් II වැනි ශ්‍රෙණියේ කථිකාචාර්යවරුන් ඔවුන්ගේ වැටුප් ක්‍රමයේ උපරිමය වන වර්ෂයකට රු. 8,400 ක වැටුප් පියවරට පැමිණ එක් අවුරුද්දක් එම වැටුප් පියවරෙහි සේවය කරනු ලැබුවේ නම් ඔව්හු රු. 480 බැගින් වාර්ෂික වැටුප් වර්ධකයන් සහිතව අවුරුද්දකට රු. 10,800 ක වැටුප් පියවර දක්වා වැටුප් ලැබීමට හිමිකම් ලබති.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1969.9.19 වැනිදා තමන්ගේ වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබන ලද ඉලෙක්ට්‍රෝනික් හා විදුලි සංදේශ විෂයයන් ඇතුළත් විදුලි ඉංජිනේරු උපාධියක් ලබා තිබීම (බී. එස්. සී. ඉං.ජී) හෝ

(ආ) එම්. අයි. ඊ. ඊ. I වැනි, II වැනි හා III වැනි කොටස් සමග අවුරුදු 3 ක ප්‍රායෝගික පළපුරුද්දක්, හෝ

(ඇ) ඉලෙක්ට්‍රෝනික් හා විදුලි සංදේශ විෂයයන් ඇතුළත් පිළිගත් ඉංජිනේරු ඩිප්ලෝමා උපාධියක් ලබා තිබීම, සහ

(ඩී) සිංහලෙන් ඉගැන්වීමට පුළුවන්වීම හෝ පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ඇතුළතදී සිංහල භාෂාවේ ප්‍රවීනත්වයක් ලබා ගැනීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂතැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ. යු.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තමතමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙනසේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද (''බී'' සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සමග භාවිත කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ II ඡෙදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තමතමන්ට නිකුත්කරන ලද (''ඒ'' සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත එහි සඳහන්කොට ඇති පරිදි සම්පූර්ණකොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණ බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබුවාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම්දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහාලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය,
තැ.පෙ. 500.

9-141/7—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

අංකය : ඒබී. 69/එක්ස්. 2145/69.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### වාණිජ විද්‍යා 1 වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර හෝ එම තනතුරට පුහුණු වන්නකු තෝරා ගැනීම

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ විද්‍යා පිළිබඳ 1 වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර හෝ එම තනතුරට පුහුණු වන්නකු ලෙස පත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මඟින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 සැප්තැම්බර් මස 19 වැනි ද.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 සැප්තැම්බර් මස 26 වැනි ද.

**සටහන.**—(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″×4″ ප්‍රමාණයට කුඩා නො වූද, තම ලිපිනය ලියන ලද්දවූද, මුද්දර නො ගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි ය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු :**—ලංකාණ්ඩුව යටතේ සේවය, සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තු ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :** මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරා ගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා :** මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :—

වාර්ෂිකව, රු. 8,880—480—13,200 (රු. 11,280 ක වැටුපෙහි අවුරුදු දෙකක නැවතීමක් සහ රු. 11,760 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක්).

සැ. යු.—5 වන ඡේදය යටතේ පුහුණුවන්නකු තෝරාගනු ලැබුවහොත් ඔහුට ගෙවිය යුතු වැටුප හෝ දීමනා භාණ්ඩාගාරයේ උපදෙස් අනුව තීරණය කරනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්:**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1969.9.19 වැනිද තමන්ගේ වයස අවුරුදු 30 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතු ය. (දනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම වයස් සීමාව අදාල නොවේ.)

(ඉ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ විද්‍යාව හෝ අර්ථ ශාස්ත්‍රය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ I වැනි හෝ II වැනි පෙළ ගෞරව උපාධිය. සහ

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක එම්. කොම්. හෝ එම්. ඇස්. සී. (අර්ථ ශාස්ත්‍රය) හෝ එම්. ඒ. (අර්ථ ශාස්ත්‍රය) හෝ ඊට සමාන හෝ උසස් සුදුසුකම්. සහ

(iii) රජයේ ආයතනයක හෝ සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක හෝ අවුරුදු 5 ක ඉගැන්වීමේ හා/හෝ ප්‍රායෝගික පළපුරුද්ද. සහ

(ඊ) සිංහලෙන් ඉගැන්වීමට පුළුවන්වීම හෝ පත්වීමේ දින සිට අවුරුදු 3 ක කාලයක් ඇතුළත දී සිංහල භාෂාවේ ප්‍රවීණත්වයක් ලබා ගැනීම.

5. **(i) පුහුණු සඳහා පිරිනැමෙන ශිෂ්‍යත්ව පිළිබඳ කොන්දේසි :—**

4 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් ඇති කිසිවෙකුගෙන් ඉල්ලුම් පත්‍ර නො ලැබුණහොත් හෝ තනතුරු සඳහා සුදුසු අයදුම්කරුවෙකු නොසිටිය හොත් පුහුණු වන්නකු පත් කර ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගේ ඉල්ලුම් පත්‍ර සැළකිල්ලට භාජනය කරනු ලැබේ:—

(අ) වයස් සීමාවන් 1969.9.19 දිනට වයස අවුරුදු 28ට නො අඩු අවුරුදු 40ට නො වැඩි විය යුතු ය. (මෙම වයස් සීමාවන් සියලුම අයදුම්කරුවන්ට එකසේ බලපායි).

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ විද්‍යාව හෝ අර්ථ ශාස්ත්‍රය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ I වැනි හෝ II වැනි පෙළ ගෞරව උපාධිය.

(ඉ) රජයේ ආයතනයක හෝ සංස්ථාවක හෝ පෞද්ගලික ආයතනයක අවුරුදු 5ක ඉගැන්වීමේ හා/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

(ඊ) විශිෂ්ඨ චරිතයක් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවත් ය.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයාට පිටරට ගොස් පුහුණුවක් ලබන ලෙස නියම කරන්නට ඉඩ තිබේ. එසේ පුහුණුවන කාලය තුළ සුදුසු අන්දමේ දීමනාවක් ඔහුට ගෙවනු ලැබේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයා පිටරට ගොස් පුහුණුවක් ලැබිය යුතු යයි නියම කළහොත් ඔහු ලංකාණ්ඩුව සමඟ ගිවිසුමකට බැඳිය යුතු වන්නේ ය. එම ගිවිසුම යටතේ පොරොන්දු විය යුතු වෙනත් දේවල් අතර ඔහු පහත සඳහන් පොරොන්දුවලට ද බැඳිය යුතු වේ. එනම්—

(අ) නියමිත අභ්‍යාස පාඨමාලාව අවංක ලෙස සහ උත්සාහවන්තව හදරා සතුටුදායක අන්දමින් නිම කිරීමට සහ එසේ නිම කිරීමෙන් පසු නියමිත කාල පරිච්ඡේදයක් තුළ ලංකාණ්ඩුවේ සේවය කළ යුතු යයි කියා සිටියහොත් (කාල පරිච්ඡේදය නියම කිරීම ලංකාණ්ඩුව විසින් කෙරෙනු ඇත.) එසේ සේවය කිරීමට ද,

(ආ) ගිවිසුමේ රෙගුලාසි සහ කොන්දේසි පිළිපැදීමට තමා අපොහොසත් වුවහොත් ලංකාණ්ඩුව විසින් සහ/හෝ ශිෂ්‍යත්ව ප්‍රදාන ඒජන්සිය විසින් පුහුණු කිරීමේ මූළු කාර්යය වෙනුවෙන් කරන්නට යෙදුන සියලුම වියහියදම් (එනම්, වැටුප් දීමනා, යානා ගාස්තු සහ වෙනත් ගාස්තු ආදිය) ලංකාණ්ඩුවට ආපසු ගෙවීමට ද සිදුවෙයි.

(iv) තෝරා ගනු ලබන අපේක්ෂකයා පිළිගත් විශ්ව විද්‍යාලයක එම්.කොම්. හෝ එම්. ඇස්. සී. (අර්ථ ශාස්ත්‍රය) හෝ එම්. ඒ. (අර්ථ ශාස්ත්‍රය) හෝ ඊට සමාන හෝ උසස් සුදුසුකම් ලබාගත යුතුය.

6. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය. (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ),

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය,

(ඉ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය,

(ඊ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(උ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ.යු.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය. (ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

7. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කල යුතු ය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදද්දැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සමඟ භාවිතා කළ හැකිය.

8. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගෙ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

10. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුනු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969, අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

9–141/8—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### රජයේ ගුරු විද්‍යාලයයන්හි කෘෂිකර්ම අභ්‍යාසාචාර්ය තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ ගුරු විද්‍යාලයයන්හි කෘෂිකර්ම අභ්‍යාසාචාර්ය තනතුරු (සිංහල හා දෙමළ මාධ්‍ය) සඳහා ඉල්ලුම් පත් එවන ලෙස පුරුෂ පක්ෂයේ අයදුම්කරුවන්ට මෙයින් ආරාධනය කරනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව පිළියෙල කරගත යුතු වූ අයදුම්පත්, 1969.9.19 වැනි දිනට පෙර, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, ස්ථිර ලේකම් (ගුරු විද්‍යාල ශාඛාව) වෙත ලැබෙන සේ එවිය යුතුය.

සටහන් :—

(I) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම සඳහා කරන ඉල්ලීම් භාරගත නොහැකිය. මෙම දැන්වීමේ දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව, අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍රය පිටපත් කර ගත යුතුය.

(II) යම්කිසි අයදුම්පතක් තැපැලේ දී නැති වී හෝ ප්‍රමාද වී හෝ ඇතැයි ඉදිරිපත් කරන කිසිම දෝෂාරෝපනයක් ගැන සලකා බැලිය නොහැක. ස්වකීය අයදුම්පත් එවීමට අවසාන දිනය තෙක් පමාවන අයදුම්කරුවන් විසින් එසේ පමාවීමෙන් සිදු වන පාඩුව විඳ දරාගත යුතුය.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—

(ඒ) පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් රෙගුලාසි යටතේ මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ, ගුරුවරුන් වශයෙන් විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරණ අයදුම්කරුවන් මෙම තනතුරු සඳහා තෝරාගනු ලැබුවහොත්, ඔවුන් මෙම තනතුරු දරණ තෙක්, තනතුරු විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ලැබේ.

(බී) තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ගුරු විදුහලකට පත් කර යැවීමට ඉඩ තිබේ.

3. **වැටුප් හා දීමනා :** මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය :—

රු. 3,060—7 × 120—8 × 180—2 × 240—රු. 5,820 වාර්ෂික.

4. **අවශ්‍ය සුදුසුකම් :** සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බව,

(බී) 1969.9.19 වැනි දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 25ට අඩු හෝ අවුරුදු 50ට වැඩි හෝ නොවිය යුතුයි. (රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහළ වයස් සීමාව අදාල නොවේ.)

(සී) අයදුම්කරුවන් කෘෂිකර්මය පිළිබඳ උපාධිධාරීන් විය යුතු අතර, උපාධියෙන් පසු අවුරුදු 3ක ඉගැන්වීමේ පළපුරුද්දක් ලැබ සිටින්නන් විය යුතුය. නැතහොත් පුහුණුවීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 5ක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති ද්විතීයික පුහුණු (කෘෂිකර්ම) ගුරුවරුන් හෝ විශේෂඥ පුහුණු (කෘෂිකර්ම) ගුරුවරුන් විය යුතුය. ඔවුන්ට සිංහල/දෙමළ පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය.

5. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වැනි ඡෙදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදල පොදු කොන්දේසිවලටද අවධානය යොමු කරනු ලැබේ.

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1969 අගෝස්තු මස 26 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

### ආදර්ශ ආකෘති පත්‍රය

#### රජයේ ගුරු විද්‍යාලයයන්හි කෘෂිකර්ම අභ්‍යාසාචාර්ය තනතුරක් පිළිබඳ ඉල්ලුම් පත්‍රයයි

1. (I) සම්පූර්ණ නම :————.
   (II) මුලකුරුත් සමඟ නම :————.

2. ලිපිනය :—
   (I) පෞද්ගලික :————.
   (II) රාජකාරි :————.

3. 1969.9.19 වැනි දිනට නිවැරදි වයස :—
   අවුරුදු ...........මාස...........දින...........

4. ජාතිය හා එය ලද අන්දම :————.

5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ඉ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.

6. ලබාගත් දින සමග අධ්‍යාපන සුදුසුකම් (ලබා තිබෙන අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික වල පිටපත් ඇමිණිය යුතුය) :————.

7. වෘත්තීය සුදුසුකම් (ලබාතිබෙන වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය) :————.

8. ඉගෙනීම ලැබූ පාසල් හා විද්‍යාල (ඇතුළත්වූ සහ අස්වූ දින සඳහන් කළ යුතුය) :————.

9. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දැක්වෙන පෝර්මයෙහි විස්තර සඳහන් කරන්න) :—

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | ඇතුලත්වූ දිනය | අස්වූ දිනය | දැරූ තනතුර | සේවාකාලය | | | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|---|---|
| | | | | අ. | මා. | දි. | |
| | | | | | | | |

10. සිංහල/දෙමළ පිළිබඳව ලබා තිබෙන සුදුසුකම් :————.

11. චරිත සහතික ලබාගත් අයගේ (ඥතීන් නොවේ) නම් හා නිලතල (සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය). රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය:————.

12. වෙනත් සුදුසුකම් :————.

මවිසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වූවහොත්, මා එයින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව තෝරා පත්කර ගැනීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුණහොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා රාජකාරියෙන් පහකර දමනු ලැබීමට යටත්වන බවද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

9—146—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—කුරුණෑගල

### කුරුණෑගල කණිෂ්ඨ කාර්මික ආයතනය—බාහිර උපදේශක තනතුරු 1969/70

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කුරුණෑගල කණිෂ්ඨ කාර්මික ආයතනයෙහි බාහිර උපදේශක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්පත්‍ර කුරුණෑගල කණිෂ්ඨ කාර්මික ආයතනයේ ආයතනාධිපති වෙත 1969.9.26 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ යැවිය යුතුය. අපේක්ෂකයින් තම තමන්ගේ අධ්‍යාපනික, වෘත්තීය, කාර්මික සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සියලුම විස්තර ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කළ යුතුය. පන්ති පැවැත්වෙන මාධ්‍ය, විෂයය ඉදිරියෙන් පෙන්වා ඇත. එක් එක් විෂය සඳහා වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුයි.

1. සිංහල භාෂාව
2. ගණිතය
3. තාපය, ආලෝකය, ශබ්දය
4. විදුලිය හා කාන්දම් බලය
5. ගෘහ නිර්මාන ශිල්පය
6. ව්‍යවහාරික ගණිතය
7. වාණිජ අංක ගණිතය
8. වාණිජ භූගෝලය
9. යතුරු ලිවීම
10. ලඝුලේඛනය
11. වාණිජ විද්‍යා මූලධර්ම
12. ගණන් තැබීම
13. වාණිජ විද්‍යා හා මුදල්
14. විදුලි කම්බි සවිකිරීම (න්‍යාය)
15. විදුලි කම්බි සවිකිරීම (ප්‍රායෝගික)
16. ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීම (න්‍යාය)
17. ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීම (ප්‍රායෝගික)
18. කර්මාන්තශාලා පුහුණුව
19. මැනීම සහ මට්ටම් කිරීම
20. ජලනළ සවිකිරීම (න්‍යාය සහ ප්‍රායෝගික)

(1–20: සිංහල මාධ්‍යය)

| | | |
|---|---|---|
| 21. | ගණිතය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 22. | තාපය, ආලෝකය, ශබ්දය | |
| 23. | විදුලිය හා කාන්දම් බලය | |
| 24. | යාන්ත්‍රික ඇඳීම | |
| 25. | විද්‍යුත් විද්‍යාව | |
| 26. | ව්‍යවහාරික ගණිතය | |
| 27. | සෞඛ්‍ය ඉංජිනේරු විද්‍යාව | |
| 28. | ද්‍රව්‍ය හා ව්‍යුහ | |
| 29. | තාප යන්ත්‍ර | |
| 30. | ගෘහ නිර්මාන ශිල්පය | |
| 31. | වාණිජ අංක ගණිතය | |
| 32. | වාණිජ භූගෝලය | |
| 33. | යතුරු ලිවීම | |
| 34. | ලඝුලේඛනය | |
| 35. | වාණිජ විද්‍යා මූලධර්ම | |
| 36. | ගණන් තැබීම | |
| 37. | වාණිජ විද්‍යා හා මුදල් | |
| 38. | ඉංග්‍රීසි භාෂාව | |
| 39. | මැනීම සහ මට්ටම් කිරීම | |

2. බාහිර උපදේශකවරුනට ගෙවන ගාස්තු ඔවුන්ගේ සුදුසුකම් පළපුරුද්ද හා උගන්වන පංතිය අනුව පැයකට රු. 5 සිට රු. 15 දක්වා වෙනස් වනවා ඇත.

3. මෙම තනතුර අවුරුද්දේ ඔක්තෝබර් මස පටන්ගෙන ඊළඟ අවුරුද්දේ අගෝස්තු මස අවසන් වේ. අවශ්‍යතාවයේ හැටියට ඊට කලින් වුවද අවසන් කෙරෙනු ඇත.

4. පංති පැවැත්වෙනුයේ උදේ 8.30 සිට සංවස 4.30 දක්වා සහ සවස 5 සිට රාත්‍රි 7.30 දක්වාද හෙයින් මේ කාලය ඇතුළත උගැන්වීමට හැකි අයගෙන් පමණක් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ. තමන්ට සුදුසු කාලවේලා ඉල්ලුම්පත්‍රයේ නිසියාකාරව සඳහන් කළ යුතුයි.

5. බාහිර උපදේශක වරුන් විසින් මධ්‍ය වාර්ෂික පරීක්ෂණයන්හි සහ අභ්‍යන්තර නොවූ පරීක්ෂණයන් නොයොදවන වර්ෂ අවසාන පරීක්ෂණ යන්හිදී අමතර ගාස්තුවක් නොමැතිව තමන්ගේ පංතිවල ශිෂ්‍යයන් පරීක්ෂා කළ යුතුය.

6. රාජ්‍ය සේවාවෙහි යෙදී සිටින ඉල්ලුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කල යුත්තේ තම තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මගිනි. එවැනි ඉල්ලුම්පත්‍ර නියම කරන ලද දිනට පෙර ආයතනාධිපති වෙත නො ලැබුනහොත්, ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කරනු නොලබන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඒවා කලට වේලාවට ලැබී පිළිගත හැකි හේතුවක් නිසා ප්‍රමාද වුවහොත් පමණි.

7. අයදුම් පත්‍රයේ තමා අපේක්ෂා කරන තනතුරට අදළ විෂයය පැහැදිලිව දක්වීම ඉතා වැදගත් අවශ්‍යතාවයක් බව සැලකුව මැනවි.

ඩී. එස්. කළුගම්පිටිය,
කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 ක්වූ අගෝස්තු මස 23 වෙනි දින,
කුරුණෑගල අධ්‍යාපන කායාර්ලයේ දීය.

9—134—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව—ගුවන් භටයින්

### අයදුම්කරුවන්ට උපදෙස්

ගුවන් හමුදාවේ නිත්‍ය සේවය සඳහා මෙහි පහත සඳහන් පුරප්පාඩු පිරවීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

| වෘත්තීන් | | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| *ගුවන් යානා සැකිලි ශිල්පී | ... | 6 |
| *ගුවන් යානා යන්ත්‍ර ශිල්පී | ... | 8 |
| *මෙවලම් ශිල්පී | ... | 1 |
| *අවි ආයුධ ශිල්පී | ... | 2 |
| *ගුවන් විදුලි යන්ත්‍ර ශිල්පී | ... | 3 |
| *විදුලි පණිවුඩ යන්ත්‍ර ශිල්පී | ... | 3 |
| ලිපිකරු පොදු රාජකාරි | ... | 4 |
| දුරකථන ක්‍රියාකරු | ... | 3 |
| මෙහෙයවීම් භූමි | ... | 20 |

2. අවශ්‍ය සුදුසුකම්—

සාමාන්‍යයෙන්

(අ) සෑම අයදුම්කරුවෙකු ම,

(i) ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

(ii) 1969 සැප්තැම්බර් මස 20 වැනි දිනට වයස අවුරුදු 18 ට අඩු නොවිය යුතු මෙන්ම අවුරුදු 22 ට නොවැඩි විය යුතුයි.

(iii) අවිවාහක විය යුතුයි. (සේවයට බැඳී අවුරුදු දෙකක් ගත වන තෙක් ගුවන් භටයින්ට විවාහ වීමට අවසර දෙනු නොලැබේ).

අධ්‍යාපනය :

(ආ) අපේක්ෂකයින් අඩු වශයෙන් විෂයයන් හතරකින් පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත් විය යුතුය.

(i) කාර්මික වෘත්තීන් සඳහා අයදුම් කරන්නන් ගණිතයෙන් සමත්වී සිටිය යුතුයි. අතිරේක වශයෙන් භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ව්‍යවහාරික ගණිතය යන විෂයන්ගෙන් සමත්වී සිටින අපේක්ෂකයින් ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ. (කාර්මික වෘත්තීන් * සලකුනෙන් පෙන්නුම් කර ඇත).

(ii) ලිපිකරු පොදු රාජකාරි වෘත්තිය සඳහා අයදුම් කරන්නන් හට, යතුරු ලියනය/ලඝු ලේඛණය සම්බන්ධයෙන් නිපුනත්වයක් ලබා තිබේනම් ඔවුන් ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ.

(iii) අධ්‍යාපන හා වයස සම්බන්ධව නියමිත සුදුසු කම් අඩුවුවද විශේෂ දක්ෂතාවයන් හෝ කාර්මික දැනුමක් හෝ ඉල්ලුම් කරනු ලබන වෘත්තියට අදල වෙනත් අත්දමේ පුහුණුවක් ලබා ඇති යම්කිසි අයදුම්කරුවෙක් ඇත්නම්, ගුවන් හමුදාපති තුමාගේ කැමැත්ත අනුව ඔහු ගැන සලකා බැලීමට අවකාශ තිබේ.

(ඇ) සෞඛ්‍ය තත්වය : උස අඩි 5 යි අඟල් 5 යි, පපුව (හුස්ම පහලට හෙලා සිටින විට) අඟල් 32 ක් සහ බර රාත්තල් 105 ක් විය යුතුයි.

3. සේවා කොන්දේසි—

(අ) සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි :—

(i) අයදුම්කරුවන් වශයෙන් තෝරාගත් විට නිත්‍ය ගුවන් හමුදාවේ සේවයට බඳවා ගනු ලැබේ. සේවයට බඳවාගනු ලැබුවායින් පසු, ඔවුහු ගුවන් හමුදාවේ අවුරුදු දොලහක් (12) සේවය කළ යුතුයි. එයින් අවුරුදු පහක් (5)ක් නිත්‍ය ගුවන් හමුදාවේ සේවය කළ යුතු අතර, අවුරුදු හතක් (7) නිත්‍ය උප සේවයේ සේවය කළ යුතුයි. ඉතා මත් දුෂ්කරතාවයන් මධ්‍යයෙහි රටේ ඕනෑම පලාතක දිවා රෑ දෙකෙහි සේවය කිරීමට සූදානම්ව වැඩ කළ හැකි නිරෝගී සම්පන්න තරුණයන්ට හොඳ මතු බලාපොරොත්තු ඇති කර ගත හැක. විටින් විට සංශෝධනය කර ඇති 1962 සැප්තැම්බර් මස 14 වෙනි දිනැති අංක 13,301 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරණ ලද ගුවන් හමුද විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් හිමිවීමට සුදුසුකම් ලබාගැනීම සඳහා සුදුසු ගුවන් භටයින්ට තවදුරටත් සේවය කිරීමට අවස්ථා සලසා දෙනුවස්, නැවත සේවයට පත්කර ගැනීමට අවකාශ ඇත.

(ආ) ගුවන් භටයින් ගුවන් හමුද පනතට (ලංකා ව්‍යවස්ථාදයක නියෝගවල 359 වෙනි ඡෙදය) ගුවන් හමුද රෙගුලාසි වලට සහ නියෝගවලට යටත්ව කටයුතු කළ යුතුයි.

(ඇ) රාජ්‍ය භාෂාව පිළිබඳ අවශ්‍යතාවයන්—ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති වලට අනුකූලව ක්‍රියා කළ යුතු බව, තෝරාගනු ලැබූ අපේක්ෂකයින් විසින් මතක තබා ගත යුතුයි.

(ඈ) වැටුප් හා දීමනා ගෙවන ප්‍රමාණය—විටින් විට සංශෝධනය කර ඇති 1961 අප්‍රේල් මස 28 වෙනි දිනැති අංක 12,395 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරණ ලද 1961 ගුවන් හමුද වැටුප් සංග්‍රහය අනුව, වැටුප් හා දීමනා ගෙවනු ලැබේ.

(ඉ) සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දායක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4 ක මුදලක් අඩුකර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරාගනු ලබන අපේක්ෂකයා විසින් දිය යුත්තේය.

4. අනිකුත් අවශ්‍යතාවයන්—

(අ) මෙම නිවේදනයේ අන්තිමට පෙන්වා ඇති උපලේඛනයේ ආකෘතිය පත්‍රය අනුව අයදුම් පත් පිළියෙල කර එවිය යුතුයි. අයදුම්පත් එවීම සඳහා මුද්‍රණය කරන ලද පිටපත් නොමැත. අයදුම්කරුවන් විසින් තම අයදුම් පත් සකස් කර ගත යුතුයි.

(ආ) රාජකීය ලංකා ගුවන් හමුද මූලස්ථානයට ලැබෙන සේ, 1969 සැප්තැම්බර් මස 20 වෙනි හෝ ඊට ප්‍රථම ලියාපදිංචි කල තැපෑලෙන් අයදුම් පත් එවිය යුතුයි. අයදුම් පතේ උඩ කෙළවරේ සහ අයදුම් පත බහාලන කවරයේ වම් කෙළවරේ උඩ ''අයදුම් පත ගුවන් භටයින්'' යනුවෙන් සඳහන් කළ යුතුයි. තවද අයදුම් පතේ සියළුම කොටු හැකි තරම් විස්තර ඇතිව ඉතා පැහැදිලිව සම්පූර්ණ කර තිබිය යුතුයි.

(ඇ) අයදුම් පත් මේ ලිපිනයට එවිය යුතුයි :—

ගුවන් හමුදාධිපති තුමා,
තැ.පෙ. 594,
කොළඹ.

(ඈ) අයදුම්කරු දැනට සේවය කරන ස්ථානයේ ස්වාමියාගෙන් ලබාගත් නිර්දේශයන් ද අයදුම්පත සමඟ අමුනා එවිය යුතුයි. අනිකුත් අයදුම් කරුවන් අන්තිමට ඉගෙන ගත් පාසැලේ ප්‍රධානාචාර්ය තැනගෙන් ලබාගත් චරිත සහතික පතක් සහ අයදුම්කරු පසුගිය අවුරුද්ද තුල පුද්ගලිකව හඳුනන වගකිය යුතු පුද්ගලයකුගෙන් ලබාගත් චරිත සහතික පත් දෙකක් අයදුම්පත් සමඟ අමුනා එවිය යුතුයි.

(ඉ) අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම් පත්වල පහත සඳහන් ලියවිලි වල පිටපත් (මුල් පිටපත නොව) අමුනා එවිය යුතුයි:—

(i) උප්පැන්න සහතික පත්‍රය (බෞතිස්ම සහතික පත්‍ර හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කරන ලද සහතික පත්‍ර භාරගනු නොලැබේ.)

(ii) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(iii) ඉහත සඳහන් 4 වෙනි ඡෙදයේ (ඈ) උප ඡෙදයේ දැක්වෙන චරිත සහතික පත්‍ර.

**සැලකිය යුතුයි.**—මෙම සහතික පත්‍රවල සහ චරිත සහතික පත්‍ර වල මුල් පිටපත් අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ විට ඉදිරිපත් කළ යුතුයි.

(ඊ) අයදුම් පත් ලැබුන බව දන්වනු නොලැබේ.

(උ) අයදුම් පත් ලැබීමෙන් පසුව, යම්කිසි අයදුම් කරුවෙක් ඔහු විසින් ඉල්ලුම් කර ඇති තනතුරට පත් කිරීම සඳහා සුදුසුයයි සලකනු ලැබුවහොත්, ඔහුට ඔහුගේ වියදමින් නියමිත දිනයත් සහ වේලාවත්දන්වනු ලබන ස්ථානයකට පැමිණ ගුවන් හමුදාවේ ආධුනික භටයින් බඳවා ගන්නා නිලධාරීන් ඉදිරිපිට පෙනී සිටීමට උපදෙස් දෙනවා ඇත. පිළිගත් හඳුනා ගැනීමේ පත්‍රයක් හෝ හඳුනා ගැනීම සඳහා වෙනත් සතුටුදායක සාක්ෂි ඔහු ඉදිරිපත් කළ යුතුයි.

(ඌ) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව, සුදුසුයයි හැඟෙන අයදුම්කරුවන් වෛද්‍ය මංඩලයක් විසින් පරීක්ෂා කරනු ලැබේ.

(ඍ) සමර්ථවී තෝරා පත්වූ අපේක්ෂකයින් නිත්‍ය ගුවන් හමුදාවේ 2 වෙනි පෙල (ආධුනික) ගුවන් භටයින් ලෙස බඳවා ගනු ලැබේ.

(ඎ) යම්කිසි අපේක්ෂකයෙකු තෝරාගැනීම සම්බන්ධව අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑමට උත්සාහ කරන ලැබුව හොත් ඒ හේතුවෙන් ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේය. මෙම නියෝගය තදින් ක්‍රියාවේ යොදවනු ලැබේ.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාධිපති තැන.

1969 අගෝස්තු මස 24,
රාජකීය ලංකා ගුවන් හමුදාව,
තැ.පෙ. 594,
කොළඹ.

## උපලේඛනය

### අයදුම් පත

1. (අ) අගට යෙදෙන නම (පෙලපත් නාමය) සම්පූර්ණයෙන් :————.
(පැහැදිලි අකුරින්)
(ආ) සෙසු නම් (සම්පූර්ණයෙන්) :————.
(පැහැදිලි අකුරින්)
(ඇ) ලියුම් ලැබෙන පිළිවෙල :————.
(සම්පූර්ණයෙන්)
2. පදිංචි ස්ථානයට තුදුරු විදුලි පණිවුඩ කාර්යාලය :————.
3. පදිංචි ස්ථානයට තුදුරු පොලිස් ස්ථානය :————.
4. පදිංචි ස්ථානයට තුදුරු දුම්රිය ස්ථානය :————.
5. උපන් දිනය :————.
6. (අ) උස :————.
(ආ) පපුව :————.
(ඇ) බර :————.
7. උපන් ස්ථානය :————.
(අ) ගම :————.
(ආ) ග්‍රාම සේවක කොට්ඨාශය :————.
(ඇ) පළාත :————.
8. ජාතිය :————.
9. උත්පත්තියෙන් පියාගේ නම :————.
(ලියා පදිංචි වීමෙන් පුරවැසිකම ලබා ඇත්නම් එම සහතිකයේ අංකය සහ දිනය සඳහන් කළ යුතුයි)
10. තමා පාසැල හෝ විද්‍යාලය හැර යාමෙන් පසු නියුක්තවූ රක්ෂාවන් : ————.
11. සමර්ථවී ඇති විභාගය—විෂයයන් සහ දිනයන්ද ඇතුළත්ව :————.
12. වෘත්තීය තේරීම් (i) ————. (2) ————.
13. මීට පෙර සන්නද්ධ හමුදාවක හෝ ස්වේච්ඡා සේවයක යෙදී ඇතිනම්, එහි සියළුම විස්තර කෙටියෙන් හා දරණ ලද තනතුරු සහ දිනයන්ද ඇතුළුව :————.
14. සිවිල් අධිකරණයක/යුද්ධාධිකරණයක වැරදිකරු වී හෝ ඇහ බැඳ තිබේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර :————.
15. වෙනත් අදාල කරුණු :————.
16. ක්‍රීඩා පිළිබඳ ලබාගෙන ඇති තත්වය සම්පූර්ණ විස්තර සහිතව :————
17. ඉදිරිපත් කර ඇති චරිත සහතික ලබාගෙන තිබෙන අයගේ නම් සහ තනතුරු :————.
18. අයදුම්කරු විසින් අත්සන් තැබිය යුතු ප්‍රකාශය :—

මෙම අයදුම් පත්‍රයෙහි මා විසින් සඳහන් කොට තිබෙන සියළු විස්තර සත්‍ය වූද, නිවැරදි වූද, කරුණු බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ ඔප්පුවුවහොත්, තෝරා බඳවා ගැනීමට පෙර වරද අනාවරණය වී නම් නුසුදුස්සෙකු වීමටද, බඳවා ගැනීමෙන් පසු වරද අනාවරණය වී නම්, ගුවන් හමුද පනතේ නියම කර ඇති පරිදි දඬුවම් වලට යටත් විය යුතු බව මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–70—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## ගාලු දිස්ත්‍රික්කයේ කඩවත් සතර කොට්ඨාශයේ (දඩල්ල සහ ගින්තොට කොටස් හැර) පටබැඳි ආරච්චි ධූරය

ගාලු දිස්ත්‍රික්කයේ, කඩවත් සතර කොට්ඨාශයේ (දඩල්ල සහ ගින්තොට හැර) පටබැඳි ආරච්චි ධූරය සඳහා අයදුම් පත් එවන ලෙස සුදුස්සන්ට මෙයින් ආරාධනා කරමි. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ අන්දමට පිළියෙල කරන ලද අයදුම්පත්, වර්ෂ 1969 ක්වූ සැප්තැම්බර් මස 30 දිනට හෝ ඊට ප්‍රථම ගාල්ලේ කඩවත් සතරේ ප්‍රාදේශීය ආදායම් නිලධාරීට ලැබෙන ලෙස ඔහුගේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුය :—

ප්‍රාදේශීය ආදායම් නිලධාරී, කඩවත් සතර, නගර ශාලාව, ගාල්ල.

2. මෙම තනතුර සඳහා වැටුපක් නොමැත. නමුත් වර්ෂය අවසානයේදී පාරිතෝෂික මුදලක් ඔහුට ගෙවනු ලැබේ.

3. රාජකාරිය :

(අ) ගාලු දිස්ත්‍රික්කයේ කඩවත් සතර තුළ (දඩල්ල සහ ගින්තොට කොටස් හැර) මුහුදු වෙරළේ වැලි, හුණුගල්, කළුගල්, කොරල්, පාවී යන දේවල් සහ වෙනත් දේවල් ආරක්ෂා කිරීම.

(ආ) මාළු දැල් සහ බෝට්ටු ආදිය ලියා පදිංචි කිරීම.

(ඇ) ධීවර ආරවුල් නිරවුල් කිරීම සහ නීතිරීති ක්‍රියාවේ යෙදවීම.

(ඈ) බලපත්‍ර පිට මුහුදු වැලි ගෙනයාමේ පරිපාලනය කිරීම.

4. අවශ්‍ය සුදුසුකම් :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30ට නොඅඩු විය යුතුයි.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්තවිය යුතුයි.

(ඇ) ගාලු දිස්ත්‍රික්කයේ කඩවත් සතරේ සීමාව (ගින්තොට හා දඩල්ල හැර) මුහුදුකරයේ පදිංචි අයවලුන් විය යුතුය.

(ඈ) අඩුම ගණනේ සිංහල, ඉංග්‍රීසි හෝ දෙමළ හත්වැනි පන්තියෙන් සාමර්ථය ලබා සිටිය යුතුය.

(ඉ) ලංකා පුරවැසියෙක් විය යුතුය.

5. අයදුම් කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර සමඟ පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) අධ්‍යාපන සහතිකය,

(ඇ) චරිත පිළිබඳ මෑතදී ලබාගත් සහතික දෙකක්.

6. ඉල්ලුම් පත් ලැබුණු බැව් දන්වනු නොලැබේ.

පී. ඒ. ටී. ගුණසිංහ,
ගාලු දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1969.8.21 දින,
ගාලු කච්චේරියේ දී ය.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

### ගාලු දිස්ත්‍රික්කයේ කඩවත් සතර කොට්ඨාශය සීමාව තුළ (දඩල්ල සහ ගින්තොට හැර) පටබැඳි ආරච්චි ධුරය

1. අයදුම්කරුගේ නම හා ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) අගට යෙදෙන නම :————.
   (ආ) අනෙක් නම් :————.
2. ස්ථිර පදිංචිය : ස්ථානය සහ එහි පදිංචි කාලය :————.
3. (අ) 1969.9.30 දිනට සම්පූර්ණ වයස : අවු. :————. මාස :———
   දින :————.
   (ආ) උපන් දිනය සහ ස්ථානය :—
   උපන් දිනය :————.
   ස්ථානය :————.
4. විවාහක හෝ අවිවාහක භාවය :————.
5. අධ්‍යාපනික සුදුසුකම් :————.
6. දනට කරන රක්ෂාව :————.
7. ණය ගැති ද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
8. තමා සතු දේපලවල වටිනාකම සහ සම්පූර්ණ ප්‍රමාණය :————.
9. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුව අධිකරණයෙන් දඬුවම් විඳ ඇත්ද ? :————.
10. මෙම තනතුර සඳහා පළපුරුද්ද :————.
11. මෙම තනතුර සඳහා වෙනත් හිමිකම් පිළිබඳ විස්තර :————.
12. මීට පෙර රැකියාවක් කළේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරු.

දිනය :————.

ලිපිනය :————.

9–42—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—බණ්ඩාරවෙල

**බදුල්ලේ කණිෂ්ඨ කාර්මික ආයතනයෙහි බාහිර උපදේශක තනතුරු—1969–70**

බදුල්ලේ කණිෂ්ඨ කාර්මික ආයතනයෙහි බාහිර උපදේශක තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර බදුල්ලේ කණිෂ්ඨ කාර්මික ආයතනයේ ආයතනාධිපති වෙත 1969 සැප්තැම්බර් 15 වන දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ යැවිය යුතුය. අපේක්ෂකයින් සිය අධ්‍යාපනික, වෘත්තීය, කාර්මික සුදුසුකම් සහ පලපුරුද්ද පිළිබඳ සියලුම විස්තර ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කළ යුතුයි.

2. බාහිර උපදේශක ඇබෑර්තු සඳහා අදළ විෂයයන් මෙහි පහත සඳහන් වේ. පන්ති පැවැත්වෙන මාධ්‍ය විෂයයන් ඉදිරියෙන් පෙන්නුම් කෙරේ. :—

| විෂයයන් | මාධ්‍යය |
|---|---|
| 1. සිංහල භාෂාව ... ... | |
| 2. ගණන් තැබීම ... ... | |
| 3. වාණිජ විද්‍යා මූලධර්ම ... | |
| 4. වාණිජ්‍යය හා මුදල් ... | |
| 5. ලඝු ලේඛණය හා යතුරු ලිවීම ... | |
| 6. වාණිජ අංක ගණිතය ... | |
| 7. වාණිජ භූගෝල විද්‍යාව ... | |
| 8. ගොඩනැගිලි කර්මාන්තය ... | |
| 9. මැනීම සහ මට්ටම් කිරීම ... | |
| 10. භෞතික විද්‍යාව (තාපය, ආලෝකය, ශබ්දය) | |
| 11. භෞතික විද්‍යාව (විදුලිය හා කාන්දම් බලය) | සිංහල මාධ්‍යය |
| 12. විදුලි කම්බි සවිකිරීම (ප්‍රායෝගික හා න්‍යායය) | |
| 13. ගණිතය (ශුද්ධ) ... | |
| 14. ගණිතය (ව්‍යවහාරික) ... | |
| 15. ජ්‍යාමිතික ඇඳීම ... | |
| 16. ව්‍යවහාරික යාන්ත්‍රික විද්‍යාව ... | |
| 17. ද්‍රව්‍ය හා ව්‍යූහය ... | |
| 18. නිර්මාණ ද්‍රව්‍ය හා සංඛ්‍යා ... | |
| 19. සෞඛ්‍ය ඉංජිනේරු විද්‍යාව ... | |
| 20. ජලනල සවිකිරීම (ප්‍රායෝගික හා න්‍යායය) | |
| 21. වඩුවැඩ (න්‍යාය සහ ප්‍රායෝගික) | |

| විෂයයන් | මාධ්‍යය |
|---|---|
| 22. ගණන් තැබීම ... ... | |
| 23. ලඝුලේඛණය හා යතුරු ලිවීම ... | |
| 24. වාණිජ විද්‍යා මූලධර්ම ... | |
| 25. වාණිජ භූගෝල විද්‍යාව ... | |
| 26. වාණිජ අංක ගණිතය ... | |
| 27. ඉංග්‍රීසි ... ... | |
| 28. ගොඩනැගිලි කර්මාන්තය ... | |
| 29. මැනීම සහ මට්ටම් කිරීම ... | |
| 30. භෞතික විද්‍යාව (තාපය, ආලෝකය, ශබ්දය) | ඉංග්‍රීසි මාධ්‍යය |
| 31. භෞතික විද්‍යාව (විදුලිය හා කාන්දම් බලය) | |
| 32. ගණිතය (ශුද්ධ) ... | |
| 33. ගණිතය (ව්‍යවහාරික) ... | |
| 34. ජ්‍යාමිතික ඇඳීම ... | |
| 35. ව්‍යවහාරික හා යාන්ත්‍රික විද්‍යාව | |
| 36. ද්‍රව්‍ය හා ව්‍යූහය ... | |
| 37. නිර්මාන ද්‍රව්‍ය හා සංඛ්‍යා ... | |
| 38. සෞඛ්‍ය ඉංජිනේරු විද්‍යාව ... | |
| 39. ජලනල සවිකිරීම (ප්‍රායෝගික හා න්‍යායය) | |

3. බාහිර උපදේශකවරුන්ට ගෙවන ගාස්තු ඔවුන්ගේ සුදුසුකම්, පළපුරුද්ද හා උගන්වන පන්තිය අනුව පැයකට රුපියල් 5 සිට 15 දක්වා වෙනස් වනවා ඇත.

4. මෙම තනතුරු අවුරුද්දේ ඔක්තෝබර් මස පටන් ගෙන ඊළඟ අවුරුද්දේ අගෝස්තු මස අවසන් වෙයි. අවශ්‍යතාවයේ හැටියට ඊට කලින් වුවද අවසන් කෙරෙනු ඇත.

5. පන්ති පැවැත්වෙනුයේ උදේ 8.30 සිට සවස 4.30 දක්වා සහ සවස 5.00 සිට රාත්‍රි 7.15 දක්වාද හෙයින්, මේ කාලය ඇතුළත උගැන්වීමට හැකි අයගෙන් පමණක් ලැබෙන ඉල්ලුම් පත්‍ර සළකා බලනු ලැබේ. තමන්ට සුදුසු කාලවේලා ඉල්ලුම් පත්‍රයේ නිසියාකාරව සඳහන් කළ යුතුය.

6. බාහිර උපදේශකවරුන් විසින් මධ්‍ය වාර්ෂික පරීක්ෂණයන්හි සහ පිටස්තර පරීක්ෂණයන් නොයොදවන වර්ෂ අවසාන පරීක්ෂණයන්හි අමතර ගාස්තුවක් නොමැතිව තමන්ගේ පන්තිවල ශිෂ්‍යයන් පරීක්ෂා කළ යුතුය.

7. රාජ්‍ය සේවයෙහි යෙදී සිටින ඉල්ලුම් කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ තම තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මගිනි. එවැනි ඉල්ලුම් පත්‍ර නියම කරනලද දිනට පෙර බදුල්ලේ කණිෂ්ඨ කාර්මික ආයතනයේ ආයතනාධිපති වෙත නොලැබුනොත් ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කරනු නොලබන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඒවා කලට වේලාවට ලැබී පිළිගත හැකි හේතුවක් නිසා ප්‍රමාද වූවොත් පමණි.

8. අයදුම් පත්‍රයේ තමා අපේක්ෂා කරන තනතුරට අදළ විෂයය පැහැදිලිව දක්වීම ඉතා වැදගත් අවශ්‍යතාවයක් බව සැලකුව මැනවි.

පී. ඊ. ජී. මෙන්ඩිස්,
බණ්ඩාරවෙල, වැ.බ.ප්‍රා. අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 25 වැනි දින,
බණ්ඩාරවෙල, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

9–105—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කූරු කෝරළේ ''ඒ'' කඳන සුළු නගර සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කූරු කෝරළේ ''ඒ'' කඳාන සුළු නගර සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනා කරමි. පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත් 1969 ඔක්තෝබර් මස 5 වැනි දිනට පෙර එකී කෝරළේ ප්‍රාදේශිය ආදායම් නිළධාරී තැනට ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුයි :—

දකුණු අළුත්කූරු කෝරළේ ''ඒ'' ප්‍රාදේශීය ආදායම් නිළධාරි, ජා-ඇල.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) අයැදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60කට නොවැඩි වීම ;

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්තවීම;

(ඇ) අයදුම්කරු ඉහත කී කඳාන සුළු නගර සහා ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම;

(ඈ) (i) 1925 සිට 1944 කාලයෙහි සිංහල පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහතිකපත්‍ර විභාගයෙන් සමත්වීම; හෝ

(ii) සිංහල භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගය හෝ ඒ හා සමාන හෝ එයට උසස් විභාගයකින් සමත්වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. මෙම ධූරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන්ද, පළාත් පාලන ආයතන වල සාමාජිකයින්ගෙන්ද අයදුම්පත් භාරගනු නොලැබේ.

6. අයදුම්පත් ලැබුණු බවට දන්වීමක් කරනු නොලැබේ. අයැදුම්පත් ලේඛණගත තැපෑලෙන් එවිය යුතුයි.

ඩී. ආර්. උමගිලිය,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1969 අගෝස්තු මස 23 වැනිද,
කොළඹ දිසාපති කාර්යාලයේ දී ය.

## ආදර්ශ ඉල්ලුම්පත්‍රය

### කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළේ "ඒ" කඳාන සුළු නගර සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග පැහැදිළි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————.
4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :————.
   (ආ) උපන් දිනය සහ ස්ථානය :————.
5. විවාහ අවිවාහක බව :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. මීට පෙර රැකියාවක් කළේද? එසේනම් ඒ පිළිබඳ විස්තර :————.
9. තමන් සතු දේපොළවල වටිනාකම සහ ප්‍රමාණයන්, විස්තර සහිතව : ————.
10. අයදුම්කරු ණයගැතිව සිටීද? එසේනම් ඒ පිළිබඳ විස්තර :————.
11. අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවි අධිකරණය මගින් දඬුවම් ලබා තිබේද? :————.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර : ————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–122—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## හින්දි භාෂාව පිළිබඳ අර්ධ කාලීන කථිකාචාර්ය තනතුර

### රජයේ, ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය

කොළඹ, රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ, හින්දි භාෂාව සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම සඳහා අර්ධ කාලීන කථිකාචාර්ය වරයෙකු බඳවා ගනු ලැබේ.

2. මෙම තනතුර සඳහා සියළු දීමනාවන් ඇතුලුව පැයකට රුපියල් 5.00ක දීමනාවක් ගෙවනු ලැබේ. අධ්‍යාපන සුදුසුකම් හා ඉගැන්වීමේ පළපුරුද්ද ආදී විස්තර සඳහන් ඉල්ලුම් පත්‍ර 1969 සැප්තැම්බර් මස 15 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

විද්‍යාලයාධිපති.

1969 අගෝස්තු මස 25 වැනි දින,
බණ්ඩාරනායක පුර, රාජගිරිය,
ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේදී ය.

9–114—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය වින්නඹු මාතාවන්ගේ තනතුරු

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඇති මහජන සෞඛ්‍ය වින්නඹු මාතාවන්ගේ තනතුරු සඳහා 18 මාසයේ පුහුණුව අවසන් කළ වින්නඹු මාතාවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම් පත් මෙහි පහත පෙනෙන ආකෘතිය අනුව පිළියෙළ කර 1969 සැප්තැම්බර් 25 වැනි දිනට පෙර කොළඹ (තැපැල් පෙට්ටිය 500) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වරයා ගේ නමට එවිය යුතුය. ලියුම් කවරයෙහි වම් කෙළවර "මහජන සෞඛ්‍ය වින්නඹු මාතාවන් සඳහා අයදුම් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතු යි.

2. **පඩිය.**—මේ තනතුර සඳහා වර්ෂයකට රු. 750–42 × 15–රු. 1,380 ක වේතනයක් ගෙවනු ලැබේ. පඩිය රුපියල් 1,044 හා රුපියල් 1,170 වන විට කාර්යක්ෂමතා බාධකයන්ට මුහුණ දිය යුතු වෙයි.

3. **සේවා පිළිබඳ කොන්දේසි.**—මේවා විශ්‍රාම වැටුප් හිමි ස්ථිර තනතුර වේ. එසේද වුවත් 1957.4.29 දිනැති අංක 372 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර විශ්‍රාම වැටුප් හිමි ක්‍රමයට මාරු වීමට, පත් වූ දා සිට 10 අවුරුදු කාලයක් තුළ දී කැමැත්ත දක්වා සිටීමේ අයිතියක් ද ඇතිව, මුල් පත්වීම දෙනු ලබන්නේ අර්ථසාධක ක්‍රමයක් පදනම් කොට ගෙනය. තෝරා ගත් අපේක්ෂිකාවන් අවුරුදු 3ක කාල සීමාවක් තුළ පරීක්ෂාව යටතේ තබනු ලැබේ. අයදුම් කරුවන් ලංකාවේ ඕනෑම පළාතක සේවය කිරීමටත් ඔවුන්ට නිකුත් කරනු ලබන පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසිවලට යටත්ව ක්‍රියා කිරීමටත් සූදානමින් සිටිය යුතුය. තෝරා ගනු ලැබූ අපේක්ෂිකාවන් පළමු පත්වීමේ දින සිට යටත් පිරිසෙයින් තුන් අවුරුදු කාල සීමාවක් මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන බවට ගිවිසුමකට ද බැඳීමට සූදානම් විය යුතු යි.

4. **සුදුසුකම්.**—(අ) 1969 සැප්තැම්බර් මස 25 වැනි දිනට වයස අවු. 35 ට අඩු විය යුතුය.

(ආ) දැනට ලියාපදිංචිව ඇති වින්නඹුවක් විය යුතුය. කලින් වින්නඹු සේවයෙහි යෙදී සිටියවුන් ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. **නිල ඇඳුම්.**—සේවයෙහි යෙදී සිටින අවස්ථාවල දී ඇඳීමට අවශ්‍ය වන නිල ඇඳුම් සපයනු ලැබේ.

6. ඉල්ලුම් පත්‍ර මා නමට හෝ වෙනත් නිලධාරියෙකුගේ පුද්ගලික නමට නො එවිය යුතු යි.

7. ඉහත දක්වන ලද වුවමනාවන් සම්පූර්ණ නොවූ ඉල්ලුම්පත් ඉවත ලන නමුත් ඒ බැව් අයදුම්කරුවන්ට දන්වනු නොලැබේ.

8. මේ සඳහා ඉල්ලා ඇති සහතික පත්වල පිටපත් පමණක් එවිය යුතුයි. යම් හේතුවකින් මුල් සහතිකපත්‍ර එවා තිබුණොත් ඒවා ආපසු එවීමට බැඳී සිටිය නොහැක.

9. රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයෙහි පළවී ඇති රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්වීම් පිළිබඳව පොදු කොන්දේසි බලනු මැනවි.

පී. වී. මහාදේව,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1969 සැප්තැම්බර් 5 වනදා,
කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දීය.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය වින්නඹු මාතාවන්ගේ තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. (අ) ලිපිනය :————.
   (ආ) දිස්ත්‍රික්කය :————.
3. උපන් වර්ෂය හා දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
   (සැලකිය යුතුයි.—පූජකවරයෙකුගේ හෝ ආධාර ලබන පාඨශාලා සඳහා හෝ නිකුත් කළ උප්පැන්න සහතික මේ සඳහා බාර ගනු නොලැබේ.)
4. ජාතිය :————.

5. විවාහක ද අවිවාහක ද යන වග :————.

විවාහක නම් පහත දැක්වෙන කරුණු සඳහන් කළ යුතුයි :—

(අ) විවාහයට පෙර නාමය :————.

(ආ) පුරුෂයාගේ රක්ෂාව හා රක්ෂාව කරන ස්ථානය :————.

(ඇ) දරුවන් ගණන :————.

වැඩිමහල්ම දරුවාගේ වයස :————.

බාලම දරුවාගේ වයස :————.

(විවාහක අයදුම්කරුවන් දෙපාර්තමේන්තුවේ සේවයට බැඳීම ගැන තම ස්වාමි පුරුෂයින්ගේ විරෝධයක් නොමැති බැව් දැක්වෙන ලිපියක් ද ඉදිරිපත් කළ යුතුයි).

6. (අ) වින්නඹුකමේ අවසාන විභාගයෙන් සමත් වූ දිනය :————.

(ආ) පුහුණු වූ මධ්‍යස්ථානයේ නම :————.

(i) ආයතනයන්හි :————.

(ii) ක්ෂෙත්‍රයෙහි :————.

(මේ සම්බන්ධයෙන් ලබාගත් සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි).

7. චරිතය පිළිබඳ මෑතක දී ලබාගත් සහතික දෙකක පිටපත් අමුනන්න.

8. භාෂාව පිළිබඳ දක්ෂතාවය.—

| | කියවීම | ලිවීම | කථා කිරීම |
|---|---|---|---|
| සිංහළ | ............... | ............... | ............... |
| දෙමළ | ............... | ............... | ............... |
| ඉංග්‍රීසි | ............... | ............... | ............... |

9. මීට ප්‍රථමයෙන් දැරූ රජයේ තනතුරු ඇත්නම් ඒවායේ නම් හා ඒවා දැරූ කාලසීමාව ද සඳහන් කරන්න. :————.

10. සහන වින්නඹු මාතාවක් වශයෙන් (රිලීෆ්) සේවය කිරීමට වුවමනා වූ අවස්ථාවක කැඳවීමක් ලද හොත් ඔබ ඊට කැමැති ද ? :————.

11. ඉහත දක්වන සේවා කොන්දේසි පිළිගැනීමට සතුටු ද, නැද්ද යන වග :————.

මම අසමත්කම නිසා රජයේ සේවයෙන් විශ්‍රාම ලබා හෝ සේවයෙන් පහ කර නැති බවත්, උසාවියක් මගින් අපරාධකරුවෙකු වශයෙන් දඬුවම් ලබා නැති බවත් මෙයින් සහතික කරමි. අසත්‍ය ප්‍රකාශ කිරීමේ වරදට දඬුවම සේවයෙන් පහ කිරීම බැව් දනිමි.

————,
අයදුම්කාරිගේ අත්සන.

දිනය :————.

9–84—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය

### සාමාන්‍යාධිකාරි තනතුර

ඉහත දැක්වෙන තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**වැටුප් පරිමාණය.**—සියලු දීමනා ඇතුලුව මසකට රු. 1,800—රු. 50—රු. 2,000.

**සුදුසුකම් :**

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක විද්‍යා උපාධිය සහිත අවුරුදු 15ක පළපුරුද්ද. හෝ,

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධිය සහිත අවුරුදු 12ක පළපුරුද්ද හෝ,

(ඇ) කාර්මික ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය/රසායන ඉංජිනේරු/විදුලි ඉංජිනේරු සහිත අවුරුදු 8ක පළපුරුද්ද තිබිය යුතුයි.

**සේවා කොන්දේසි :**

(1) මෙම තනතුර ස්ථිරය. තෝරාගනු ලබන අයදුම්කරු සංස්ථාවේ රෙගුලාසි අනුව අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලබාගැනීමට සුදුසුවනවා ඇත.

(2) පළමුවෙන් තනතුර සෝදිසි කාලයකට යටත් වේ.

(3) රජයේ භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ අවශ්‍යතාවයන් සපුරාලීමටත්, විශේෂයෙන් 1956 අංක 33 දරණ රජයේ භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීමේ කොන්දේසිවලට අයදුම්කරු යටත් විය යුතුයි.

(4) ඔහු කොළඹ ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතු අතර, පරන්තන්හි කර්මාන්ත ශාලාවට යා යුතුයි.

දැනටමත් රජයේ හෝ රාජ්‍ය සංස්ථාවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් අංක 666 හා 1965 අගෝස්තු 20 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛයේ වගන්ති ප්‍රකාර පමණක් සලකා බලනු ලැබේ. එවැනි අයදුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුයි.

නියමිත පෝරම නොමැත. සුදුසුකම්, පළපුරුදුකම්, වයස, සිංහල පිළිබඳ ප්‍රවීණතාවය ආදී සම්පූර්ණ විස්තර ඇතුළත් අයදුම්පත්, මෑතකදී ලබාගත් චරිත සහතිකවල පිටපත් 2ක්ද, උප්පැන්න සහතිකය සහ පළපුරුදුකම් පිළිබඳ සහතිකය සමඟ 1969.9.19 දිනට හෝ එයට ප්‍රථම සභාපති, පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය, තැ.පෙ. 1489, 21, අබ්දුල් කපූර් මාවත, කොළඹ 3 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි.

සභාපති,
පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය.

9–181—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## ලංකා යුද හමුදවේ දන්ත නිලධාරි තනතුරු

1. ලංකා යුද හමුදවේ දන්ත නිළධාරී තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. තෝරා පත්කර ගනු ලබන ඉල්ලුම්කරුවන්ට ලංකා යුද හමුද වෛද්‍ය බලකායේ කපිතන් නිලයෙහි ස්ථිර අධිකාරී පත්වීම් පිරි නමනු ලැබේ.

3. (ඒ) පත්වීම ලැබීමේදී තෝරා පත්කරගනු ලබන ඉල්ලුම්කරුවන්ට ඔවුන්ගේ පළපුරුදුකම් අනුව පහත සඳහන් වැටුප් ක්‍රමයෙහි සුදුසු ස්ථානයක තබනු ඇත :—

(i) II ශ්‍රෙණිය—වාර්ෂික වැටුප රු. 5,160—රු. 360 වාර්ෂික වැඩිවීම 9 සහ රු. 480 වාර්ෂික වැඩිවීම් 6 — රු. 11,280 දක්වා. රු. 11,280 දී වැඩිවීම් දැවුරුදු කාලසීමාවකට නවතිනු ඇත.

(ii) I ශ්‍රෙණිය—වාර්ෂික වැටුප රු. 11,760 — රු. 480 වාර්ෂික වැඩිවීම් 3 රු. 13,200.

(බී) I වන හා II වන ශ්‍රෙණියන් නොකැඩෙන කාල සීමාවන් වන අතර II වන ශ්‍රෙණියේ වැඩිම වැටුප දැවුරුදු කාල සීමාවකට නවතිනු ඇත.

(සී) පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ :—

(i) රු. 180 ක මාසික සේවා දීමනාවක්.

(ii) ආණ්ඩුවේ නිවාසවල පදිංචි වී නොසිටින කල ආණ්ඩුවේ ගෙවල් කුලී ගෙවීම් ප්‍රමාණය අනුව ගෙවල් කුලී දීමනා. නිළධාරීන් සඳහා වෙන් වූ නේවාසිකාගාරයක පදිංචි වී සිටීම අවශ්‍ය වන්නාවූ ද එසේ ඉඩ කඩ පහසුකම් සලසා දී ඇත්තා වූ ද නිළධාරීන්ට මෙම දීමනාව ගෙවනු නොලැබේ.

(iii) ආණ්ඩුවේ ගෙවීම් ප්‍රමාණය අනුව ජීවනාධාර හා විශේෂ ජීවනාධාර අවිවාහක නිළධාරීන්ට, නිළධාරීන් සඳහා වෙන් වූ නේවාසිකාගාරයක නවාතැන් සලසා දෙනු ඇත. නේවාසිකාගාරය තුල වාසය කරන කාලය තුල ඔවුනට මෙම දීමනාව ගෙවනු නොලැබේ. එහෙත් යුද හමුද වියදමෙන් ඔවුනට නොමිලයේ කෑම බීම සපයනු ඇත.

(iv) නේවාසිකාගාරය තුළ වාසය කිරීමට අණ ලැබ, නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබ, යුද හමුද වියදමෙන් කෑම් බිම් සපයනු ලබන කාලපරිච්ඡේදයන් තුළ සෑම සම්පූර්ණ පැය 24 ක කාලයක් වෙනුවෙන් විවාහක නිළධාරියෙකුට රු. 1.50 ගෙවීම් ප්‍රමාණය අනුව වෙන්වීමේ දීමනාවක් ගෙවනු ලැබේ. එවැනි කාලපරිච්ඡේදයන් තුල ජීවනාධාර, විශේෂ ජීවනාධාර, යැපීම් සහ වෙනත් නවාතැන් ගාස්තු ගෙවනු නොලැබේ.

(v) රජයේ නිළධාරීන්ට ගෙවීමට රජයෙන් අවසර දී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට සහ නියමිත කොන්දේසිවලට අනුව ගමන් වියදම් දීමනා (යැපීම්, නවාතැන්, සැතපුම් ගාස්තු, ස්ථාන මාරු දීමනා) ගෙවනු ලැබේ.

(vi) 1961 යුද හමුද වැටුප් සංග්‍රහයෙහි නියම කර ඇති පරිදි අනිකුත් දීමනා (ඇඳුම් පැළඳුම්, නිළ ඇඳුම්, නඩත්තු හා මෙහෙකරු දීමනා) ගෙවනු ලැබේ.

(ඩී) 1961 සැප්තැම්බර් මස 25 වැනි දින අංක 12,673 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධනය කරන ලද 1961 යුද්ධ හමුද වෛද්‍ය හා දන්ත නිළධාරීන්ගේ රෙගුලාසි යුද්ධ හමුද දන්ත නිළධාරීන් කෙරෙහි බලපවත්වනු ඇත. 1961 යුද්ධ හමුද වෛද්‍ය හා දන්ත නිළධාරීන්ගේ රෙගුලාසිවලට පටහැනි නොවන අනිකුත් සියළුම රෙගුලාසි යුද්ධ හමුද දන්ත නිළධාරීන්ට අදළ වනු ඇත.

4. තෝරාපත් කර ගනු ලබන ඉල්ලුම්කරුවන් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ලැබීමට සුදුස්සන් වනු ඇත. එවැනි විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයන් ගණන් බැලීමේ පදනම, ආණ්ඩුවේ ගැසට් පත්‍ර නිවේදන මගින් විටින් විට සංශෝධනය කරනු ලබන, 1934 පෙබරවාරි මස 5 වැනි දින දරණ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ දක්වා ඇති විධි විධාන අනුව වනු ඇත. වැඩි විස්තර කොළඹ, යුද හමුද මූලස්ථානය වෙතින් ලබා ගත හැක.

5. ඉල්ලුම්කරුවන් විසින් පහත සඳහන් කොන්දේසි සපුරා ලිය යුතුයි:—

(ඒ) **ජාතිය**—ඉල්ලුම්කරුවන් ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(බී) ඉල්ලුම්කරුවන්ගේ වයස 1969 සැප්තැම්බර් 19 වැනි දිනයට අවුරුදු 35ට වැඩි නොවිය යුතුය.

(සී) **අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්.**—අපේක්ෂකයන් ඇල්.ඩී.ඇස්., බී.ඩී.ඇස්. හෝ පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ පරීක්ෂණ මණ්ඩලයකින් ලබාගත් දන්ත සුදුසුකමක් සහ අතිරේකව ලංකා වෛද්‍ය ආයතනයේ දන්ත ශල්‍ය නිළධාරියෙකු වශයෙන් ලියා පදිංචි වී සිටිය යුතුය.

(ඩී) ඉල්ලුම්කරුවන් විසින් නියමිත වෛද්‍ය අවශ්‍යතාවයන් සපුරා ලිය යුතු අතර, ඔවුන් තෝරා පත්කර ගැනීමට ප්‍රථම, යුද හමුද බලධාරීන් පිළියෙල කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

6. ඉල්ලුම්පත් පහත දක්වා ඇති ආකෘති පත්‍රයෙහි නියම කර ඇති පරිදි පිළියෙල කොට 1969 සැප්තැම්බර් 19 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ යුද හමුද මූල්ස්ථානය, තැපැල් පෙට්ටිය 553, කොළඹ, යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම් පත බහා ලන කවරයෙහි " දන්ත නිළධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත " යනුවෙන් සඳහන් කළ යුතුය.

7. රජයේ සේවයේ යෙදී සිටින නිළධාරීන්ගේ ඉල්ලුම් පත්, සෞඛ්‍ය සේවා අධිකාරී මගින් ඉදිරිපත් කළ යුතු අතර යම්කිසි නිළධාරියෙක් තෝරා පත්කර ගනු ලැබුවහොත් ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතුය. දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළ හොත් රජයේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය හමුද විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

8. පහත සඳහන් ලියකියවිලි වල පිටපත් ඉල්ලුම් පතට අමුනා එවිය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය

(බී) තමා ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපනික සහතිකය සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතිකය, සහ

(සී) අඩු ගණනේ චරිත සහතික පත් දෙකක්. මෙම සහතික පත් ඉල්ලුම් කරු පෞද්ගලිකව දන්නා හඳුනන වගකිය යුතු පුද්ගලයන්ගෙන් මෑතකදී ලබාගත් ඒවා විය යුතුය.

9. ලැබෙන ඉල්ලුම්පත් සංඛ්‍යාව ගැන සලකා බලා අවශ්‍ය වුවහොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරෙන් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරා පත්කර ගැනීම කරනු ලබන්නේ, එසේ තෝරාගත් ඉල්ලුම් කරුවන්, ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගන්නා ඉල්ලුම් කරුවනට එය පවත්වන ස්ථානය, දිනය සහ වේලාවන් ලියා දන්වනු ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹ දී පැවැත්වෙන අතර ඒ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ අනිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු නොලබන ඉල්ලුම් කරුවනට ඒ බැව් දන්වනු ඇත.

10. තෝරා පත් කර ගනු ලබන ඉල්ලුම්කරුවන් විසින්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවෙහි යෙදීමට සහ විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණත ක්‍රියාත්මක කිරීම අරභයා දැනටමත් පනවා ඇති හෝ මීට පසුව පනවනු ලැබිය හැකි නීති රීතිවලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ.

11. සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දයක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4 ක මුදලක් අඩුකර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරා ගනු ලබන අපේක්ෂකයා විසින් දිය යුත්තේය.

12. තෝරා පත්කර ගනු ලබන ඉල්ලුම්කරුවන් අවශ්‍ය වුවහොත් ලංකාවේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට සූදානමින් සිටිය යුතුය.

13. ඉල්ලුම්පත් පහත සඳහන් කර ඇති පරිදි පිළියෙල කොට ඉදිරිපත් කල යුතුය. ඉල්ලුම් පත් පෝරම නිකුත් කරනු නොලැබේ.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුද ආඥපති වෙනුවට.

1969 අගෝස්තු මස 29 දින.

**ලංකා යුද හමුදවේ වෛද්‍ය බලකායේ දන්ත නිළධාරී තනතුරු සඳහා ඉල්ලුම් පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. ජාතිය :————.
(ලාංකිකයෙකු වූයේ පෙළපතින් ද ? නැතහොත් ලියා පදිංචි කිරීමෙන් ද ? ලියා පදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය හා දිනය සඳහන් කරන්න.) :————.

3. ලිපිනය :————.

කාර්යාලයේ :————.

වාසස්ථානයේ :————.

4. උපන් දිනය : 1969.9.19 වැනි දිනට වයස :————. අවු :———— මාස :————. දින :————.

5. සම්පූර්ණ නම, උපන් ස්ථානය සහ දැන් ලිපිනය :————.

මවගේ :————.

පියාගේ :————.

6. ඔබ විවාහකද ? අවිවාහක ද ? :————.

7. ඔබ පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ලබාගෙන ඇති ක්‍රීඩා ශූරත්වයන් :————.

8. පාසැලේ දී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රියාවන් :————.

9. සන්නධ සේවයේ හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ නිත්‍ය භට බලකායේ හෝ බාල දක්ෂ ව්‍යාපාරයන්හි හෝ ඔබ කිනම් සේවයක් කර තිබේ ද :————.

10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද ? :————.

11. ඔබ මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කෙළෙහි ද ? එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක් ද ? :————.

12. ඔබගේ පාසැල් සමය හෝ විශ්ව විද්‍යාල සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :————.

| පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය | ඇතුලු වූ දිනය | අස් වූ දිනය | සමර්ථ වූ ප්‍රසිද්ධ පරීක්ෂණ |
|---|---|---|---|
| | | | |

13. පාසැලින් හෝ විශ්ව විද්‍යාලයෙන් අස් වූ දින සිට ඔබ නියුක්තව සිටි රැකියාවන් පිළිබඳව පහත සඳහන් විස්තර දක්වන්න :————.

| ස්වාමි පක්ෂය | රැකියාවේ ස්වභාවය | සේවය කළ කාලය—දින සිට දින දක්වා |
|---|---|---|
| | | |

14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :————.

මෙම අයදුම් පතෙහි ම විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### පුරප්පාඩු

පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යක්ෂ, මුදල්**

**සුදුසුකම්.**—(අ) සුදුසුකම් ලැබීමෙන් පසුව අවුරුදු 3 කට නොඅඩු පළපුරුද්දක් ඇති චාර්ටර්ඩ් ගණකාධිකාරිවරයකු, හෝ

(ආ) විධායක තත්ත්වයේ අවුරුදු 10 කට නොඅඩු සේවාවක් ඇති චාර්ටර්ඩ් ගණකාධිකරණය පිළිබඳ මධ්‍ය පරීක්ෂණය සමත් ගණකාධිකාරිවරයකු, හෝ

(ඇ) විධායක තත්ත්වයේ අවුරුදු 10 කට නොඅඩු සේවාවක් සහිතව අවුරුදු 15 කට නොඅඩු සේවාවක් ඇති රජයේ/සංස්ථා සේවාවේ ගණකාධිකාරිවරයකු හෝ විය යුතුය.

**වයස.**—අවුරුදු 35–50 දක්වා.

**වැටුප් ක්‍රමය.**—සියළු දීමනා සහිතව රු. 1,250—1,750 (50 × 10) රු. 1,350ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

**මුදල් කළමනාකරු**

**සුදුසුකම්.**—(අ) චාර්ටර්ඩ් ගණකාධිකාරිවරයකු, හෝ

(ආ) සුදුසුකම් ලැබීමෙන් පසුව අවුරුදු 3 ක පළපුරුද්දක් ඇති පිරිවැය හා වැඩ පිළිබඳ ගණකාධිකාරිවරයකු, හෝ

(ඇ) සුදුසුකම් ලැබීමෙන් පසුව අවුරුදු 5 ක පළපුරුද්දක් ඇතිව, චාර්ටර්ඩ් ගණකාධිකරණය පිළිබඳ මධ්‍ය පරීක්ෂණය, හෝ

(ඈ) විධායක තත්ත්වයේ අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් සහිතව ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමාව, හෝ

(ඉ) විධායක තත්ත්වයේ යටත් පිරිසෙයින් අවුරුදු 8 ක සේවාවක් සහිතව රජයේ සේවයේ හා/හෝ සංස්ථාවක අවුරුදු 25 ක සේවාවක්.

**වයස.**—අවුරුදු 30–45 දක්වා.

**වැටුප් ක්‍රමය.**—රු. 720—1,200 (40 × 7—50 × 4) රු. 920 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

**පුස්තකාලයාධිපති**

**සුදුසුකම්.**—(අ) දෙකකට නොවැඩි වාර ගණනකදී ලබාගත් විෂයයන් හයක් සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය, හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට වඩා උසස් විභාගයක්, සහ

(ආ) පුස්තකාල කටයුතු පිළිබඳ 5ස් වසක පළපුරුද්ද,

(ඇ) අඩු වශයෙන් පිළිගත් එක් වර්ග කිරීමේ ක්‍රමයක් පිළිබඳවවත් නිපුණත්වයක් තිබිය යුතුය.

(ඈ) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනුමක් අවශ්‍යයි.

**වයස.**—අවුරුදු 25–35 දක්වා.

**වැටුප් ක්‍රමය.**—මාසිකව රු. 400—625 (20 × 5—25 × 5) රු. 500 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

**තැටි ගබඩා භාරකරු**

**සුදුසුකම්.**—(අ) පිළිගත් ආයතනයක පුස්තකාල වැඩ පිළිබඳව යටත් පිරිසෙයින් අට (8) වසකට නොඅඩු පළපුරුද්දක් සහිතව එකවර විෂයයන් 6 ක් සහිතව සමත්වූ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයක්.

**වයස.**—අවුරුදු 30–45 දක්වා.

**වැටුප් ක්‍රමය.**—මාසිකව රු. 400—625 (20 × 5—25 × 5) රු. 500 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

**I, II හා III ශ්‍රේණිවල ක්‍රියාකාරී සහකාරවරු**

**සුදුසුකම්.**—(අ) භාෂාවකින් ලද සම්මාන සාමර්ථ්‍ය සහිතව, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයක්, සහ

(ආ) (i) පිළිගත් ආයතනයක සංගීතය පිළිබඳ උපාධියක් හෝ ඩිප්ලෝමාවක්, හෝ

(ii) නාට්‍ය නිෂ්පාදනයෙහි ලා නිෂ්පාදකයකු වශයෙන් හෝ නළුවකු වශයෙන් හෝ පළපුරුද්ද හා උද්යෝගය.

(iii) ප්‍රවෘත්ති පත්‍ර කලා වේදියකු වශයෙන් 5 වසක පළපුරුද්ද.

**වයස.**—I ශ්‍රේණිය—අවුරුදු 30 කට නොඅඩු විය යුතුයි.

II ශ්‍රේණිය—අවුරුදු 25 කට නොඅඩු විය යුතුයි.

III ශ්‍රේණිය—අවුරුදු 18 කට නොඅඩු විය යුතුයි.

**වැටුප් ක්‍රමය.**—I ශ්‍රේණිය—රු. 400—625 (20 × 5—25 × 5) රු. 500 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

II ශ්‍රේණිය—රු. 300—520 (15 × 8—20 × 5) රු. 345 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

III ශ්‍රේණිය—රු. 250—400 (10 × 15) රු. 300 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

**සංස්කාරක හා සම්බන්ධතා නිලධාරි (ඉංග්‍රීසි)**

**සුදුසුකම්.**—(අ) සේවාවට අදාළ භාෂාවෙන් ලද සම තත්ත්වයේ සාමාර්ථ්‍ය සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ආයතනයක යෝග්‍ය මධ්‍ය පරීක්ෂණ විභාහය හෝ ඊට සමාන උසස් විභාහයක් හෝ සේවාවට අදාළ භාෂාවෙන් ලද සම තත්ත්වයේ සාමාර්ථයක් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයක් හා පිළිගත් ගුවන් විදුලි ආයතනයක සහන නිවේදකයෙකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 3 ක පළපුරුද්ද, හෝ ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ පූර්ණකාලීන නිවේදකයකු හෝ නිබන්ධ සම්පාදකයකු වශයෙන් වූ සේවාව, හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයකින් සමත්වූ රාජකාරිවලට වැඩ සටහන් ඉදිරිපත් කිරීම ඇතුළුව ඇති කොන්ත්‍රාත් නිලධාරියෙකු වශයෙන් 3 අවුරුද්දක අඛන්ඩ සේවාවක්, සහ

(ආ) සේවයට අදාළ භාෂාව පිළිබඳ විපුල දැනුමක්.

(ඇ) මනා සාහිත්‍යමය හෝ සංස්කෘතික පසුබිමක්. නිර්මාණ ශක්තිය, තත්කාලීන සිදුවීම් පිළිබඳ දැනුමක්.

(ඈ) මයික්‍රෝපෝනයට සුදුසු කටහඬක් හා ස්වියත්වයක්, සහ පිළිගත හැකි උච්චාරණ ශෛලියක්—සියළු අතින්ම හොඳ විය යුතුය.

**වයස.**—අවුරුදු 25–45 දක්වා.

**වැටුප් ක්‍රමය.**—රු. 450—675 (20 × 5—25 × 5) රු. 510 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම් පත් 1969 සැප්තැම්බර් මස 15 වැනි දිනට පෙර ලැබෙන සේ ලියා පදිංචි කළ තැපෑලෙන් කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර ගැලපෙන පරිදි '' අධ්‍යක්ෂ මුදල්/මුදල් කළමනාකරු/පුස්තකාලයාධිපති/තැටි ගබඩාකරු/I, II හා III ශ්‍රේණිවල ක්‍රියාකාරී සහකාරවරු/සංස්කාරක හා සම්බන්ධතා නිලධාරි (ඉංග්‍රීසි) '' යන්න පැහැදිලිව ලිවිය යුතුයි.

නෙවිල් ජයවීර,
අධ්‍යක්ෂ ජනරාල්.

1969 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ 7.

### නිදර්ශන අයදුම්පත

………………තනතුර සඳහා වූ අයැදුම්පතයි

1. සම්පූර්ණ නම :————.
   (1) මුල් අකුරු සහිත නම :————.
   (මහත්මයාද, මහත්මියද, මෙනෙවියද යනාවග සඳහන් කරන්න)
   (2) ලිපිනය :————.
2. උපන් දිනය හා ස්ථානය :————.
   (1) 1969 සැප්තැම්බර් මස 15 දිනට වයස : අවු:— මාස :— දින :——
   (උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුයි)
3. ජාතිය :————.
4. අධ්‍යාපන හා පුහුණුවීම් :————.

| ඉගෙනීම ලැබූ පාසැල් හා ආයතන | දින …………සිට ………දක්වා | සමත්වී ඇති විභාග | දැරූ වගකිවයුතු තත්ත්ව හා යෙදුණු වැදගත් පරිබාහිර කටයුතු |
|---|---|---|---|
| ———— | ———— | ———— | ———— |

5. සමත්වී ඇති උසස්ම විභාගය :—
   (1) සිංහල :————.
   (2) දෙමළ :————.
   (3) ඉංග්‍රීසි :————.
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)
6. පළපුරුද්ද :————.
   (ඔබගේ අතීත පළපුරුදුකම් හා රැකියා පිළිබඳ වාර්තා කාල ක්‍රමානුගතව යොදන්න.)

| ආයතනයේ නම | උසුලන ලද තනතුර | දින ……………සිට …………දක්වා | අස්වීමට හේතුව |
|---|---|---|---|
| ———— | ———— | ———— | ———— |

7. ඔබගේ පෞද්ගලික ජීවිතය ගැන හොඳින් දන්නා නෑයන් නොවන තිදෙනෙකුගේ නම්, ලිපින හා තත්ත්ව :—
   (1)
   (2)
   (3)
8. චරිත සහතික ලබාගෙන ඇති අයගේ නම් සහ තනතුරු :—
   (1)
   (2)
   (3)
9. වෙනත් විස්තර :————.
10. මෙම අයදුම්පතෙහි මවිසින් ඇතුළත් කොට ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම සහතික කරමි. තෝරා ගැනීමේදී හෝ තෝරා ගැනීමට පෙර මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හා වැරදි ඒවා බව හෙළිවුවහොත්, මා යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සකු වන බවත් පත්වීම ලද පසු වරදක් හෙළිවුවහොත් කිසිම වන්දියක් නැතිව සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–153—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජකීය විද්‍යාලයේ ශිෂ්‍යත්ව සඳහා පරීක්ෂණය—1969

ලෝරන්ස්, රූපසිංහ, සිසිල් පෙරේරා සහ හර්ෂ පණ්ඩිත ගුණවර්ධන යන අනුස්මරණ ශිෂ්‍යත්ව හතරක් ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගයට 1.1.70 ට වයස අවුරුදු 18 නොඉක්මවූ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අඩු වශයෙන් විෂයයන් 5 කින් සම්මාන ලැබූ උසස් පෙළ පංතියේ ඉගෙනීමට සම්පූර්ණ සුදුසුකම් ලත් ශිෂ්‍යයන්ගෙන් සැප්තැම්බර් 30 දිනට පෙර ඉල්ලුම් පත් භාර ගනු ලැබේ.

ශිෂ්‍යත්ව ජයග්‍රාහකයන් 1970 ජනවාරි මාසයේදී අ.පො.ස. (උසස් පෙළ) දෙවන වසර පන්තියට ඇතුළත් විය යුතුය.

වැඩිපුර විස්තර හා ඉල්ලුම් පත්‍ර රෙජිස්ට්‍රාර් මහතාගෙන් ලබා ගන්න.

බෝගොඩ ප්‍රේමරත්න,
විද්‍යාලයාධිපති, රාජකීය විද්‍යාලය.

1969.8.22 වැනි දින.

9–21—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රාජ්‍ය දැව සංස්ථාව

### මාතර හා අනුරාධපුර ප්‍රදේශවල කැලෑවලින් දැව සැපයීමට හා කොළඹ ප්‍රදේශයේ දැව ගබඩා අතර දැව ප්‍රවාහනාදිය සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත දැක්වෙන සේවාවන් සඳහා කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ, රාජ්‍ය දැව සංස්ථාවේ, ක්‍රියාකාරී කළමනාකාර අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

1. **අනුරාධපුර ප්‍රදේශය.**—කන්තලේ රක්ෂිතය අංක I, II, III දරණ කැබලි වලින් කඳන් සැපයීම එක් එක් කොටසින් රු. 50,000 වටිනාකමට.

ටෙන්ඩර් පත් භාරගනු ලබන්නේ කැලෑ දෙපාර්තමේන්තුවේ පළමු වැනි, දෙවැනි පෙළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා පොදු ආකෘති පත්‍ර 170 හි රුපියල් 25,000 වටිනාකමට වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ හැකි අයගෙන්ය.

2. **මාතර ප්‍රදේශය.**—(අ) පුංචි අප්පු ජන්දුර වැව ප්‍රදේශය.—කඳන් සැපයීම රු. 40,000 වටිනාකමට හා අනවශ්‍ය දැව මිළට ගැනීමට.

ටෙන්ඩර් පත් භාරගනු ලබන්නේ කැලෑ දෙපාර්තමේන්තුවේ පළමුවැනි, දෙවැනි පෙළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා පොදු ආකෘති පත්‍ර 170 හි රුපියල් 20,000 වටිනාකමට වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ හැකි අයගෙන්ය.

(ආ) පිටකන්ද රජයේ අවශේෂ කැලය.—සිල්පර හා කඳන් සැපයීම රු. 2,50,000 වටිනාකමට.

ටෙන්ඩර් පත් භාරගනු ලබන්නේ කැලෑ දෙපාර්තමේන්තුවේ පළමුවැනි පෙළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා පොදු ආකෘති පත්‍ර 170 හි රුපියල් 1,00,000 වටිනාකමට වත්කම් සහතිකයක් ඉදිරිපත් කළහැකි අයගෙන්ය.

3. **කොළඹ ප්‍රදේශය.**—කොළඹ ප්‍රදේශයේ පිහිටා ඇති ගබඩාවන්හි සිට දැව ප්‍රවාහණය කිරීම පැටවීම හා බෑම සඳහා රු. 1,50,000 වටිනාකමට.

ටෙන්ඩර් පත් භාරගනු ලබන්නේ කැලෑ දෙපාර්තමේන්තුවේ පළමුවැනි පෙළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා පොදු ආකෘති පත්‍ර 170 හි රුපියල් 50,000 වටිනාකමට වත්කම් සහතිකයක් ඉදිරිපත් කළහැකි අයගෙන්ය.

4. 1969.9.19 වැනි දින අ.භා. 2.00 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

5. 1969.9.20 වැනි දින පූ.භා. 11.00 ට ටෙන්ඩර් ආකෘති පත්‍ර භාර ගැනීම අවසන් කරනු ඇත.

වැඩි විස්තර රාජ්‍ය දැව සංස්ථාවේ ඒ ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය කළමනාකාර වරුන්ගෙන් හෝ කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරන ස්ථානයේ ක්‍රියාකාරී කළමනාකරුගෙන් හෝ ලබාගත හැකිය.

එෆ්. එල්. එම්. පෙරේරා,
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙනුවට.

1969 සැප්තැම්බර් මස 5 දින,
ක්‍රියාකාරී කළමනාකාර අංශය,
265, තිඹිරිගස්යාය පාර, කොළඹ 5.

9–151—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය :—තැ.පෙ. 418, කොළඹ 1). පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | | | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|---|---|
| 1. 1969.10.1 සිට 1970.9.30 තෙක් මෙරට සෑදූ, විශේෂ වර්ගයේ ලියුම් කවර සැපයීම | ... | ... | 1969.9.30 |
| 2. නිල් ලෝම පීක් කැප් සැපයීම | ... | ... | 1969.9.30 |
| 3. සුදු කපු ඇඳරෙදි (බෙඩ් කවර) සැපයීම | | ... | 1969.9.30 |

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969.9.5 දින,
කොළඹදීය.

9–185—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

### කොළඹ වාප්පුවේ සිට ගබඩාවන් වෙත ආහාර ද්‍රව්‍ය තොග කා. තොගයන් ලොරිවලින් ප්‍රවාහණය කිරීම (විශෙෂ කොන්ත්‍රාත්තුව) සඳහා ටෙන්ඩර් කැඳවීම—1969/70

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් 1969.8.15 දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ටෙන්ඩර් කැඳවීමේ නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න
ආහාර කොමසාරිස්.

1969 අගෝස්තු මස 25 දින.
කොළඹ 2,
330, යූනියන් පෙදෙසේ
ආහාර කොමසාරිස් කාර්යාලයේ දීය.

9–111—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

පැයට ගැලුම් 3,000 ධාරිතාවයෙන් යුත් විදුලියෙන් ක්‍රියා කරවන පොම්පයක් සැපයීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 69.9.26 වන දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්කරු විසින් සැපයීම කළයුත්තේ (ඒ) තිබෙන තොගයෙන්, (බී) ආනයනය කරන තොගයෙන්, හෝ (සී) ආනයනය කර කිරුළපනයේ මධ්‍යම ගබඩාවට භාරදීමටත් ය. ටෙන්ඩර්කරුවන් විසින් භාරදිය හැකි ඉතාම නුදුරු කාලසීමාව සඳහන් කළයුතුය.

3. 1969.9.24 වෙනි දින දවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරන ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 25 ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. සියලු ටෙන්ඩර් කවරයන්හි වම් පස ඉහළ කෙළවරේ "විදුලියෙන් ක්‍රියා කරවන වතුර ප්‍රොම්පයක් සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එව්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම්පස පහළ කෙළවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපැලෙන්, පුද්ගලිකව නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනට භාරදිය යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදළ නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකි ය.

7. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස්වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුයි.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුළත් වන්නේය.

9. කොළඹ, එව්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1969.9.26 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමට අයිතිය රජය සතුය.

11. වැඩි විස්තර සඳහ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සීටී/2/364,
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ, 1969.8.29.

9–191—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## 1969-70 මුදල් වර්ෂයේ ප්‍රථම භාගය සඳහා චන්ද්‍රිකාවැව, ව්‍යාපාරයට ප්‍රාදේශීය ද්‍රව්‍ය සැපයීම

චන්ද්‍රිකාවැව, ව්‍යාපාරයට අයත් පහත සඳහන් කාර්යාංශයන් සඳහා ප්‍රාදේශීය බඩු සැපයීම පිණිස චන්ද්‍රිකාවැව, ඉඩම් සංවර්ධන නිලධාරි වන මම විසින් 1969 සැප්තැම්බර් මස 15 වන දින ප. ව. 3 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

**මොණරාගල දිස්ත්‍රික්කය :**

(1) හම්බෙගමුව.
(2) බලහරුව
(3) සෙල්ලකතරගම ගුස්කිපාන පාර
(4) වැල්ලවාය වීරසේකරගම පාර
(5) කුඩාඔය–දියකිරිත්තඔය පාර
(6) තිස්ස–කතරගම
(7) කණමල්මිල
(8) ලී මෝල හඳපාන්ගල

**හම්බන්තොට දිස්ත්‍රික්කය :**

(1) බදගිරිය දීර්ඝ කිරීම සහ පොදු ගොඩනැගිලි අංශයන්.
(2) බෝගහපැලැස්ස.
(3) බදගිරිය මාර්ග තැනීමේ අංශය
(4) රන්මල්කන්ද අංශය
(5) මුරුතවෙල ව්‍යාපාරය

**රත්නපුර දිස්ත්‍රික්කය :**

(1) චන්ද්‍රිකාවැව පොදු ගොඩනැගිලි අංශය
(2) උග්ගල්කල්තොට අංශය

ප්‍රාදේශීය ද්‍රව්‍ය :

(1) ද්විත්ව පොල්අතු (දිගින් අඩි 7 ක් සහ පළලින් අඟල් 12ක් වියයුතුය)
(2) අළුහුනු සහ තම්බාපු හුණු (බුසලක් රාත්තල් 44ට වඩා අඩු නොවිය යුතුය.
(3) කළුගල් "$6 \times 9$" කියුබ් වලින්.
(4) කළුගල් කැබලි කියුබ් වලින් (අඟල් 2, $1\frac{1}{2}$, 1, $\frac{3}{4}$, $\frac{1}{2}$.)
(5) පුලුස්සාපු ගඩොල් ($8\frac{3}{4} \times 4\frac{1}{4} \times 2\frac{3}{4}$) යන ප්‍රමාණයෙන් 1,000හ බැගින්
(6) ගංගාවැලි කියුබ් වලින්
(7) බොරළු කියුබ් වලින්

**සැපයීම් පිළිබඳ මිළගණන් පහත දක්වෙන අයුරු වෙන් වෙන් වශයෙන් සඳහන්කළ යුතුය:—**

(අ) ගල්වලේ හෝ වත්තේ සිට සැපයීමට (ගල්වළ ලොරි යාහැකි ස්ථානයක් විය යුතුයි), කාර්යස්ථානයේ සිට සැතපුම් පහකට වඩා දුර නොවිය යුතුයි.)

(ආ) වැඩපලට ගෙනැත් දීමට. (ඉ) පෝරණු වේ සිට සැපයීමට.

මුදලින් රු. 50 ක් ඒ ඒ දිස්ත්‍රික්කයන් සඳහා මාගේ කාර්යාලයේ හෝ ලඟම ඇති දිසාපති කාර්යාලයක තැන්පත් කොට ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් අනුමත කරනලද ටෙන්ඩර් පෝර්ම මාගෙන් ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ 1969 සැප්තැම්බර් මස 15 වන දින පෙ. ව. 10.30 දක්වා පමණි.

මාගේ කාර්යාලයෙන් සපයනු ලබන නියමිත ටෙන්ඩර් පෝර්මවල ඉල්ලුම්කළ යුතු අතර, ඒවා ලියුම්කවරයක බහා සීල්තබා මාගේ කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ "ඉඩම් සංවර්ධන නිලධාරි, චන්ද්‍රිකාවැව, පදලංගල." යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ එවිය යුතුය. ටෙන්ඩර් බහා එවනු ලබන ලියුම්කවරයේ වම්පස උඩ කෙළවරේ "ගොඩනැගිලි බඩු සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතු සියළුම ටෙන්ඩර්පත් 1969 සැප්තැම්බර් මස 15 වන දින ප. ව. 3ට ප්‍රථම පදලංගල, චන්ද්‍රිකාවැව, ඉඩම් සංවර්ධන නිලධාරි වෙත ලැබෙන්ට සැලැස්විය යුතුය. ටෙන්ඩර් විවෘත කිරීම 1969 සැප්තැම්බර් මස 15 වන දින ප.ව. 3.30ට චන්ද්‍රිකාවැව, ඉඩම් සංවරධන කාර්යාලයේදී සිදුකරනු ලැබේ. එම අවස්ථාවේද ටෙන්ඩර්කරුවන්ටද පැමිණිය හැක.

සාර්ථක ටෙන්ඩර්කරුට ඒ බව දන්වා සතියක් ඇතුලත චන්ද්‍රිකාවැව, ඉඩම් සංවර්ධන නිලධාරි සමග ගිවිසුමකට අත්සන්කළ යුතුය. නියමිත කාලසීමාව ඇතුලත ගිවිසුම අත්සන් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රජයසතු කරන අතරම ගිවිසුම් කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ නම් ලැයිස්තුවකට නම ඇතුලත්කිරීමට ක්‍රියාකරනු ඇත. වැඩි විස්තර අවශ්‍යනම් කාර්යාලවේලාව තුලදී චන්ද්‍රිකාවැව, ඉඩම් සංවර්ධන නිලධාරීගෙන් ලබාගත හැක.

ටී. කනගලිංගම්,
ඉඩම් සංවර්ධන නිලධාරි, චන්ද්‍රිකාවැව.

1969 අගෝස්තු මස 22 වන දින,
පදලංගල, චන්ද්‍රිකාවැව,
ඉඩම් සංවර්ධන කාර්යාලයේදීය.

9–190—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් මහගල්වැව ව්‍යාපාරයේ ගොඩනැගිලි ඉදිකිරීම**

අංක 14,860 හා 69.7.27 දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පලවූ ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කිරීමේ දිනය හා ටෙන්ඩර් භාරගැනීමේ දිනයත් පහත සඳහන් අයුරින් දීර්ඝ කර ඇත.

(අ) ටෙන්ඩර් ලියකියවිලි 1969 සැප්තැම්බර් මස 24 දින දවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ ;

(ආ) ටෙන්ඩර් පත් 1969 සැප්තැම්බර් මස 25 දින පෙරවරු 11.30 වන තෙක් භාරගනු ලබන අතර එදිනම පස්වරු 3 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

වී. කනගලිංගම්,
ඉඩම් සංවර්ධන නිලධාරි,
චන්ද්‍රිකා වැව.

ඉඩම් සංවර්ධන කාර්යාලය,
චන්ද්‍රිකාවැව, පදලංගල,
1969 අගෝස්තු මස 25 වැනි දින දී ය.

9–129—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මහියංගන, ඉඩම් සංවර්ධන නිලධාරි කොට්ඨාශය

**1969–70 මුදල් වර්ෂයේ ප්‍රථම භාගය තුලදී මහියංගන ඉඩම් සංවර්ධන නිළධාරි යටතේ පාලනය වන ව්‍යාපාරයන් සඳහා ගොඩනැගිලි තැනීමට අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍යය සැපයීම**

**නුවරඑළිය, ශාන්තිපුර, කුඩාඔය, නුවර දිස්ත්‍රික්කයේ මිණිපේ ව්‍යාපාරයේ I වැනි සහ II පියවර**

අම්පාර, දිස්ත්‍රික්කයේ හිමිදුරාවැව, කොන්ඩවට්ටවන් සහ උහන, බදුල්ල, දිස්ත්‍රික්කයේ බදුලුඔය, දඹරාව දෙවන පියවර, ඇල්හේනවැව, නාගදීප, කන්දේගන්විල, වැවතැන්න සහ බටඅතුහේන, මඩකලපු දිස්ත්‍රික්කයේ, කිතුල්වැව සහ වැලිගහකන්ඩිය, මාතලේ දිස්ත්‍රික්කයේ මිණිපේ ඇල දික් කිරීමේ ව්‍යාපාරයේ සිව්වන පියවර සහ මොණරාගල දිස්ත්‍රික්කයේ, ඇති මොලවැව, හෙනන්නෙගලකන්ඩිය සහ කොටියාගලත් පිහිටි මෙම දෙපාර්ත මේන්තුවට අයත් සියලුම ව්‍යාපාරයන්ට පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍යය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 සැප්තැම්බර් මස 28 දින දවල් 12 දක්වා මහියංගන ඉඩම් සංවර්ධන නිළධාරි විසින් භාරගනු ලැබේ.

(1) ඉරු දෙක බැගින් යුතු පොල්අතු (එකක් දිගින් අඩි 7ටත් පළලින් අඟල් 12 ටත් නොඅඩු ඒවා විය යුතුයි) දහස් ගණනින් සැපයීම සඳහා දහසක් කීය බැගින් ද ?

(2) අළුහුණු (බුසලක බර රාත්තල් 44ට නොඅඩු විය යුතුයි) බුසල් ගණනින් සැපයීම සඳහා බුසලක් කීය බැගින් ද ?

(3) තම්බාපු හුණු බුසල් ගණනින් සැපයීම සඳහා බුසලක් කීය බැගින් ද ?

(4) 6″ × 9″ කලුගල් කියුබ් ගණනින් සැපයීම සඳහා කියුබ් එකක් කීය බැගින් ද ?

(5) කලුගල් 4″ × 6″ කියුබ් ගණනින් සැපයීම සඳහා කියුබ් එකක් කීය බැගින් ද ?

(6) අඟල් $\frac{1}{2}$ සිට අඟල් 2 දක්වා වූ ප්‍රමාණවල කැටගල් එක් එක් වර්ගය කියුබ් ගණනින් සැපයීම සඳහා කියුබ් එකක් කීය බැගින් ද ?

(7) පිළිස්සූ ගඩොල් (එකක ප්‍රමාණය $8\frac{3}{4} \times 4\frac{1}{2} \times 2\frac{3}{4}$ බැගින් විය යුතුයි) දහස් ගණනින් සැපයීම සඳහා දහසක් කීය බැගින් ද ? (ගඩොල් පෝරණුය ව්‍යාපාරයේ සිට සැතපුම් පහක් ඇතුළත විය යුතුයි)

(8) ගංගා වැලි කියුබ් ගණනින් සැපයීම සඳහා කියුබ් එකක් කීය බැගින් ද?

2. ඉහත සඳහන් එක් එක් ද්‍රව්‍යය ඒවා නිපැයෙන ස්ථානයෙහිම සැපයීම සඳහාද, ඉහත සඳහන් ව්‍යාපාරයන්හි පිහිටි වැඩපොලවල් වෙත ගෙන ගොස් සැපයීම සඳහා ද, වෙන වෙනම මිළ ගණන් සඳහන් කළ යුතුයි.

3. මහියංගන ඉඩම් සංවර්ධන නිළධාරිගේ කාර්යාලයේ හෝ ඕනෑම දිසාපති කාර්යාලයක එක් එක් ව්‍යාපාරය වෙනුවෙන් රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කොට ඒ බව දැක්වෙන කුවිතාන්සියක් මා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 1969 සැප්තැම්බර් මස 28 දින පෙරවරු 11 හ දක්වා මහියංගන, ඉඩම් සංවර්ධන නිළධාරි විසින් නියමිත ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් බව දන්වා සතියක් ඇතුළත සිට එකී ගොඩනැගිලි ද්‍රව්‍යය සැපයීමට අපොහොසත් වුවහොත්, ඔහුගේ ටෙන්ඩරයේ තැන්පත් මුදල රජය සතුකොට ඔහුගේ නම කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත්කරුවන්ගේ නම් ලැයිස්තුවේ අඩංගු කරනු ලැබේ.

5. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය නම් ටෙන්ඩර් විවෘත කරන දිනය වන 1969 සැප්තැම්බර් මස 28 දින පස්වරු 3ට මෙම කාර්යාලයේ පෙනී සිටිය හැක.

6. ටෙන්ඩර් ගණනාවක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය හෝ ටෙන්ඩරයක කොටසක් භාර ගැනීමේ අයිතිය හෝ විශේෂ විස්තරයකට අනුකූල නොවූ සැපයීම් ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය ඉඩම් සංවර්ධන නිළධාරි සතුය.

එස්. ඩබ්ලිව්. ධර්මසිරි,
මහියංගන, ඉඩම් සංවර්ධන නිළධාරී.

මහියංගන, ඉඩම් සංවර්ධන කාර්යාලය,
1969 අගෝස්තු 15 දින.

9–28—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**1969–70 මුදල් වර්ෂයේ 1 වන භාගය තුල, පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරි යටතේ ඇති ව්‍යාපාරයන් සඳහා ගොඩනැගිලි ඉදි කිරීමේ ද්‍රව්‍ය සැපැයීම සඳහා මිළ ගණන් කැඳවීම**

පොළොන්නරුව, මඩකලපුව සහ මාතලේ දිස්ත්‍රිකයන් තුල පිහිටි පහත සඳහන් කාර්යාංශවලට පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍යයන් සැපැයීම සඳහා 1969.9.20 වැනි දින පෙරවරු 10 දක්වා පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරී විසින් මිළ ගණන් භාරගනු ලැබේ :—

පොළොන්නරුව දිස්ත්‍රික්කය : මාදුරුඔය, අරලගන්විල, රදවිගෙඔය, ගිරිතලේ, බකමූණ, කවුඩුලුවැව, කොඳුරුවාව, මින්නේරිය, හිඟුරක්ගොඩ, පො. ගො. අංශය පොලොන්නැව මනම්පිටිය, ගලුඅමුණ, බැඳවැව, බී. ඕ. පී. 649, ඇල්ලෙවැව, පටුණුගම.

මඩකළපුව දිස්ත්‍රික්කය : කිතුල්වැව, වඩමුනේ.

මාතලේ දිස්ත්‍රික්කය : හත්තොට අමුණ, බෙල්ලන්ඔය, වැවලවැව.

(I) 6″ × 9″ කළුගල් (කියුබ් ගණනින්)—ගල්වළ, ව්‍යාපාරයේ සිට සැ.10 ඇතුලත වියයුතු.

(II) 2″ කැටගල් (කියුබ් ගණනින්)—ගල්වළ ව්‍යාපාරයේ සිට සැ.10 ඇතුලත වියයුතු

(III) $1\frac{1}{2}$″ කැටගල් (කියුබ් ගණනින්)—ගල්වළ ව්‍යාපාරයේ සිට සැ.10 ඇතුලත වියයුතු

(IV) 1″ කැටගල් (කියුබ් ගණනින්)—ගල්වළ ව්‍යාපාරයේ සිට සැ.10 ඇතුලත වියයුතුය

(V) $\frac{3}{4}$″ කැටගල් (කියුබ් ගණනින්)—ගල්වළ ව්‍යාපාරයේ සිට සැ.10 ඇතුලත වියයුතු

(VI) ගංවැලි (කියුබ් ගණනින්)—සපයන ස්ථානය ව්‍යාපාරයේ සිට සැ. 10 ඇතුලත වියයුතුයි.

(VII) පිලිස්සූ ගඩොල් (1,000 බැගින්)—(පිළිගත් ප්‍රමාණය $8\frac{1}{4}$″ × $4\frac{1}{2}$″ × $2\frac{3}{4}$″) පෝරණුව ව්‍යාපාරයේ සිට සැ.10 ඇතුලත විය යුතුය.

(VIII) වියාපු පොල්අතු (1,000 බැගින්)

(IX) අළුහුණු (බුසල් ගණනින්)—ගෝනි සමඟ

(X) තම්බාපු හුණු (බුසල් ගණනින්)—ගෝනි සමඟ

2. සැපැයීම පිළිබඳ මිළ ගණන් වෙන් වෙන් වශයෙන් දැක්විය යුතුයි:
(අ) පෝරණුවේදී/ගල්වලේදී (ලොරි යා හැකි ස්ථාන වියයුතුයි.)
(ආ) කාර්යාංශයට ගෙනවිත් භාරදීම.

3. ඒ ඒ ව්‍යාපාරයට වෙන වෙනම රුපියල් 50 බැගින් මෙම කාර්යාලයේ හෝ ඕනෑම දිසාපති කාර්යාලයක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් අනුමත ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට පෙර ඉදිරිපත් කළ යුතුයි. 1969.9.19 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

4. මෙම කාර්යාලයෙන් සපයනු ලබන නියමිත ටෙන්ඩර් පෝරම වල ඉල්ලුම් කළ යුතු අතර, ඒවා ලිපි කවරයක බහා සීල් තබා 1969.9.20වෙනි දින පෙරවරු 10ට පෙර මෙම කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ඉඩම් සංවර්ධන නිලධාරි, පොළොන්නරුව යන ලිපිනයට ලියා පදිංචි කළ තැපැලෙන් හෝ එවීම කළ හැකිය. ටෙන්ඩර් බහා එවන කවරයෙ වම්පස උඩ කෙළවරේ ''ගොඩනැගිලි ද්‍රව්‍ය සැපැයීම සඳහා ටෙන්ඩර්'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

5. 1969.9.20 වැනි දින පෙරවරු 10.30ට පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරිගේ කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවනට පැමිණ සිටිය හැකිය.

6. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඇනවුම් කළ විට, ඔහු විසින් සති දෙකක් ඇතුලතදී ද්‍රව්‍ය භාරදිය යුතුය. යමෙකුට එසේ කිරීමට නොහැකි වුව හොත් ඔහුගේ නම කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවතුගේ නාම ලේඛනයට ඇතුලත් වන්නේය.

7. ටෙන්ඩර් ගණනාවක් හෝ සියලු ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය, ටෙන්ඩරයක කොටසක් භාරගැනීමේ අයිතිය හා විශේෂ අනුකූල නොවූ සැපැයීම් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරි සතුය.

8. තවද, වැඩි විස්තර පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරිගෙන් ලබාගත හැකිය.

එෆ්. බී. ආර්. ද සිල්වා,
ඉඩම් සංවර්ධන නිලධාරි, පොළොන්නරුව.

1969 අගෝස්තු මස 16 වෙනි දින.
පොළොන්නරුව ඉ. සං. නි. කාර්යාලයේදීය.

9–41—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාවට ස්වයංධාවන මඩ හාරණ යාත්‍රාවක් සැපයීම

### ටෙන්ඩර් විවෘත කරන දිනය දීර්ඝ කිරීම

කොළඹ වරාය කොමිෂන් සභාවට ස්වයංධාවන මඩහාරණ යාත්‍රාවක් සැපයීම පිළිබඳ 1969.6.13 වෙනි දින අංක 14,858 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 6–376 දරණ නිවේදනය හා ඊට වැඩිමනත් වශයෙන් 1969.8.8 වෙනි දින අංක 14,866 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 8–503 දරණ නිවේදනය සම්බන්ධවයි.

මෙම ටෙන්ඩරය විවෘත කරන දිනය හා වේලාව 69.10.28 දින පෙ.ව. 9.30 වන තෙක් හා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරන දිනය 69.10.26 වෙනි දින පෙ.ව. 12 වන තෙක් දීර්ඝ කළ බව මෙයින් දනුම් දෙමි.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1969.8.29 දින,
කොළඹ වරාය කොමිෂන් සභා කාර්‍යාලයේදී ය.

9–142—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—බදුල්ල උප කොටස

බදුල්ල උප කොට්ඨාශයේ බඩු ප්‍රවාහණය 1969–70 මුදල් වර්ෂය සඳහා ටෙන්ඩර් පත් 1969 සැප්තැම්බර් මස 17 වෙනි බදාදා පෙරවරු 10 දක්වා බණ්ඩාරවෙල ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් පහලොස් දහසකට (රු. 15,000) වැඩි ගණනකට පුහුණු වැඩ සඳහා ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිති වලට සහ ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

1969 සැප්තැම්බර් මස 15 වෙනි සඳුදා දහවල් 12 වන තෙක් බදුල්ල, මහියංගණය, මොණරාගල යන වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වලින් ලබා ගතහැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

මේ ටෙන්ඩරය ගැන සියලුම විස්තර, ගිවිසුම, විශේෂ විස්තර යනාදිය කාර්යාල වේලාවන් තුලදී බදුල්ල උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

වී. නාගෙන්ද්‍රන්,
වාරිමාර්ග ඉංජිනේරු, බදුල්ල උප කොටස.

1969 අගෝස්තු මස 24 වැනි දින.
වාරිමාර්ග කාර්‍යාලය, බදුල්ල.

9–71—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—අම්පාර උප කොටස

පහත දක්වෙන වැඩ කිරීම සඳහා ඉදිරිපත්කරනු ලබන ටෙන්ඩර් අයදුම්පත් 1969 සැප්තැම්බර් මස විසිවෙනි සෙනසුරාද පෙරවරු 10 දක්වා මඩකළපුව නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලය විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එම වැඩ ඉදිරියේ දක්වා ඇති අයුරු හෝ ඊට වැඩි ගණන්වලට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා අයදුම් පත් ඉදිරිපත් කළහැක.

| ටෙන්ඩර් අංකය | වැඩයේ නම | | ලියාපදිංචි වූ ගණන රු. | | තැන්පත් මුදල රු. |
|---|---|---|---|---|---|
| ඒ/39/68–69 | අම්පාර උප කොටසේ ගංභා ප්‍රදේශයේ ඌසියර්කට්ටු අමුණ ඉදිකිරීම | ... | 60,000 | ... | 100 |

1969 සැප්තැම්බර් මස 15 වෙනි සඳුද සවස 4 දක්වා අම්පාර කල්මුණ හා වෙන්කල්අඩි උප කොට්ඨාශයන්හි වාරිමාර්ග ඉංජිනේරු වරුන්ගේ කාර්‍යාලයන්ගෙන් කාර්‍යාල වේලාවන් තුලදී ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කොට එවිය යුතුය. ටෙන්ඩර් ආකෘතිපත් සඳහා ඉල්ලුම් කිරීමේදී, ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචිවීමේ පොත් සහ දනට ඔවුන් කරන දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම පිළිබඳව ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ තිබේද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කිරීමට පෙර, වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්‍යාලයේ ඉහත සඳහන් ප්‍රකාර ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළයුතුව ඇති අතර, එසේ නැතහොත් දිසාපති කාර්‍යාලයක එවැනි තැන්පත් කිරීමක් කල බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. මෙම ටෙන්ඩර් පිළිබඳව වැඩි විස්තර අම්පාර උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්‍යාලයෙන් කාර්‍යාල වේලාවන් තුලදී ලබා ගත හැක.

එන්. ජී. තාමෝදරම්,
ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන,
නැගෙනහිර කොට්ඨාශය.

1969 අගෝස්තු මස 21 වෙනි දින,
ප්‍රාදේශීය වාරිමාර්ග කාර්‍යාලයේ දී ය.
මඩකලපුව.

9—85—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කල්මුනේ උප කොට්ඨාශය

අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුනේ උප කොට්ඨාශයේ වාරිමාර්ග බඩු ගබඩාවට ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් පත් 1969 සැප්තැම්බර් මස 27 වන සෙනසුරාද පෙරවරු 10 ය දක්වා මඩකලපුව නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් බාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එදිනම පෙරවරු 10.05 ට එම ස්ථානයේදීම සිදු කරනු ලැබේ.

2. මෙම වැඩය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 10,000 කට හෝ ඊට වැඩි ගනන් වලට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකිය. 1969 සැප්තැම්බර් මස 23 වන අඟහරුවාද දින දවල් 12 දක්වා කාර්‍යාල වේලාවන් තුළ දී කල්මුනේ, අම්පාර සහ වෙන්කලඩි යන වාරිමාර්ග කාර්‍යාල වලින් ලබාගත හැකි පෝර්ම වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දනට ඔවුන් කරණ වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතු ද නැද්ද යන්න සලකා බැලීමට වාරිමාර්ග තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් කල්මුනේ, අම්පාර සහ වෙන්කලඩි යන වාරිමාර්ග කාර්‍යාලවල හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. වැඩිදුර විස්තර කාර්‍යාල වේලාවන් තුළ දී කල්මුනේ උප කොට්ඨාශ නිළධාරි තැන ගෙන් ලබාගත හැකිය.

සී. ෂන්මුගරාජා,
උප කොට්ඨාශ නිළධාරි තැන,
කල්මුනේ උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්‍යාලය,
කල්මුනේ.
1969.8.25 දින.

9–101—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කවුඩුල්ල උප කොටස—ඊශාන කොට්ඨාශය

### ටෙන්ඩර් අංක කේටී/12

ඊශාන කොට්ඨාශයේ කවුඩුල්ල උප කොටස යටතේ මින්නේරිය කන්තලේ යෝධ ඇලේ 3 වැනි සැතපුමේ අඩි 2,800 ස්ථානයේ අඩි 300ක් දිග පැන්නුම සහිත දිය මංකඩක් ඉදි කිරීම පිණිස ටෙන්ඩර් කැඳවනු ලැබේ. 69.9.27 වැනි දින පෙරවරු 10 දක්වා පොළොන්නරුවේ ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. මෙම දෙපාර්තමේන්තුවේ රු. 47,500 කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචිවූ විවිධසේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති සහ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක. අපේක්ෂිත ටෙන්ඩර් කරුවන් තමන්ගේ කොන්ත්‍රාත් සටහන් පොත සහ දනට තමා රජයේ කරගෙන යනු ලබන වැඩවල ප්‍රගතිය සඳහන් සහතිකයක්ද ටෙන්ඩර් පෝර්ම ඉල්ලීමේදී ඉදිරිපත් කල යුතුයි.

3. 69.9.23 වැනි දින ඇතුලත කවුඩුල්ල, මින්නේරිය සහ පොළොන්නරුව උප කොටස් භාර වාරිමාර්ග ඉංජිනේරු වරුන්ගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර් පෝර්ම පිටපත් දෙකකින් යුතුව පිළියෙල කළ යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 50ක් ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී වාරිමාර්ග ඉංජිනේරු වෙත හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුයි.

4. වැඩි විස්තර අවශ්‍ය වුවහොත්, මින්නේරියේ කවුඩුල්ල උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිය.

කේ. කනගරත්නම්,
කවුඩුල්ල උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු.

වාරිමාර්ග කායර්‍යාලය, කවුඩුල්ල උප කොටස,
මින්නේරිය, 1969.8.24.

9–102—69.9.5 දින අංන 14,870 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කුරුණෑගල උප කොට්ඨාශය

කුරුණෑගල උප කොට්ඨාශයේ කලුගල්ල අමුණ ඉදිකිරීම සඳහා ටෙන්ඩර් පත් 1969 සැප්තැම්බර් මස 30 වෙනි අඟහරුවාද පෙ.ව. 10 දක්වා කුරුණෑගල වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 50,000 කට වඩා ප්‍රමාණයකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1969 සැප්තැම්බර් මස 26 වෙනි සිකුරාද (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී කුරුණෑගල/නිකවැරටිය/පුත්තලම උප කොට්ඨාශ භාර වාරිමාර්ග ඉංජිනේරු වරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැකි ආකෘති පත්වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත් සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද ? නැද්ද ? යන්න සළකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩරය ගැන සියළුම විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැළසුම් විශේෂ විස්තර යනාදිය කාර්යාල වේළාවන් තුළදී කුරුණෑගල උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

එල්. හරිදස,
වාරිමාර්ග ඉංජිනේරු,
කුරුණෑගල උප කොට්ඨාශය.

1969 අගෝස්තු මස 24 වෙනි දින,
කුරුණෑගල වාරිමාර්ග කාර්යාලයේ දීය.

9—113—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහකනදරාව උප කොටස

1969–70 මුදල් වර්ෂය සඳහා මහකනදරාව, උප කොටසට බඩු ආදිය ප්‍රවාහනය කිරීම පිණිස උතුරුමැද කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 69.9.27 වැනි දින පෙරවරු, 10 තෙක් ටෙන්ඩර් භාරගෙන එවලේම විවෘත කරනු ලැබේ.

මෙම ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක්කේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 45,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණි.

මෙම ටෙන්ඩර් පෝර්ම මහකනදරාව, අනුරාධපුර, පදවිය හා රාජාංගනය, වාරිමාර්ග කාර්යාලයන්ගෙන් රාජකාරී වේලාවන්හිදී 69.9.22 වෙනි දින දවල් 12 වන තෙක් ලබාගත හැක. ටෙන්ඩර් පෝරම ලබා ගැණීමට ඉදිරිපත් වන අයදුම්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත ඉදිරිපත් කළ යුතු අතර, එදින වන විට දෙපාර්තමේන්තුවේ භාරගෙන තිබෙන වැඩවල වටිනාකම ගැන විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක්කේ රු. 50 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් මෙම කාර්යාලයෙන් හෝ කච්චේරියකින් ලබාගෙන එය ඉදිරිපත් කිරීමෙනි.

ටෙන්ඩර් පෝර්ම නිකුත් කරණු ලබන්නේ මේ වාහන සහ කම්කරුවන් යෙදවිය හැකි බවට ඔප්පු කිරීමට හැකියාවක් ඇති අයට පමණි.

මෙයට අදල අනිකුත් විස්තර ආදිය මහකනදරාව, වාරි මාර්ග කාර්යාලයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් කාර්යාලීය වේලාවන්හිදී දන ගත හැකිය.

ඩී. ඊ. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු.
මහකනදරාව, උප කොටස.

1969.8.24 වෙනි දින,
වාරිමාර්ග කාර්යාලයේදීය.

9–116—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### රත්නපුර දිස්ත්‍රික්කය

### සුළු වාරි කර්මාන්ත

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය | | කර්මාන්තයේ නම |
|---|---|---|
| නවදුන් කෝරළය ... | 1. | හොරන්ගල දෙල අමුණ ව්‍යාපාරය |
| | 2. | ඇලපාත ගඟුල්විටියේ දෙලේ ගල් කැඩීම |
| | 3. | මාරපන පිටවක් දෙනිය පිට වේල්ල තැනීම |
| | 4. | ඇත්ඔය උඩ කුඹුර අමුණ |
| කුරුවිටි කෝරළය ... | 1. | වලව්ට හිරි කුඹුර අමුණ තැනීම |
| | 2. | එල්ලාවල ගල් අමුණට ලැලි සැපයීම |
| | 3. | වැව්ල මහ කුඹුරුයායේ ගංවතුර වැලැක්වීම සඳහා ඉදි කරන පස් කණ්ඩිය |
| කඩවත මැද කෝරළය | 1. | හුණුවල මහ අමුණ ප්‍රතිසංස්කරණය කිරීම |
| | 2. | පල්ලෙකන්ද පේදුරුකන්ද අමුණ ප්‍රතිසංස්කරණය |
| අටකලන් කෝරළය ... | 1. | මානාන උඩහවෙල්යාය පිට වේල්ල තැනීම |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒව ඉදිරිපත් කළ යුත්තේ රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණ යෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩර්යක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 සැප්තැම්බර් මස 13 දින දවල් 12 දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළයුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර් කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින්ද දක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි

වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොද සහතික කළයුතුය.

4. ටෙන්ඩර්පත්‍ර අත්සන් කොට, දින යොද, සීල් තබන ලද ලියුම් කවරවල බහා ,රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ ''රත්නපුර දිස්ත්‍රික්කයේ සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 සැප්තැම්බර් මස 14 දින දවල් 12ට පෙර රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති ''ටෙන්ඩර් පෙට්ටියට'' දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දනුම් දෙනු ඇත. මේ දනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදයක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. ''ලාංකික'' යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් වියයුතුය. ''ගොවිජන සේවා සහකාර කොමසාරිස්'' යනුවෙන් හැඳින් වෙන්නේ දනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 සැප්තැම්බර් මස 15 දින පෙ.ව. 9.30ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළහැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

අමර හේවාමද්දුම,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්.
රත්නපුර දිස්ත්‍රික්කය.

රත්නපුර දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන ගේ කාර්යාලය,
1969 අගෝස්තු මස 24 දින දීය.

9—83—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම

කොල්ලුපිටියේ, තැපැල් කාර්යාල ඉතිරි කිරීමේ බැංකු ගොඩනැගිල්ලේ පිහිටි ආපන ශාලාවේ ඇති විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ, තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1969 සැප්තැම්බර් මස 26 වැනි දින පෙ.ව. 10 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 1969 සැප්තැම්බර් මස 26 වැනි දින, පෙ.ව. 10.15 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ඇත. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

3. කොළඹ 5, නාරාහේන්පිට, සහකාර අධිකාරී (උපකරණ, ගොඩ නැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් නිකුත් කරන ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරන කවුළුවේ රු. 50 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගෙන, එම රිසිට් පත ඉදිරිපත් කළ විට අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. 1969 සැප්තැම්බර් මස 6 වැනිදා සිට 1969 සැප්තැම්බර් මස 24 වැනිදා දක්වා කාර්යාල වේලාවන් තුල ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

5. වැඩි විස්තර, කොළඹ 5, නාරාහේන්පිට සහකාර අධිකාරී (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් ලබාගත හැක.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
කොළඹ 1.

9–109—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

### ටින් ඩොකට් සැපයීම

ටින් ඩොකට් සැපයීම සඳහා කොළඹ, තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1969 සැප්තැම්බර් මස 26 වැනි දින, පෙ.ව. 10 වන තෙක් මෙරට නිෂ්පාදකයන්ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 1969 සැප්තැම්බර් මස 26 වැනි දින, පෙරවරු 10.15 ට ටෙන්ඩර්පත් විවෘත කරනු ඇත. ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටීය හැක.

3. කොළඹ 5, නාරාහේන්පිට, සහකාර අධිකාරී (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් නිකුත් කරන ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

4. ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරන කවුළුවේ රු. 50 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගෙන, එම රිසිට් පත ඉදිරිපත් කළ විට අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. 1969 සැප්තැම්බර් මස 6 වැනිද සිට 1969 සැප්තැම්බර් මස 24 වැනිද දක්වා කාර්යාල වේලාවන් තුළ ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

5. වැඩි විස්තර, කොළඹ 5, නාරාහේන්පිට සහකාර අධිකාරී (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් ලබාගත හැක.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
කොළඹ 1.

9—110—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

යොමු අංකය : සීඩී/13/68.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ රෝහල් මණ්ඩලය

### කොළඹ රෝහල් මණ්ඩලයේ ආයතන වල ඉඳුල්කෑම විකිණීම

1969.10.1 වන දින සිට 1970.9.30 දින දක්වා වූ මුදල් වර්ෂය තුල, මෙහි සඳහන් උපලේඛනයේ දැක්වෙන රෝහල් වල මුළුතැන් ගෙවල බැහැර ලන ඉඳුල් කෑම මිලදී ගෙන යෑම සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත්, ලාංකිකයින්ගෙන් හෝ ලාංකික ආයතන වලින් 1969 සැප්තැම්බර් මස 20 වන දින පෙරවරු 10 වන තුරු, කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමේදී එක් එක් ආයතනය (අංශය) සඳහා වෙන් වෙන් වශයන් මාසික මිළගණන් සඳහන් කළ ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් එවිය යුතු අතර එය බහා ලන කවරයේ වම් කෙළවරේ උඩ “ ඉවත ලන ඉඳුල්කෑම විකිණීම ” යනුවෙන් සඳහන් කළ යුතුය. කවරය තුල බහා සීල් තබන ලද සෑම ටෙන්ඩර් පත්‍රයක්ම මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීමෙන් හෝ මා වෙත ලියා පදිංචි තැපෑලෙන් එවීමෙන් 1969 සැප්තැම්බර් 26 වන දින පෙරවරු 10 ට පෙර මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

3. ඉදිරිපත් කරනු ලබන සෑම ටෙන්ඩර් පත්‍රයක්ම 69.9.26 දින පෙරවරු 10 ට කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරී තැනගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

4. මේ ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති සියලුදෙනාටම පැමිණ සිටිය හැක. පැමිණ සිටින අයගේ දැන ගැනීම සඳහා නම් හා මිල ගණන් කියවනු ලැබේ.

5. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු මෙහි පහත උප ලේඛනයේ දැක්වෙන ආයතනයන් වල ඉඳුල්කෑම දිනපතා, ඉවත ගෙන යන බවට හා එම සේවා වන් හරියාකාරව ඉටු කරන බවට ගිවිසුමකට බැඳිය යුතු අතර ඒ උප ලේඛනයේ දැක්වෙන පරිදි ඇපයක්ද තැබිය යුතුව ඇත. මේ ඇප මුදල කොන්ත්‍රාත්තුව අවසානයේදී කොන්ත්‍රාත්කරුට ආපසු ගෙවනු ලැබේ.

6. මේ ආයතනවල ඉවත ලන ඉඳුල්කෑම සඳහා කරනු ලබන මාසික ගෙවීම් ගාස්තු ඒ මාසයේ 1 වන සේවා දිනයේ දහවල් 12 ට පෙර ගෙවිය යුතුය.

7. මහ රෝහලේ ඉඳුල් ආහාර කොටස් තුනකට බෙදා ඇත.

(i) මුළුතැන්ගෙවල ඉඳුල්කෑම.

(ii) වාට්ටුවලින් ඉවත ලන ඉඳුල්කෑම ආදිය.

(iii) කොළඹ හෙදි විදුහලේ මුළුතැන්ගෙවල ඉඳුල්කෑම යනාදි වශයෙන්.

8. මේ පිළිබඳ වැඩි විස්තර මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

ඒ. නාගේන්ද්‍රන්,
කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරී.

1969.8.24 දින,
කො.රෝ.ම.අ. කාර්යාලයේ
මුදල් අංශයේදී ය.

### උපලේඛනය

| | ආයතනය | ඇප මුදල රු. | ශ. |
|---|---|---|---|
| 1. | කාසල් වීදියේ කාන්තා රෝහල, කොළඹ ... ... | 50 | 0 |
| 2. | ද සොයිසා කාන්තා රෝහල, කොළඹ ... ... | 50 | 0 |
| 3. | ළමා රෝහල, කොළඹ ... ... ... | 50 | 0 |
| 4. | නයනා රෝහල, කොළඹ ... ... | 50 | 0 |
| 5. | රෝගෝපසම නිවාසය, තලගොල්ල ... ... | 25 | 0 |
| 6. | මහරෝහල, කොළඹ— | | |
| | (i) මුළුතැන්ගෙවල ඉඳුල් ආහාර ... ... | 100 | 0 |
| | (ii) වාට්ටු වලින් ඉවත ලන ඉඳුල් ආහාර ආදිය ... | 100 | 0 |
| | (iii) කොළඹ හෙදි විදුහලේ ඉවත ලන ඉඳුල් ආහාර ... | 50 | 0 |

9–73—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පීඑස්සී 2/24/69

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### විකිරණ උපකරණ ආදිය සැපයීම

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් විකිරණ උපකරණ ආදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(i) විදේශීය රටවල නමගිය නිපදවන්නෝ,
(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,
(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,
(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස. සෝ. රු. ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, තැං පෙ. 584 හිමි කොළඹ, රැජින වීදියේ සෙලින්කෝ මන්දිරයේ පස්වෙනි මාලයේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 නොවැම්බර් මස 14 වන දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා, නියෝජිතයින් මගින් ලේඛණ ගත කොට ඇති වෙළඳ සමාගම්වලින්,

(ii) i වැනි ඡේදයේ (iv) වැනි උප ඡේදයේ සඳහන් රාජ්‍යයන්ට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බැල්ජියම, ඩෙන්මාර්ක්, ස්විස්ටර්ලන්තය ආදී රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබාගන්නා ලෙස ඒජන්ට්වරු සහ නියෝජිතයින් විදේශීය සමාගම්වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයින්ට පැමිණීමට ඉඩදෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

එන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) වෙනුවට.

කොළඹ, 1969 අගෝස්තු 24 වන ද.

9–68—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රත්නපුර කොට්ඨාශය

### කිළිටි රෙදි සේදීම—1969–70

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1969.11.1 වෙනි දින සිට 1970.9.30 වනදයින් (දින 2ක් ඇතුලුව) අවසන් වන වර්ෂය තුල මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියේ දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුප්කාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සමාගම්වල හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයේ දවල් 12 වනතුරු මෙම, කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කලුතර, නුවර, කෑගල්ල, මාතර, මාතලේ, පුත්තලම, කුරුණෑගල සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම සැළැකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු ආසනන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවැනි ඡේදයේ දෙවැනි කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවී

හෝ මුදල් තත්ත්වය විදහාපෑමට කැරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කැලි පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමඟ ඇති උපලේඛනයෙහි 4 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා සෞඛ්‍ය සේවා අධිකාරී, රත්නපුර කියා එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි දමන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ලේකම් මහතාට (හෝ මා හට) දීමෙන් එය ලැබුණු බවට ඔහු හෝ මා විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැළැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙණෙන උප ලේඛණයේ 6 වැනි තීරයේ සඳහන් දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් ඉදිරිපත් කරන මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳව සැකයක් ඇති වූවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙළ කර ගැනීම හෝ මවිසින් බලය පවරන ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙහි පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කර්‍රුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත් කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වැනි තීරයේ සඳහන් වන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැළසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදයම් පාලක නිලධාරිතුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපා ගනු ලැබේ.

(ii) කිළිටි රෙදිවල විෂබීජ නැතිකිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම් යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

**(iii) පළාත් පාලන මංඩල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මංඩල තුල ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ ඒ ඒ මංඩල තුල ඇති නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

වෛද්‍ය එස්. ජී. කුලතිලක,
රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
රත්නපුර, 1969.8.24 වැනි දින.

## උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ඇප මුදල රු. | මසකට සේදිය හැකි කැලි ගණන | මසකට සේදිය යුතුවාර ගණන | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 1. ඇඹිලිපිටිය ... | 25 0... | 75 0... | 450... | 4... | 69.9.21 දින පෙ.ව.10 |

9-60—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රත්නපුර කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1969.11.1 සිට 1970.9.30 වැනිදා දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුල මේ සමඟ ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර රත්නපුර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතු ය.

අනුමත කරණ ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුලත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවල ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැකිය. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේදී අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කලුතර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, මහනුවර සහ වවුනියාව, යන පලාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී වරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරණ ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල් වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදීත් ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේදීත් ටෙන්ඩර් අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා උවමනා පෝර්ම ඉහත සඳහන් 2 වන ඡෙදයේ (ii) වැනි කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරී, රත්නපුර '' කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරෙහි ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව හෝ ගණකාධිකාරී/ලේකම් තැනට බාරදෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන්හිදී පෙ.ව. 10 ට ටෙන්ඩර්පත්‍ර භාර ගැනීම අවසන්වූ වහාම මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර්පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරණ ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේදී කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර් පත්‍ර තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝරමයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුලු මුදල අනුව ය. එසේ වුවත් ටෙන්ඩර් පෝරමයේ ''සී'' උපලේඛනයට වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩුගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් නම් ඒවා පාලන මිළ ගණන් අනුව ගෙවීම් කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරණ ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරු විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුවන්ගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළයුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුල ඉඩකඩ සළසා දෙනු ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් ,මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයේ ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර්කරු විසින් සැළකිය යුතුය.

වෛද්‍ය. එස්. ජී. කුලතිලක,
රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරී.

69.8.24 වැනි දින,
රත්නපුර, සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදීය.

## උපලේඛනය

| | ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | සේවකයින්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| | | රුපියල් | රුපියල් | | මාලු | මස් | කරවල | එළවලු | මාලු | මස් | කරවල | එළවලු |
| 1. | ගිලීමලේ ගැමි රෝහල ... | 100... | 600 | 1969 සැප්. 21 ද පෙ.ව. 10 දක්වා | — ... | 250... | 500... | 1,000... | — ... | 450... | 900... | 1,700 |
| 2. | කල්තොට දි. රෝහල ... | 100... | 600 | | — ... | 350... | 700... | 1,400... | — ... | 500... | 950... | 1,900 |
| 3. | මහවලතැන්න ගැ. රෝහල ... | 100... | 600 | | — ... | 300... | 650... | 1,250... | — ... | 250... | 650... | 1,100 |

9–60/2—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**හිඟුරක්ගොඩ, පොළොන්නරුව හා පැල්වෙහෙර යන ගොවිපළවල 1969 යල කන්නයේ ගොයම් කැපීම**

ඉහත සඳහන් මැයින් යුතුව 1969 අගෝස්තු මස 1 වෙනි දින ගැසට් පත්‍රයේ පළවූ දැන්වීම පහත සඳහන් අන්දමට සංශෝධනය කරමි.

| | අංකය | කැපීමට ඇති අක්කර ප්‍රමාණය | කැපීම ආරම්භ කළයුතු දිනය | කැපීම අවසාන කළයුතු දිනය |
|---|---|---|---|---|
| හිඟුරක්ගොඩ ගොවිපළ ... ... ... ... | 1 ... | අක්කර 50 ... | 69. 9.16 ... | 69. 9.30 |
| | 2 ... | අක්කර 50 ... | 69. 9.16 ... | 69. 9.30 |
| | 3 ... | අක්කර 25 ... | 69. 9.20 ... | 69. 9.30 |
| පැල්වෙහෙර ගොවිපළ ... ... ... ... | 2 ... | අක්කර 20 ... | 69. 9.18 ... | 69. 9.20 |
| පොළොන්නරුව ගොවිපළ ... ... ... | 4 ... | අක්කර 42 ... | 69. 9.21 ... | 69. 9.23 |
| | 5 ... | අක්කර 28 ... | 69. 9.25 ... | 69 .9.30 |
| | 6 ... | අක්කර 26 ... | 69.10. 1 ... | 69.10. 6 |
| | 7 ... | අක්කර 20 ... | 69.10.10 ... | 69.10.25 |

ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය 1969 සැප්තැම්බර් මස 15 වෙනි දින පෙරවරු 10.30 දක්වා දීර්ඝ කරමි.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්).

1969 අගෝස්තු මස 26 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල් කාර්යාලයේ දී ය.

9–89—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—ගාල්ල කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1970 ජනවාරි 1 වෙනිද සිට 1970 දෙසැම්බර් 31 වෙනිද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර්පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරී ගාල්ල'', කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී ලේකම් තැනට භාරදෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් බාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනයක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයේ සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උප ලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන හෝ එවකට වෙළඳ පොළේ පවතින මිල ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩරකරුවන් විසින් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන් ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

බී. ජී. ඩී. ප්‍රනාන්දු,
සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල.

1969 අගෝස්තු 22 වෙනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දීය.

### උපලේඛනය

| 1 | 2 | 3 | 4 | 5 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | සේවකයින්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| | රුපියල් | රුපියල් | | මාළු | මස් | කරවල | කළවළු | මාළු | මස් | කරවල | එළවළු |
| 1. අහංගම ග්‍රාමීය රෝහල ... | 100 ... | 400 | 69.10.2 පෙරවරු 10ට ... | 150... | 150... | 150... | 650... | 500... | 500... | 500... | 3,000 |
| 2. බටපොල ග්‍රාමීය රෝහල ... | 100 ... | 600 | | 70... | 70... | 70... | 270... | 1,000... | 1,000... | 1,000... | 4,300 |
| 3. හබරාදූව ග්‍රාමීය රෝහල ... | 100 ... | 600 | | 160... | 160... | 160... | 680... | 220... | 220... | 220... | 850 |
| 4. මාදම්පෙ ග්‍රාමීය රෝහල ... | 100 ... | 300 | | 160... | 160... | 160... | 640... | 240... | 260... | 260... | 1,050 |
| 5. නාගොඩ ග්‍රාමීය රෝහල ... | 100 ... | 300 | | 100... | 100... | 100... | 440... | 440... | 550... | 460... | 2,000 |
| 6. ඌරගස්මන්හන්දිය ග්‍රාමීය රෝහල ... | 100 ... | 300 | | 140... | 100... | 130... | 500... | 880... | 820... | 820... | 3,350 |
| 7. අමුගොඩ මාතෘ නිවාසය හා පිටිගල පිරිමි වාට්ටුව ... ... | 100 ... | 300 | | 80... | 80... | 80... | 300... | 550... | 560... | 560... | 2,300 |
| 8. අක්මීමන මාතෘ නිවාසය ... | 100 ... | 300 | | 60... | 60... | 60... | 200... | 350... | 350... | 350... | 1,400 |
| 9. හබුරුගල මාතෘ නිවාසය ... | 100 ... | 300 | | 90... | 90... | 90... | 400... | 50... | 50... | 50... | 200 |
| 10. නෙළුව මාතෘ නිවාසය ... | 100 ... | 300 | | 140... | 130... | 150... | 500... | 580... | 580... | 550... | 2,300 |

9-45—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1969–70 ගබඩා බඩු ඇදීම

**සේවය සහ ටෙන්ඩර් දැමීමට සුදුසු පුද්ගලයින් .**—මේ කාර්යාලයයෙන් හෝ මෙහි මතු 2 වන ඡේදයේ සඳහන් කාර්යාලවලින් හෝ ඉල්ලා ලබා ගතයුතු උපලේඛනවල දක්වා ඇති තොරතුරු පරිදි, 1969.10.1 වනද සිට 1970.9.30 වනද දක්වා වකවානුව තුලැ දුම්රියපොළෙන්/පොළවලින්/පොළවලට/පොළට ආයතනවලින්/ආයතනවලට/කාර්යාලයට/කාර්යාලය යෙන් ගබඩා බඩු ඇදීම සඳහා, ලාංකිකවූ පුද්ගලයින්ගෙනුත්, ලාංකික ව්‍යපාර ආයතනවලිනුත්, සමූපකාර සමිතිවලිනුත් පුත්තලමේ සෞ. සේ. අධිකාරිතැන ටැන්ඩර් බාරගනු ඇත.

සඳහන් මිළ ගණනට කම්කරු ගාස්තු සහ පැටවීම් කුලීද ඇතුළත් වියැ යුතුයි.

**2.** ටැන්ඩර් එවිය යුත්තේ ඊට නියමවූ ආකෘති පත්‍රය මතැයි. රු. 100 ක මුදලක් ළඟමැ ඇති කච්චේරියේ පුත්තලම සෞ. සේ. අධිකාරි නමට තැන්පත් කොටැ එහි ලදුපත ලබාගෙනැ ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු සඳහා ටැන්ඩර්කරු නිසි පරිදි අත්සන් කළ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඒ ලදුපත සමග ඉදිරිපත් කළ යුතුයි. ටැන්ඩර් පත්‍ර 1969.9.26 වනද දහවල් **12** දක්වා මතු සඳහන් සෞ. සේ. අධිකාරි කාර්යාලවලින් ලබාගත හැකිය:—

| | | | |
|---|---|---|---|
| අනුරාධපුර | ගාල්ල | කෑගල්ල | පුත්තලම |
| මඩකලපුව | යාපනය | කුරුණෑගල | රත්නපුර |
| බදුල්ල | කලුතර | මාතලේ | වවුනියා |
| කොළඹ | මහනුවර | මාතර | |

නියමිත ආකෘතිපත්‍රයේ නොවන කිසිදු ටැන්ඩරයක් සැලකිල්ලට ලක් නොවේ.

**3.** තමන් දෙපාර්තමේන්තුව සමග කොන්ත්‍රාත්තුවකට බැදි ඇතත් නැතත් සියලු ටැන්ඩර්කරුවන් විසින් වටිනාකම පිළිබඳ වගතුග සැපයිය යුතුයි. මේ සඳහා අවශ්‍ය ආකෘතිපත්‍ර ඉහත 2 වන ඡේදයෙන් කියැවුනු කවර හෝ සෞ. සේ. අධිකාරි කාර්යාලයෙයකින් ලද හැකිවේ.

**4.** එක් එක් පිටපතේ ටැන්ඩර්කරුගේ අත්සන ඇතිව දෙපිටපතකින් ඉදිරිපත් කළයුතු ටැන්ඩර්පත්‍ර '' බඩු ඇදීම සඳහා ටැන්ඩරය '' යනුවෙන් වම් පැත්තේ උඩු කෙළවරේ සලකුණක් තබා පුත්තලම සෞ. සේ. අධිකාරි වෙත පිට නම් ලියූ කවරයක බහා අස් ඔබා (සීල් තබා) එවිය යුතුයි.

**5.** ටැන්ඩර්පත්‍ර 1969.9.27 වනද පෙවරු 10 ට පෙර පුත්තලම සෞ. සේ. අධිකාරි වෙත ලැබෙනසේ ඔහු වෙත පිට නම ලියා ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් සෞ. සේ. අධිකාරී කාර්යාලයයේ තිබෙන ටැන්ඩර් පෙට්ටියේ හෝ තැන්පත් කළ යුතුය. ටැන්ඩර්කරුවන් කැමති නම්, ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කවරවලින් යුත්, අස් එබූ (සීල් තැබූ) ටැන්ඩර් පත්‍ර ඒ ඒ සෞ. සේ. අධිකාරී කාර්යාලවලැ, ලේකම්/ගණකාධිකාරී වෙත බාර දී ඊට ලදු පතක් ලබා ගැනීමට ටැන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ අවසර ඇත.

**6.** ටැන්ඩර් දමන මිළ ගණන් පැහැදිලි ඉලක්කමෙන් දක්වා වචනයෙන් ද නැවත ලියා තිබිය යුතුයි. වෙනස් කිරීම් සහ මකා දැමීම් සියල්ල ටැන්ඩර් කරු විසින් අත්සන් තබා අනුමත කොට තිබිය යුතුයි. නැත්නම් ටැන්ඩර් පත්‍රය නොසරුප් සේ සලකා පිටු දකිනු ලැබිය හැකිය.

**7.** බඩු ඇදීම සඳහා සෑහෙන තරම් ප්‍රවාහන පහසුකම් සැලසීමට ටැන්ඩර්කරුවන්ට පිළිවන්කම තිබිය යුතුයි. මේ මෙහෙය සඳහා යොද ගැනීමට යන වාහනවල ස්වරූපය ටැන්ඩර් එවන විටැ දක්විය යුතුයි.

**8.** ටැන්ඩර්පත්‍ර 1969.9.27 වනද පෙවරු 10 ට සෞ. සේ. අධිකාරි කාර්යාලයේදී විවෘත කරනු ඇත. ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ වරම්ලත් නියෝජිතයින්ට හෝ තමන් කැමති නම්, පුත්තලම් සෞ. සේ. අධිකාරි සමග විධිවිධාන සලසාගෙන ඔහුගෙ අවසරය පිටැ, ටැන්ඩර් විවෘත කරන විටැ පෙනී සිටිමින් තමන් ඉදිරිපත් කළ ටැන්ඩරයේ දෙවන පිටපත පිරික්සිය හැකිය.

**9.** ටැන්ඩර්කරුවන්, තමන් ඉදිරිපත් කරන මිළගණන්, ටැන්ඩර් බාර ගැනීම අවසන් වන දවසේ සිටැ හය මාසයක් දක්වා පිළිගත හැකිසේ තබාගත යුතුයි. ඉදිරිපත් කළ ටැන්ඩර්පත්‍ර පසුවැ අස්කළ හැකි නොවේ.

**10.** පුත්තලම සෞ. සේ. අධිකාරි ඉල්ලා සිටියොත්, තමන් ගන්නා කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට තමන් පොහොසත් බවට සාක්ෂි හැටියට ලියකියවිලි හෝ වෙනත් සාධක හෝ ඉදිරිපත් කිරීමට ටැන්ඩර්කරුවන් සූදනමින් සිටිය යුතුයි.

**11.** මේ කොන්ත්‍රාත්තුව යටතේ සිය කාරිය ඉටු කිරීමේ දී ටැන්ඩර්කරු සේවයට ගතයුත්තේ ලාංකිකයින් පමණකි. මෙහිදී '' ලාංකිකයා '' යනු වෙන් හැඳින්වෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් හෝ ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි. පුත්තලම සෞ. සේ. අධිකාරිගෙ අවසරය සහ අනුදැනුම කලින් නොලැබ ලාංකික නොවන කම්කරුවන් සේවයට ගැනීම් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළාක් සේ සලකා, කොන්ත්‍රාත්තුව අවලංගු කොටැ එහි කොන්දේසි ප්‍රකාර දඩයන්ට කොන්ත්‍රාත්කරු යටත් කළ හැකි වරදකි.

**12.** 1934 අංක 19 දරන කම්කරු වන්දි මුදල් ආඥපනත හෝ එහි සංශෝධන ,ලිහිල් කිරීම්, එකතුකිරීම්, යන කිසිවක් හෝ යටතේ යම්කිසි සේවකයෙකු විසින් ඉදිරිපත් කරන්නට යෙදෙන යම් හිමිකමක් වෙතොත් කොන්ත්‍රාත් කරු විසින් ඒ හැම දෙයකින්මැ ආණ්ඩුව මුදගත යුතුයි.

**13.** පුත්තලම සෞ. සේ. අධිකාරිතැන ඉල්ලා සිටින පරිදි මුළු කොන්ත්‍රාත්තුව හෝ ඉන් කොටසක් හෝ වෙනුවට රු. 300 කට නොවැඩි ඇප මුදලක් තැබීම අවශ්‍ය වනු ඇත.

**14.** තෝරාගනු ලබන ටැන්ඩර්කරු, කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉටු කරන බවට සෞ. සේ. අධ්‍යක්ෂ සමග කොන්ත්‍රාත්තුවකට බැඳිය යුතුයි. ටැන්ඩර්කරුගේ ටැන්ඩරය බාරගත් බව පුත්තලම සෞ. සේ. අධිකාරි විසින් හෝ ඔහුගේ නිසි වරම් දරන නියෝජිතයෙකු විසින් හෝ ටැන්ඩර්කරුට දන්වා දස දිනක් ඇතුළතදී කොන්ත්‍රාත්තුවට අත්සන් කිරීමට හෝ නියමිත ඇප මුදල තැබීමට හෝ ටැන්ඩර්කරු මැලිවූවොත් හෝ අපොහොසත් වූවොත් හෝ ඔහුගේ තැන්පත් මුදල රාජසන්තකවී, රජයේ ගිවිසුම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් කිරීමට ද හේතුවේ. ටැන්ඩරය බාරගත් බව දක්වෙන නිවේදනය ටැන්ඩර්කරු සිය ටැන්ඩරයේ දී ඇති ලිපිනයට තැපෑලෙන් යවා තිබේ නම්, නැතහොත් ඒ ලිපිනය ඇති තැන දමා තිබේ නම්, එය ටැන්ඩර් කරුට ලැබුණු බව ගණන් ගනු ලැබේ.

**15.** පුත්තලම සෞ. සේ. අධිකාරිගේ අවසරයක් කලින් නොගෙන මේ කොන්ත්‍රාක්තුව අන් කෙනෙකුට පැවරීම හෝ බෙදදීම හෝ නොකට යුතුයි. කොන්ත්‍රාත්කරුවෙකු තමන් වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කරනු පිණිසැ අන් අයෙකුට බලය පවරමින් නිකුත් කළ ප්‍රතිනිධි බලය නොපිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

**16.** පුත්තලම සෞ. සේ. අධිකාරිතැන සෑහෙතැයි තමන්ට පෙනෙන හේතු නිසා, තමා නම් සඳහන් කරන කිසියම් පුද්ගලයෙකු/පුද්ගලයින් කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීම ගැන සිය විරුද්ධත්වය ලියවිල්ල කින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා සිටි කලැ ඒ කියන තැනත්තා/තැනැත්තන් කිසිවෙකුත් කොන්ත්‍රාත්කරු විසින් සේවයට නොගත යුතුයි.

**17.** කිසිදු ප්‍රශ්නයක් නැතිවැ ටැන්ඩර් සියල්ලමැ හෝ ඉන් කිසිවක් හෝ පිටු දැකීමත්, යම් ටැන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමත් රජය සතු අයිතියකි.

**18.** සෞ. සේ. අධ්‍යක්ෂතැන සමග කොන්ත්‍රාත්කරු බැඳුණු ගිවිසුම කවරක් වූවද, තමන් කැමති අන්දමකින්, තමන් කැමැති කෙනෙකු ලවා එකී වැඩ කොටස කරවා ගැනීමේ නිදහස පුත්තලම සෞ. සේ. අධිකාරි වෙත තිබේ. එබඳු විටැකදී වැඩ නැතිවීම නිසා තමන්ට වන පාඩුව පිරිමැසීමට යම්කිසි වන්දියක් හෝ අලාභයක් හෝ අඩුකිරීමක් හෝ වෙනත් සහනයක් හෝ ඉල්ලීමේ අයිතිය කොන්ත්‍රාත්කරුට නොලැබේ. ඔහු ඊට හිමිකරු වෙක්ද නොවේ.

**19.** ඉහතකී පරිදි කොන්ත්‍රාත්කරු වෙත පවරන ලද බඩු ගෙනගොස් බාරදීමට කොන්ත්‍රාත්කරු දෙතුන් වතාවක් ප්‍රමාද වූවහොත් නැත්නම් අපොහොසත් වූවොත් හෝ ඒ බඩු බාරදීමට පිට පිට අපොහොසත් වූවොත් හෝ එකී කොන්දේසි කිසිවක් කඩ කළොත් හෝ ඔහු කොන්ත්‍රාත්තුව ඉටු නොකළාත් සේ සළකනු ලැබේ. තවද, කොන්ත්‍රාත්තුව ඉටු කරන බවට ඔහු ඇපයක් හැටියට තැන්පත් කළ මුදල ද රජය සතුවී, රජයේ කොන්ත්‍රාත්තුවකට හවුල්වීමට ඔහුට ඉඩක් නොලැබෙන පරිදි රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින්නන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් වීමට ඉඩ තිබේ.

**20.** ලංකාණ්ඩුවේ නීති මේ කොන්ත්‍රාත්තුවට අදළ වෙයි.

**21.** ටෙන්ඩර්කරුවන් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හොඳින් දැන සිටිය යුතුයි. තොරතුරු නොදත් බව හෝ ප්‍රමාණවත් නොවූ බව හෝ කියා ඉදිරිපත් කරන මැසිවිලි කිසි කලෙකත් සළකා බලනු නොලැබේ.

**22.** මෙහිලා සඳහන් සියලු කොන්දේසි අකුරට මැ සපුරා නැතහොත්, කිසිදු ටැන්ඩරයක් සලකා බලනු නොලැබේ.

**23.** ටැන්ඩර්කරුවන්ට දැනගැනීමට අවශ්‍ය වැඩි විස්තර යමක් වෙතොත්, ඉහත 2 වැනි ඡේදයේ දක්වෙන කාර්යාලවලින් ඉල්ලා ලබාගත හැකිය.

**24.** **දුර ප්‍රමාණ කිට්ටුවෙන්.**—දුම්රිය පොළවල/අකුරු පොළවල සිට ආයතනවලට/කාර්යාලවලට කොපමණ දුරක් තිබේද යන වග මේ සමග ඇති උපලේඛනයේ දක්වේ. මෙහි දක්වෙන දුර ප්‍රමාණය නිරවද්‍යතාවය ගැන දෙපාර්තමේන්තුව වග නොකියයි.

**25.** **ගබඩා/බඩු යනාදිය නැතිවීම නිසා මුදල් අය කිරීම.**—කොන්ත්‍රාත් කරු විසින් ගෙන ගොස් බාරදිය යුතු බඩු බාහිරාදිය හෝ ඉන් යමක් හෝ නැතිවූවොත් හෝ හොරකම් කරනු ලැබූවොත් හෝ බඩු බාහිරාදියට අලාභයක් හානියක් සිදු වූවහොත් හෝ ඒ හේතුවෙන් රජයට දැරීමට සිදුවන රේගු බදු යනාදිය කිසිවක් වෙතොත් එය ද ඇතුළත් කොටැ, අලාභ හානි සිදුවූ හෝ හොරකම් කරන ලද හෝ නැතිවූ බඩු බාහිරාදියෙහි මුළු වටිනාකම දෙපාර්තමේන්තු ගාස්තුත් සමග දෙපාර්තමේන්තුවට ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

26. දක්විය යුතු මිළ ගණන්.—(අ) (i) බඩු ඇදීම සඳහා මෙසේ වැටි 10 ක් යටතේ එක් එක් බර ගොල්ල වෙනුවෙන් මිළ ගණන් බී–1 උප ලේඛනයෙහි දක්විය යුතු—

පළමුවැ රාත්තල් 28 දක්වා ද,

දෙවැනුව රාත්තල් 28 ට වැඩියෙන් රාත්තල් 56 දක්වා ද,

තුන්වැනුවැ රාත්තල් 56 ට වැඩියෙන් රාත්තල් 84 දක්වා ද,

සිව්වැනුවැ රාත්තල් 84 ට වැඩියෙන් හොණ්ඩර 1 දක්වා ද,

පස්වැනුවැ හොණ්ඩර 1 ට වැඩියෙන් හොණ්ඩර $1\frac{1}{2}$ දක්වා ද,

හයවැනුවැ හොණ්ඩර $1\frac{1}{2}$ ට වැඩියෙන් හොණ්ඩර 2 දක්වා ද,

හත්වැනුවැ හොණ්ඩර 2 ට වැඩියෙන් හොණ්ඩර $2\frac{1}{2}$ දක්වා ද,

අටවැනුවැ හොණ්ගුර $2\frac{1}{2}$ ට වැඩියෙන් හොණ්ඩර $3\frac{1}{2}$ දක්වා ද,

නමවැනුවැ හොණ්ඩර 3 ට වැඩියෙන් හොණ්ඩර $3\frac{1}{2}$ දක්වාද,

දසවැනුවැ හොණ්ඩර $3\frac{1}{2}$ ට වැඩියෙන් හොණ්ඩර 4 දක්වා ද වේ.

(ii) එක් බඩු පොදියක් මුළු දුරම ගෙන යාම සඳහා එක් එක් බර-ගොල්ල උදෙසා මිළ ගණන් දැක්විය යුතුයි.

(iii) මුදල් ගෙවනු ලබන්නේ, ඉහත වැටි ක්‍රමයේ දැක්වෙන බර කුමක් වුවද මුළු දුර ප්‍රමාණය මැ ගෙන යන ලද එක් එක් බඩු පොදි ගමන අනුවැයි.

(iv) එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට අඩුනම්, ඒවායේ ගෙවීම් බී-I උපලේඛනය යටතේ විය යුතුයි. එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට වැඩිවේ නම් ඒවායේ ගෙවීම් තොග ප්‍රවාහණ ගෙවීම් යටතේ බී-II උප් ලේඛනය යටතේ විය යුතුයි.

(ආ) හොණ්ඩර 4 ක් හෝ ඊට වැඩියෙන් හෝ බරක් ඇති බඩු තොග මුළු දුරමැ ගෙන යැම සඳහා මතු සඳහන් වැටි 4 යටතේ බී-II උපලේඛන යෙහි මිළ ගණන් දැක්විය යුතුයි—

(1) හොණ්ඩර 4 කට වැඩියෙන් හොණ්ඩර 10 දක්වා

(2) හොණ්ඩර 10 කට වැඩියෙන් හොණ්ඩර 15 දක්වා

(3) හොණ්ඩර 15 කට වැඩියෙනි හොණ්ඩර 20 දක්වා

(4) ටොන් 1 කට වැඩියෙන්.

ටෙන්ඩර්කරුවන් විසින් මුළු දුරමැ ගෙන යාම සඳහා ඒ ඒ වැටි යටතේ මිළ ගණන් වෙන වෙනම දැක්විය යුතුයි. මුදල් ගෙවනු ලබන්නේ වැටි 4 යටතේ මුළු දුරමැ සඳහා හොණ්ඩරයකට දැක්වූ මිළ ගණන් මතැ අනු ප්‍රමාණ ක්‍රමය උඩයි. හොණ්ඩරයක කොටසක් රාත්තල් 56 කට වැඩි නම් එය හොණ්ඩරයක් සේ සැලකෙයි. නොඑසේ නම් ඊට මුදලක් ගෙවනු නොලැබේ.

(ඇ) සඳහන් කර ඇති මිළ ගණන් සාධාරන විය යුතු අතර යාබද බර කාණ්ඩ අතර අනවශ්‍ය පරිදි මිළ වැඩි විය යුතු නොවේ.

27. මේ දැන්වීම, මෙහි පහත ඉඩ තබා ඇති තැනෙහි ටැන්ඩර්කරුගේ අත්සන තබා ටැන්ඩර් පත්‍රයක් සමග පුත්තලම සෞඛ්‍ය සේවා අධිකාරි වෙත ආපසු එවිය යුතුයි.

ආර්. එච්. පීරිස්,
පුත්තලම සෞඛ්‍ය සේවා අධිකාරී.

දිනය : 1969.8.26

.........................................
දිනය : දිනය : 196................. නිකුත් කරන නිලධාරියාගේ අත්සන.

.........................................
දිනය : 196................. ටැන්ඩර්කරුගේ අත්සන.

## 1969–70 ගබඩා බඩු ඇදීම සඳහා ටැන්ඩර් කොන්දේසිවල 24 වන ඡේදයේ කියැවෙන උප ලේඛනය

### පුත්තලමේ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

### පුත්තලමේ සෞඛ්‍ය සේවා අධිකාරිය—දුම්රිය පොළෙන්/පොළට, ආයතනවලින්/කාර්යාලවලින්/ආයතනවලට/කාර්යාලවලට දුර ප්‍රමාණය දළ වශයයන්

| දුම්රිය පොළෙන්/පොළට දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ස්ථානයට | ආයතනවලින්/ආයතනවලට කාර්යාලවලින්/කාර්යාලවලට | කිට්ටුවෙන් සැලකිය හැකි දුර සැතපුම් |
|---|---|---|
| | **1 වන කොටස—පුත්කලම් දිසත්‍රික්කය** | |
| පුත්තලම ... | පුතත්ලමේ සෞ. සේ. අධි. කාර්යාලය ... | 1 |
| | මව් සහ ළදරු සුහසාධක චිකිත්සාගාරය මන්නාරම් පාර, පුත්තලම ... | 1 |
| | දි. රෝහල පුතත්ලම ... | $\frac{1}{2}$ |
| | ළය රොහල පුත්තලම ... | $\frac{1}{2}$ |
| | සෞ. වෛද්‍ය නිලධාරි පුත්තලම ... | 1 |
| | ග්‍රාමීය රෝහල කොට්ටුකච්චිය ... | 10 |
| | දි. රෝහල ආනමඩුව ... | 16 |
| | ම. බෙ. හල. තබ්බෝව ... | 9 |
| | ම. බෙ. හල කාරතීවු ... | 15 |
| | ම. බෙ. හල. වන්නාතවිල්ලු ... | 13 |
| පාලාවි ... | ම. බෙ. හල මදුරන්කුලිය ... | 4 |
| | මා. නිවාසය මහකුඹුකඩවල ... | $11\frac{1}{2}$ |
| | ග්‍රා. රෝහල කල්පිටිය ... | 25 |
| | ම. බෙ. සහ මාතෘ නිවාස මාම්පුරි ... | 7 |
| | ම. බෙ. හල තලවිල ... | 18 |
| මුන්දල් ... | පර්යාන්ත ඒකකය, මුන්දල් ... | $\frac{1}{2}$ |
| | ම. බෙ. හල කොට්ටන්තීවු ... | 8 |
| | **2 වන කොටස—හලාවත දිස්ත්‍රික්කය** | |
| බෝලවත්ත ... | සෞ. වෛ. නි. කාර්යාලය, දන්කොටුව ... | 3 |
| | පර්යන්ත ඒකකය දන්කොටුව ... | 2 |
| | ම. බෙ. හල නයිනාමඩුව ... | 3 |
| | ම. බෙ. හල මැල්ලව ... | 9 |
| ලුනුවිල ... | ම. බෙ. හල කොස්වත්ත ... | 5 |
| | ම. බෙ. හල පොතුවටවන ... | 4 |
| | ම. බෙ. හල ලුනුවිල ... | $\frac{1}{2}$ |
| නාත්තන්ඩිය ... | ම. බෙ. හල නාත්තන්ඩිය ... | $\frac{1}{4}$ |
| | සෞ. වෛ. නි. කාර්යාලය, මාරවිල ... | 3 |
| | දි. රෝ. මාරාවිල ... | $3\frac{1}{2}$ |
| | ම. බෙ. හල වලහපිටිය ... | $3\frac{1}{2}$ |
| කුඩාවැව ... | ම. බෙ. හල තොඩුවාව ... | $4\frac{1}{2}$ |
| මාදම්පේ ... | පර්යාන්ත ඒකකය මාදම්පේ ... | 1 |
| | බෙහෙත් ගබඩාව මාදම්පේ ... | 1 |
| | ම. බෙ. හල තඹගල්ල ... | 5 |
| | පර්යන්ත ඒකකය ගල්මුරුව ... | 3 |
| හලාවත ... | මූලික රොහල හලාවත ... | $\frac{1}{2}$ |
| | සෞ. වෛ. නි. ක්ර්යාලය, හලාවත ... | $\frac{1}{4}$ |
| | ම. බෙ. හල කොක්කාවිල ... | 7 |
| බංගදෙනිය ... | ම. බෙ. හල පල්ලම ... | 12 |
| බත්තුළුඔය ... | ම. බෙ. හල ආනවිලුන්දව ... | 2 |
| | ම. බෙ. හල උඩප්පුව ... | 4 |
| | ම. බෙ. හල කටුපොත ... | 4 |
| | ම. බෙ. හල මුදලක්කුලිය ... | 14 |

9–118—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### බෝල හණ ලණු සැපයීම

බෝල හණ ලණු සැපයීම සඳහා කොළඹ, තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1969 සැප්තැම්බර් මස 26 වැනි දින පෙ.ව. 10 වන තෙක් මෙරට නිෂ්පාදකයින්ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 1969 සැප්තැම්බර් මස 26 දින පෙරවරු 10.15 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ඇත. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

3. කොළඹ 5, නාරාහේන්පිට, සහකාර අධිකාරී (උපකරණ, ගොඩ-නැඟිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් නිකුත් කරන ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරන කවුළුවේ රු. 50 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගෙන, එම රිසිට් පත ඉදිරිපත් කළ විට, අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. 1969 සැප්තැම්බර් මස 6 වැනි දින සිට 1969 සැප්තැම්බර් මස 24 වැනි දින දක්වා කාර්යාල වේලාවන් තුළ ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

5. වැඩි විස්තර, කොළඹ 5, නාරාහේන්පිට, සහකාර අධිකාරී (උපකරණ, ගොඩනැඟිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් ලබාගත හැක.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
කොළඹ 1.

9–108—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

යොමු අංකය : සීජ්—1/69

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කොළඹ රෝහල් මණ්ඩලය—කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් 30 වැනිදායින් (දින දෙකක් ඇතුළුව) අවසන් වන වර්ෂය තුල, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවැනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් සහ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ, රෝහල් මණ්ඩලයේ අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලටද තැන්පත් මුදල් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි, ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි කළ අංකය පැහැදිළිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන්ද ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන් ගෙන්ද ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක් වත් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා, අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම්, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛණයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවටද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ලේකම් මහතාට (හෝ මා හට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු/හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පෙනෙන උපලේඛනයේ 6 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ අසලින් සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින අයදුම්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙන් පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදි පහසුකම් සැලැස්වුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරී තුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සය එහා මෙහා ගෙන යාමේ වියදම.**—යම් අවස්ථාවල කිළිටි රෙදි සේදීමට පළමු විෂබීජ නැතිකිරීම සඳහා වෙනම ස්ථානයකට ගෙන යාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙන යෑමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුල ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

ඒ. නාගේන්ද්‍රන්,
කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී.

කො. රෝ. ම. අධිකාරී කාර්යාලය,
මහ රෝහල, කොළඹ.
1969 අගෝස්තු මස 28 වැනි දින,

### උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) මසකට රෙදි සේදිය යුතු වාර ගණන | (5) මසකට සේදිය යුතු කෑලි ගණන සාමාන්‍ය | (6) ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| 1. රෝගෝපසම නිවාසය, තලගොල්ල, රාගම ... | 100 | 400 | 3 | 2,750 | 1969.9.26 දින පෙරවරු 10 ට |
| 2. පිළිකායතනය, මහරගම II වැනි කොටස ශලාගාරය | 100 | 300 | 8 | 1,350 | |
| 3. කොළඹ ද සොයිසා කාන්තා රෝහල II වැනි කොටස, ශලාගාරය | 100 | 300 | 10 | 2,500 | |

9-145—69.9.5 දින අංක 14,870 දරණ ගැසට් පත්‍රය

## ජල සම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශය—රත්මලාන

**දිබුල්වෙල කටත්ග අඩි පාළම—අටකලන් කෝරළේ මැදපත්තු ගම් සභාව**

69.7.11 දින දරණ රජයේ ගැසට් පත්‍රයේ සඳහන්, 69.7.3 දරණ දන්වීම පහත සඳහන් අයුරින් සංශෝධනය කර ඇත.

(අ) ටෙන්ඩර් භාරගනු ලබන දිනය 1969 සැප්තැම්බර් මස 23 වන දින පස්වරු 2.30 දක්වා දීර්ඝ කර ඇත. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත එදිනම පස්වරු 2.35 ට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැකිය.

(ආ) ටෙන්ඩර් ලිය කියවිලි, 1969 සැප්තැම්බර් මස 16 වන දින් දහවල් 12 දක්වා නිකුත් කරනු ලැබේ.

ආර්. වී. පෙරුමයිනාර්,
වැඩ බලන අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 22 දින,
ජලසම්පාදන, ජලපවහන හා පළාත් පාලන වැඩ අංශය,
රත්මලාන.

9–69—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—බණ්ඩාරවෙල

1969 සැප්තැම්බර් මස 12 වැනි දින පෙ.ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| බ/ගල්බොක්ක යෝජිත පාසැල ... | පාසැල් ගොඩනැඟිල්ල තැනීම |

**සංලක්ෂාය**—බ = බදුල්ල දිස්ත්‍රික්කය

**අවශ්‍ය ලියාපදිංචිය**—රු. 25,000 හෝ ඊට වැඩි

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයයේ හෝ බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සි බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් ඉහත සඳහන් පරිදී හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැඟිලි වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 සැප්තැම්බර් මස 11 වැනි ද දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. චැක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සිය නිකුත් කරණු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන්කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි-මාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කල යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි සහ 3 වැනි ඡේදවල සඳහන් පරිදී බණ්ඩාරවෙල අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධව සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපැලෙන් බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ පාලන නිලධාරී/ප්‍රධාන ලිපිකාර වෙත භාරදිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 සැප්තැම්බර් මස 12 වැනි ද පෙරවරු 10.30 ට බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිල ගණන් කියවනු ලැබේ.

6. චෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමතිවිය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

සී. ඒ. ජී. ප්‍රනාන්දු,
ඌව ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 24 දින,
බණ්ඩාරවෙල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

9–189—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාද ප.ව. 2.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර, මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| | පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| 1. | මහ/ගිරිහාගම වි. ... | 80′ × 20′ පාසල් ගොඩනැගිල්ල |
| 2. | මහ/තෙල්දෙනිය ම.වි. ... | 100′ × 20′ පාසල් ගොඩනැගිල්ල |
| 3. | මහ/ගම්පල ශාන්ත අන්ද්‍ර ළදරු වි. | 80′ × 20′ පාසල් ගොඩනැගිල්ල |
| 4. | මහ/ගුරුදෙනිය වි. ... | රසායනාගාරය සහිත ගොඩනැගිල්ල |
| 5. | මහ/කෙන්ගල්ල ම.වි. ... | 100′ × 20′ පාසල් ගොඩනැගිල්ල |
| 6. | මහ/කටුගස්තොට ශ්‍රී රාහුල ම.වි | 120′ × 20′ පාසල් ගොඩනැගිල්ල |
| 7. | මහ/කොටකේදෙනිය වි. ... | 120′ × 20′ පාසල් ගොඩනැගිල්ල |
| 8. | මහ/දේවාලේගම්මැද්ද වි. ... | 120′ × 20′ පාසල් ගොඩනැගිල්ල ආදිය |

සංලක්ෂාය.—මහ = මහනුවර ප්‍රදේශය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් වැඩ අංක 1 සිට 3 දක්වා රු. 25,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 4 සිට 5 දක්වා රු. 30,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 6 සිට 7 දක්වා රු. 35,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 8 රු. 40,000 හා ඊට වැඩි ගණනකට, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 සැප්තැම්බර් මස 24 වැනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරණු ලැබේ. (වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්). චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මහනුවර, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වි ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි මහනුවර ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කර හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව මහනුවර අධ්‍යාපන කාර්යාලයේ පරිපාලන නිලධාරි වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තරයක් වේනොත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරී තැනගේ කායභාලයෙන් දැනගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කායභාලයෙන් තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 1966.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියා පදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

කා. සො. පලිහක්කාර,
ප්‍රධාන අධ්‍යාපන නිළධාරී, පොළොන්නරුව.

1969.8.24 වැනි දින,
පොළොන්නරුව අධ්‍යාපන කායභාලයේ දී ය.

9–64—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—නුවරඑළිය

### නුවරඑළිය ප්‍රදේශයේ පාසැල් වලට ඇදිහැස විස්කෝතු ගෙනයාම

මෙහි පහත සඳහන් සේවාවන් සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(1) පහත දක්වෙන සැපයීමේ මධ්‍යස්ථානවල සිට එහි දක්වෙන මණ්ඩල වලට අයත් සියළුම පාසැල් වලට පෙට්ටිවල අසුරන ලද විස්කෝතු ප්‍රවාහණය කිරීම.

(2) එම මණ්ඩලවල පිහිටි පාසැල් වලින් බෙදහැරීමේ මධ්‍යස්ථාන වෙත හිස් විස්කෝතු පෙට්ටි ගෙනවිත් බාරදීම.

ඉහතින් සඳහන් කරන ලද මධ්‍යස්ථාන සහ ඒවාට අයත් මණ්ඩල මෙසේයි :

| මධ්‍යස්ථානය | | මණ්ඩලය |
|---|---|---|
| මහනුවර | ... | හඟුරන්කෙත, වලපනේ, කොත්මලේ සහ මස් කෙළිය |
| බණ්ඩාරවෙල | ... | වැලිමඩ, ඌව—පරණගම සහ නුවරඑළිය |

යථෝක්ත මණ්ඩලවල විස්කෝතු ප්‍රවාහනය පිළිබඳ ටෙන්ඩර්පත්, නුවරඑළිය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 සැප්තැම්බර් මස 26 වෙනි දින පෙරවරු 10.30 තෙක් භාරගනු ලැබේ. නුවරඑළියේ අධ්‍යාපන කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු වේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට පෙර රුපියල් 100 ක තැන්පත් මුදලක් එක් එක් මණ්ඩලය වෙනුවෙන් නුවරඑළිය අධ්‍යාපන කාර්යාලයේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත් අයට 1969 සැප්තැම්බර් මස 24 වෙනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. අනුමත කරන ලද සමිතියක් නම් එකී මුදල තැන්පත් කිරීම අනවශ්‍යය.

ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් භාරදීම අපේක්ෂා කරන අයවළුන් විසින් නුවරඑළියේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත රුපියල් 15,000 ක් වටිනා ස්ථිර දේපල ඇති බවට ඒත්තු යන පරිදි සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. විස්කෝතු ප්‍රවාහණය කිරීමට අදහස් කරන මණ්ඩල ගණන දෙකකට වැඩිනම් ඉල්ලුම් කරන කොන්ත්‍රාත්කරු නමින් ලියා පදිංචි කළ ලොරි දෙකක් තිබිය යුතුය. ප්‍රවාහණය කරන මණ්ඩල ගණන දෙකකට වැඩි නොවේ නම් තමා නමින් එක ලොරියක් තිබීම සෑහේ. එකී වාහන ඉල්ලුම්කරුගේ නමින් ලියා පදිංචි කරන ලද බවට හා ඒවා සඳහා 1969 අවුරුද්දට නියමිත බලපත්‍ර ලබාගත් බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. අනුමත කරන ලද සමුපකාර, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමිති මගින් ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමට කලින්, නුවරඑළියේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වරයාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තුමාගෙන් හෝ කම්කරු කොමසාරිස් තුමාගෙන් එකී සමිතියට මෙම සේවය ඉටු කිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් යථා යෝග්‍ය පරිදී ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකළ අයට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු නොලැබේ.

නුවරඑළියේ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් හෝ ඇදිහැස සංවිධානයෙන් හෝ නිකුත් කිරීමේ ඇණවුම් පත් ලැබී සතියක් ඇතුළත පාසැල්වලට විස්කෝතු ගෙන ගොස් භාරදීම කළ යුතු වේ. ටෙන්ඩරය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීමේ හෝ එහි කොටසක් පමණක් භාරගැනීමේ හෝ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයේ සිට සති 6 ක් යනතුරු තැන්පත් මුදල ආපසු ගෙවනු නොලැබේ.

ටෙන්ඩර් පිළිබඳ සියළුම කොන්දේසි හා වෙනත් විස්තර නුවරඑළියේ අධ්‍යාපන කාර්යාලයෙන් ලබාගත හැකිය.

පී. බී. රත්නායක,
නුවරඑළියේ වැඩ බලන අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 28 දින,
නුවරඑළිය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

9–187—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව—මාතලේ දිස්ත්‍රික්කය

### සුළු වාරි කර්මාන්ත

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

(1) ඇටවරාහේනේ වැව අලුත්වැඩියා කිරීම.
(2) මාරාගමුවේ ලිංතොට වැව අලුත්වැඩියා කිරීම.
(3) ඕපල්ගල උඩතැන්නේ ඇලේ පෝටාව ඉදිකිරීම.
(4) ඇලගමුවේ ඇල වැඩි දියුණු කිරීම.
(5) ලීනිපිටියේ අමුණ සහ ඇලවේල්ල අලුත්වැඩියා කිරීම.
(6) වැහිගල හල්මිල්ලපිටිය ඇලේ තාවකාලික පිහිල්ල ඉදි කිරීම.
(7) අලුත්ගම මකුලස්සපිටිය අමුණ ඉදි කිරීම.
(8) බණ්ඩරපොල නානුමුරේ අමුණ ඉදිකිරීම.
(9) කොටුවේගෙදර අලතුගොඩයාවත්තේ අමුණ හා පොදු කමතට බැම්මක් ඉදිකිරීම.
(10) පිටවල එපිටගම්මැද්දේ අමුණ හා ඇල දියුණුකිරීම.
(11) මහලකොටුවේ මැද ඇලේ සිමෙන්ති අමුණ අලුත්වැඩියා කිරීම.
(12) ගුරලවෙල කලුවන්පැලේ අමුණ ඉදිකිරීම.
(13) ඇටන්වල උඩපතනේ අමුණ හා ඇල අලුත්වැඩියා කිරීම.
(14) දෙහිදෙනියේ හිත්‍රාකන්දේ අමුණ සහ පෝටාව ඉදිකිරීම.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණ යෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 සැප්තැම්බර් මස 19 දින දවල් 12 දක්වා මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාල යෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළයුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දක්වීය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළයුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවර වල බහා, මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ උඩ, වම් කෙළවරේ " .............. සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය " යනුවෙන් සඳහන් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 සැපතැම්බර් මස 20 දින දවල් 12 ට පෙර මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර් කරුට ඒ බව මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නාවූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදයක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වූවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීටේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත්වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. " ලාංකික " යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. " ගොවිජන සේවා සහකාර කොමසාරිස් " යනුවෙන් හැඳින් වෙන්නේ දනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 සැප්තැම්බර් මස 21 දින පෙ.ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලී මෙන් එසේ කළහැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඩබ්ලිව්. ටී. බී. අරඹේපොල,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
මාතලේ දිස්ත්‍රික්කය.

මාතලේ දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ කාර්යාලය,
1969 අගෝස්තු මස 28 දින දීය.

9–186—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### දකුණු කළුතර දුම්රියාංගනයේ පිහිටි පූර්ව නිර්මිත ගබඩාව අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩර් දැන්වීම

කළුතර දිස්ත්‍රික්කයේ දකුණු කළුතර පූර්ව නිර්මිත ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 සැප්තැම්බර් 26 වැනි සිකුරාද ප.ව. 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මංඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. රුපියල් 50 (පණහක්) තැන්පත් කර ඒ සඳහා ලබාගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කර, කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගණකාධිකාරිට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. රුපියල් 15,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ සඳහා රජයේ බලය ලත් කොන්ත්‍රාත්කරුවන්ට පමණක් "කොන්ත්‍රාත් කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1969 සැප්තැම්බර් මස 24 වෙනි දින දවල් 12.00 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපැලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා සිටින කොන්ත්‍රාත්කරුවන් විසින් ඒවා ලබාගෙන අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් පත්‍ර එවීමට හැකිවන පරිදි කල්වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබාගත හැක.

වී. ති. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 සැප්තැම්බර් මස 5 වැනි දින,
කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දීය.

9–188—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## මාතලේ දිස්ත්‍රික්කය

### නාලන්ද තානායමේ ජලස්නාන පහසුකම් ඇතිව අතිරේක කාමරයක් තැනීම

මාතලේ දිස්ත්‍රික්කයේ නාලන්ද තානායමේ ජලස්නාන පහසුකම් ඇතිව අතිරේක කාමරයක් තැනීම සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීම පිණිස මවිසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1969 සැප්තැම්බර් මස 13 වැනි දින දහවල් 12 දක්වා භාරගනු ලැබේ. 1969 සැප්තැම්බර් මස 13 වැනි දින ප.ව. 2.30 ට සියලුම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් ඉල්ලුම්කරුවන්ට එදින නියමිත වේලාවට ටෙන්ඩර් මණ්ඩලයේ ඉදිරිපිට පෙනී සිටිය හැක.

2. ටෙන්ඩර් පත් මාතලේ දිසාපති වෙත ලියාපදිංචි තැපැලෙන් එව්ය යුතුයි. නැතහොත්, මාතලේ දිසාපති කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලිය යුතුයි. ටෙන්ඩර් පත්‍රයේ ඇති සියලුම වෙනස් කිරීම් ටෙන්ඩර්කරු විසින් කෙටි අත්සන තබා සහතික කළ යුතු යි.

3. ටෙන්ඩර් පත්‍ර මාතලේ දිසාපති කාර්යාලයෙන් 1969 සැප්තැම්බර් මස 12 දින ප. ව. 4.30 දක්වා ලබා ගත හැකි ය. මෙසේ ලබා ගන්නා ටෙන්ඩර් පෝර්ම හැර වෙනත් ටෙන්ඩර් පෝර්මවලින් එවන ටෙන්ඩර් පත් භාරගනු නොලැබේ.

4. නාලන්ද තානායමේ ජලස්නාන පහසුකම් ඇතිව අතිරේක කාමරයක් තැනීම් සඳහා රු. 25 ක් තැන්පත් කොට ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත් ලබාගත හැක. එසේම එවනු ලබන ටෙන්ඩර් පත්‍ර මුද්‍රා තබන ලද කවරයක බහා එවිය යුතු යි. එකී කවරයේ වම්පස උඩ කෙළවරේ " නාලන්ද තානායමේ ජලස්නාන පහසුකම් ඇතිව අතිරේක කාමරයක් තැනීම " යනුවෙන් සඳහන් කළ යුතුය.

5. තොරාගත් ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරයේ මුළු මුදලින් 5% ක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුය. එසේම ටෙන්ඩර්කරු තම ටෙන්ඩරය පිළිගත් බව දන්වා දින පහක් ඇතුළත දී වැඩ ගිවිසුම් පත් අත්සන් කිරීමට පැමිණිය යුතු යි. එසේ කිරීමට අතපසු කළහොත් හෝ වැඩ ගිවිසුම අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

6. කිසිදු හේතුවක් නොදක්වා ටෙන්ඩර් සියල්ල හෝ ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක කොටසක් පිළිගැනීමට මාතලේ දිසාපතිට හැක.

7. මාතලේ දිසාපතිගේ අවසරයක් නොලබා ගිවිසුම් පත්‍රය වෙන අයෙකුට පැවරීමට හෝ භාරදීමට පුළුවන්කමක් නැත. එසේ පත් කර ගන්නා ලද ටෙන්ඩර්කරු වැඩය කරවන ප්‍රදේශයේ අවශ්‍යතාවයන් අනුව පුහුණු හෝ නුපුහුණු ලාංකික කම්කරුවන් යෙදවිය යුතු යි.

8. ටෙන්ඩර් පත් ලබාගත හැක්කේ ලියාපදිංචි කළ කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කිරීමෙන්ය. ලියාපදිංචි නොවූ අයකු නම් තමාට රු. 15,000 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් කිරීමට හැකියාවක් ඇති බවට ප්‍රාදේශිය ආදයම් නිලධාරි තැනගෙන් සහතිකයක් ඇතිව පැමිණිය යුතු ය.

9. ලියාපදිංචි සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය නැත. සමිති ලියාපදිංචි කළ බවට සහ වැඩය භාරගෙන කිරීමට හැකියාවක් ඇති බවට ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රාදේශිය නිලධාරීන්ගෙන් ලබා ගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. තවද, වැඩය භාරගෙන කිරීමට සතුටු බව ප්‍රකාශ කරන සමිතියේ සම්මත කරගත් වාර්තාවක පිටපතත් කළ යුතුය.

10. වැඩි විස්තර අවශ්‍ය නම් මාතලේ දිසාපති කාර්යාලයෙන් ලබාගත හැක.

ඊ. තේවනේසම්,
මාතලේ දිසාපති වෙනුවට.

1969 සැප්තැම්බර් 28,
දිසාපති කාර්යාලය, මාතලේ.

9–180—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

1969-70 මුදල් වර්ෂයේ පළමු භාගය සඳහා පහත දක්වෙන ව්‍යාපාරවලට ගොඩනැගිලි උපකරණ සැපයීම පිණිස මාන්කුළම්හි, ඉඩම් සංවර්ධන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

**වවුනියා දිස්ත්‍රික්කය.**—පාවක්කුළම, වව්නියා ටවුම, සුදන්දිර පුරම, මුතියන්කට්ටුකුළම හා ඔිදියමලෙයි.

**යාපනය දිස්ත්‍රික්කය.**—වව්නිකුළම, අක්කරායන්කුළම, කෝච්චායි, කඩ ඩීන- කුළම, තෙනියන්කුළම, වන්නේරිකුළම, අම්බලප්පෙරුමාල්කුළම, කිළිනොච්චිය හා කාර්යාලයනාගපඩ්ඩුවාන්.

2. ඉහත සඳහන් ව්‍යාපාරවලට මෙහි පහත දක්වෙන ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා 1969 සැප්තැම්බර් 19 වන දින දහවල් 3.00 වන තෙක් මාන්කුළම ඉඩම් සංවර්ධන නිලධාරි තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

(අ) පොල් අතු (පෙදුරු) 1,000 බැගින්. (දිගින් අඩි 6 ක් සහ පළලින් අඟල් 10 ප්‍රමාණයෙන් යුක්තව)

(ආ) තැම්බූ හුණු බුසල් ගණනින්.

(ඇ) නොතැම්බූ හුණු බුසල් ගණනින්.

(ඈ) පිලිස්සූ ගඩොල් 1,000 බැගින් (ප්‍රමාණය : $8\frac{3}{4}'' \times 4\frac{1}{2}'' \times 2\frac{3}{4}''$)

(ඉ) කළුගල් ($6'' \times 9''$) සුදු කියුබ් ගණනින්.

(ඊ) කළුගල් ($3'' \times 9''$) ග්‍රැනයිට් කියුබ් ගණනින්.

(උ) කැබලි ගල් $\frac{1}{2}''$ සුදු, කියුබ් ගණනින්.

(ඌ) කැබලි ගල් $\frac{1}{2}''$ ග්‍රැනයිට් කියුබ් ගණනින්.

(එ) කැබලි ගල් $\frac{3}{4}''$ සුදු, කියුබ් ගණනින්.

(ඒ) කැබලි ගල් $\frac{3}{4}''$ ග්‍රැනයිට් කියුබ් ගණනින්.

(ඔ) කැබලි ගල් 1'' සුදු කියුබ් ගණනින්.

(ඕ) කැබලි ගල් 1'' ග්‍රැනයිට් කියුබ් ගණනින්.

(ක) කැබලි ගල් $1\frac{1}{2}''$ සුදු කියුබ් ගණනින්.

(කා) කැබලි ගල් $1\frac{1}{2}''$ ග්‍රැනයිට් කියුබ් ගණනින්.

(කැ) කැබලි ගල් 2'' සුදු කියුබ් ගණනින්.

(කෑ) කැබලි ගල් 2'' ග්‍රැනයිට් කියුබ් ගණනින්.

සැ.යු.—යථෝක්ත උපකරණ පහත දක්වෙන ආකාරයට සැපයිය හැකි ගාස්තු වෙන් වෙන් වශයෙන් සඳහන් කළ යුතුයි.

(1) ගල්වලේදී/පෝරණුවේ දී භාරදීමට.

(2) වැඩපලට ගෙනැවිත් භාරදීමට.

3. මෙම කාර්යාලයේදී හෝ ඕනෑම කච්චේරියක රු. 50 ක මුදලක් තැන්පත් කොට ලබාගන්නා ලද කුවිතන්සියක් මට ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝරම ලබා ගත හැක.

4. එක් ව්‍යාපාරයකට හෝ ඊට වැඩි ගණනකට සැපයීමට ටෙන්ඩර් භාරදිය හැක.

5. 1969 සැප්තැම්බර් 7 වන දින සිට 1969 සැප්තැම්බර්16 වන දින දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

6. මවිසින් කරනු ලබන ඇණවුම්වලට අනුව දක්වන දිනයේ සිට දින 14ක් ඇතුළත උපකරණ සැපයීමට තෝරාගත් ටෙන්ඩර්කරුට හැකිවිය යුතුය. ඒ අනුව ද්‍රව්‍ය සැපයීම පැහැර හරින හෝ සැපයීමට අපොහොසත් වන හෝ ටෙන්ඩර්කරුවකු වෙතොත් ඔහුගේ නම කොන්ත්‍රාත්තු කඩකල කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඇතුළත් කිරීමට සිදුවන අතර, ඔහු විසින් තැන්පත් කරන ලද මුදල් රජය සතු වනු ඇත.

7. ටෙන්ඩර් එවනු ලබන කවරයේ වම් උඩ කෙළවරේ ''ගොඩනැගිලි උපකරණ සැපයීමට ටෙන්ඩර්'' යන්න සඳහන් කොට එවිය යුතුය. සියළුම ටෙන්ඩර් මුද්‍රා තබා, ලියා පදිංචි තැපෑලෙන් මාන්කුළම ඉඩම් සංවර්ධන නිලධාරි වෙත එවීම හෝ, මෙම කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

8. 1969 සැප්තැම්බර් 19 වන දින ප.ව. 3.00 ට ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

9. මේ ගැන වැඩි විස්තර අවශ්‍ය වෙතොත් මාන්කුළම ඉඩම් සංවර්ධන නිලධාරි තැන විමසන්න.

බ. පා. ආ. තම්බිනායගම්,
ඉඩම් සංවර්ධන නිලධාරි.

1969 අගෝස්තු මස 17 වන දින,
මාන්කුළම,
ඉඩම් සංවර්ධන කාර්යාලයේදීය.

9-63—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

### අනුයාත ගොඩනැගිලි සහ ගබඩා ඉදිකිරීම

රුපියල් දස ලක්‍ෂයකට නොඅඩු ගොඩනැගිලි කර්මාන්ත සඳහා රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක හෝ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවට අවශ්‍ය ගබඩා සහ අනුයාත ගොඩනැගිලි පානලුවේ ඉදිකිරීම සඳහා රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ සභාපති විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ. ටෙන්ඩර්, 1969 සැප්තැම්බර් 21 වැනි දින පෙරවරු 10.30 ට හෝ ඊට පෙර හෝ මෙම කාර්යාලයට ලැබීමට සැලැස්විය යුතුය.

කොළඹ 7, 75, වෝඩ් පෙදෙසේ, වීඑස්ඊ ගොඩනැගිල්ලේ, වරලත් නිර්මාණ ශිල්පීන් වූ තුරේරාජා ඇසෝසියේට්ස් සමාගමට එක පෝර්මයකට රු. 50 බැගින් ගෙවා ඔවුන්ගෙන් ලබා ගත හැකි පෝර්ම වල ටෙන්ඩර් ඉදිරිපත් කල යුතුයි. සෑම ටෙන්ඩරයක් සඳහාම ආපසු ගෙවනු ලබන රු. 500 ක තැන්පත් මුදලක් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවට ගෙවිය යුතුයි. ටෙන්ඩර් පෝර්ම 1969 සැප්තැම්බර් මස 17 වැනි දින දහවල් 12 තෙක් නිකුත් කරනු ලැබේ. සියලු විස්තර රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවෙන් හෝ නිර්මාණ ශිල්පීන්ගේ කාර්යාලයෙන් හෝ ලබාගත හැක.

සභාපති,
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

2බී, ද සොන්සේකා පාර,
කොළඹ 5,
1969 අගෝස්තු 29 දින.

9-265—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

යටියන්තොට බලවේග පෙහෙකම්හල් ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 ඔක්තෝබර් මස 6 වැනි සඳුදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. අවිස්සාවේල්ලේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු වරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්ම ද ඔහුගේ කාර්‍යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,65,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 සැප්තැම්බර් මස 19 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් යෙදහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළයුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘතිපත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර.වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ටී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

ර.වැ.දෙ. ප්‍රධාන කාර්යාලය,
කොළඹ 1,
1969.8.29.

9-147/1—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කොලොන්න ඡන්ද කොට්ඨාශයේ සූරියකන්දේ බලවේග පෙහෙකම්හල් ගොඩනැගිල්ල තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති වරයා විසින් වර්ෂ 1969 ඔක්තෝබර් මස 6 වැනි සඳුද පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. පැල්මඩුල්ලේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු වරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්ම ද ඔහුගේ කාර්යාල යේදී බලා ගැනීමට පිළිවන.

3. ර.වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,50,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 සැප්තැම්බර් මස 19 වැනි සිකුරාද පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම් කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර.වැ. දෙපාර්තමේන්තු වේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ටී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

ර.වැ.දෙ. ප්‍රධාන කාර්යාලය,
කොළඹ 1,
1969.8.29.

9–147/2—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

පුත්තලමේ විදුලි ඉංජිනේරු සඳහා කල්අඩියේ කාර්යාලය, නිවාස යනාදිය ("ඒ" කොටසට අයත් ගොඩනැගිලි) තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 ඔක්තෝබර් මස 6 වැනි සඳුද පෙරවරු 11.00 වන තෙක් භාර ගනු ලැබේ.

2. පුත්තලමේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු වරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්ම ද ඔහුගේ කාර්යාල යේදී බලා ගැනීමට පිළිවන.

3. ර.වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 2,18,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 සැප්තැම්බර් මස 19 වැනි සිකුරාද පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම් කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර.වැ. දෙපාර්තමේන්තු වේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ටී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

ර.වැ.දෙ. ප්‍රධාන කාර්යාලය,
කොළඹ 1,
1969.8.29.

9–147/3—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

පුත්තලමේ විදුලි ඉංජිනේරු සඳහා කල්අඩියේ නිවාස යනාදිය ("බී" කොටසට අයත් ගොඩනැගිලි) තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩල යෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 ඔක්තෝබර් මස 6 වැනි සඳුද පෙරවරු 11.00 වන තෙක් භාර ගනු ලැබේ.

2. පුත්තලමේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු වරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිත ව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්ම ද ඔහුගේ කාර්යාල යේදී බලා ගැනීමට පිළිවන.

3. ර.වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,71,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 සැප්තැම්බර් මස 19 වැනි සිකුරාද පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම් කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර.වැ. දෙපාර්තමේන්තු වේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ටී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

ර.වැ.දෙ. ප්‍රධාන කාර්යාලය,
කොළඹ 1,
1969.8.29.

9–147/4—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## දඹුල්ල සුලු නගර සභාවේ මුඩුක්කු සංහාරක නිවාස යෝජනා ක්‍රමය

ඉහත සඳහන් කර්මාන්තය කරවීම සඳහා, රජයේ හෝ පළාත් පාලන ආයතනවල රුපියල් 20,000 ට වැඩි කර්මාන්ත කරවීම සඳහා ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් 69.9.27 වැනි දින පෙරවරු 9.30 දක්වා මා විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් එවිය යුත්තේ රු. 250 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් සහ රු. 7.50 ක පෝර්ම ගාස්තුවක් ලැබුණු විට මා විසින් 69.9.24 වැනි දින පෙ.ව. 10.00 දක්වා නිකුත් කරනු ලබන නියමිත ආකෘති පත්‍රවලය. වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළදී මෙම කාර්යාලයේ ලේකම් ගෙන් ලබාගත හැක.

හෙ. වි. ප්‍රේමතිලක,
දඹුල්ල සුලු නගර සභාවේ සභාපති.

සුලු නගර සභා කාර්යාලය,
දඹුල්ල, 69.8.21.

9–59—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

පුත්තලමේ විදුලි ඉංජිනේරු සඳහා කල්අඩියේ නිවාස යනාදිය (" සී " කොටසට අයත් ගොඩනැගිලි) තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 ඔක්තෝබර් මස 6 වැනි සඳුද පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. පුත්තලමේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්ම ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,85,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 සැප්තැම්බර් මස 19 වැනි සිකුරාද පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර.වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක දී හෝ තැන්පත් කළ හැක.

ටී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

ර.වැ.දෙ. ප්‍රධාන කාර්යාලය,
කොළඹ 1,
1969.8.29.

9–147/5—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## පොළොන්නරුව කච්චේරිය

පාවිච්චියට සුදුසු හා අලුත්වැඩියා කර පාවිච්චි කළ හැකි තුවක්කු තොගයක් 1969 සැප්තැම්බර් මස 15 වැනි දින පෙරවරු 10 ට පොලොන්නරුව දිසාපති කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියේදී ඉදිරිපත් විය හැක්කේ තුවක්කු අත්පත්කර ගැනීමේ අවසරපත් හිමියන්ට පමණි. වෙන්දේසියේ දී තෝරාගත් අයදුම්කරුවන් එවේලේම මුදල් ගෙවා එම තුවක්කු ඉවත් කර ගත යුතුයි.

කේ. බී. සූරියගොඩ,
පොලොන්නරු දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති.

1969.8.22 දින,
පොලොන්නරුව දිසාපති කාර්යාලය.

9–117—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## වෙන්දේසියේ විකිණීමයි

ගාල්ලේ ලබුදූවේ පිහිටි කෘෂිකර්ම ගොවිපලේ ඇති, හොඳ තත්වයේ හිස් කඩදාසි මළු 6,000 ක් සහ පලුදු කඩදාසි මළු 1,000 ක් පමණ 1969 සැප්තැම්බර් මස 30 වැනි දින පෙ.ව. 10. ට මෙම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මිළදී ගනු ලබන ද්‍රව්‍ය සඳහා එම ස්ථානයේදීම මුදල් ගෙවීම කළයුතු අතර එම ද්‍රව්‍යය එදිනම පස්වරු 3 ට පෙර ගොවිපලෙන් ඉවත් කරගත යුතුය.

පී. ටී. ජිනේද්‍රදස,
නියෝජ්‍ය අධ්‍යක්ෂ, අධ්‍යාපන
(කෘෂිකර්ම, ගොවිපල).

1969.8.23 දින,
පේරාදෙණියේ දීය.

9–108—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## රේගුවේ වෙන්දේසිය

පහත සඳහන් බඩු 1969.9.14 වන ඉරිද පෙ.ව. 9 ට රේගුවේ ගමන් බඩු කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. සැප්තැම්බර් 12 සහ 13 වන දිනයන් හි සාමාන්‍ය කාර්යාල වේලාවන්හිදී බඩු සෝදිසි කළ හැක.

2. එක් අයෙකුට එක ඔරලෝසුව බැගින්ම නැවත නොවිකිණීමටත් හෝ අන් අයුරකින් ඉවත් නොකිරීමටත් යන කොන්දේසිය අනුව අත් ඔරලෝසු විකුණනු ඇත. මේ සඳහා වගකීම් පත්‍රයක්ද අත්සන් කිරීමට ඇත.

3. සෑම විෂයකටම වෙන්දේසියෙන් පසු 50% බැගින් තැන්පත් මුදලක් ගෙවිය යුතුයි. වෙන්දේසිය අනුමත කළ දින සිට පෝය දින හා නිවාඩු දින හැර දින තුනක් ඇතුළත බඩු නොගෙන ගිය හොත් එම බඩු නැවත වෙන්දේසි කරන අතර තැන්පත්ව ඇති මුදල රජ සතු වන බව සැලකිය යුතුයි.

4. සම්පූර්ණ විස්තර ඇති ලැයිස්තු රේගුවේ ගාස්තු නිලධාරිගෙන් ලබාගත හැක.

කරාබුනැටි සහ වසාවාසි රාත්තල් 243 ක් පමණ
නොයෙක් වර්ග සිගරැට් 3,080 ක්
තැටි 17 ක්
චූයිං ගම් පැකට් 7 ක්
රේඩාර් කොටස්
ස්ත්‍රීන්ගේ ලේන්සු 1,056 ක් (ඉන්දියානු)
ලෝහ අත් වළලු 2,304 ක්
ලෝහ බෝල තිත් පෑන් 335 ක්
ලිප්ස්ටික් දුසිම 10 ක් (ඉන්දියානු)
රැවුල සැහීම් බුරුසු 66 ක්
යතුරු දම්වැල් දුසිම 20½
"මර්පි රිච්ඩ්ස්" විදුලි යන්ත්‍ර 6 ක්
චීස් ටින් 4 ක්
උල්පත් පෑන් තල 400 ක්
කැමරා 3 ක්
ගුවන් විදුලි යන්ත්‍ර කොටස්
සෙල්ලම් බඩු
රෙදි වියන මැෂින් කොටස්
ස්වර්ණාභරණ සාදන්නන්ගේ කියත් පැකට් 5 ක් (එකකට දුසිම 12 කි)
ස්වර්ණාභරණ මැණික් ගල් විෂයයන් 7 ක්
අත් ඔරලෝසු පටි 539 ක්
සාරි බෝඩර් පැකට් 6 ක් (එකකට රෝල් 5 (යාර 36 අඟල් 1½)
අත් ඔරලෝසු 13 ක් (ඔමීගා, සෙයිකෝ ආදී)
ගුවන් විදුලි යන්ත්‍ර 2 (ට්‍රාන්සිස්ටර්)
සෝනි ටේප් රෙකෝඩරයක්
ඇඳුම් පැලඳුම්, සුවඳ විලවුම් සහ නොයෙක් නොයෙක් ගෘහ භාණ්ඩ

වී. පී. සිල්වා,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

බී.ඔ. 148–3/69
1969.8.29 වන දිනැ,
රේගුවේ ගමන් බඩු කාර්යාලයේ දීයැ.

9—165—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ කොටුවේ ගුදම්වල තැන්පත් පහත සඳහන් බඩු 1969 සැප්තැම්බර් මස 22 වෙනි දින පෙ. ව. 10. ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 සැප්තැම්බර් මස 21 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියේදී මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය ඒඩී/විකිණීම්/9
1969 අගෝස්තු මස 24 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. බෙහෙත් බෝතල් 4යි
2. රෙදි බෑග් 1යි
3. ජැක් 1යි
4. ප්ලාස්ටික් භාජන පෙට්ටි 2යි
5. කාර් සීට් 1යි
6. ටින් මුඩි ගෝනි 1යි
7. ඕවල්ටින් දූසිම් 2යි
8. පොත් කාටූන් 2යි
9. පොත් පෙට්ටි 2යි
10. මෙරට බෙහෙත් ගෝනි 1යි
11. කියත්පටි මිටි 1යි
12. කැලි රෙදි බේල් 2යි
13. වීදුරු තඹලේරු කාටූන් 1යි
14. සේෆ්ටි රේසර් පෙට්ටි 1යි
15. උකු කිරි පෙට්ටි 2යි
16. වීදුරු තඹලේරු කාටූන් 1යි
17. විදුලි පන්දම් කාටූන් 2යි
18. දිනපොත් පෙට්ටි 1යි
19. පැන්සල් උල්කරණයන් පෙට්ටි 2යි
20. කිරිපිටි ටින් 6යි
21. වොයිල් මිටි 1යි
22. ගල්කුරු පෙට්ටි 1යි
23. අමතර කොටස් කාටූන් 1යි
24. එකතු කිරීමේ යන්ත්‍ර 2යි
25. පාවිච්චි කළ රෙදි බේල් 1යි
26. මුරියේට් පොටෑෂ් ගෝනි 76යි
27. හේසින් රෙදි බේල් 1යි
28. ටයර් fප්ලැප්ස් කැලි 147යි
29. කියර්ලොන්-බී ඩ්‍රම් 1යි
30. හිස් ඩ්‍රම් 1යි
31. ඊයම් පොලු 2යි
32. කඩදසි රිල් 1යි
33. හිස් රීල්ස් පෙට්ටි 4යි
34. පොටෑෂ් ගෝනි 21යි
35. කළු කාබන් ගෝනි 5යි
36. පොලිතින් ගෝනි 1යි
37. ක්ලේ ගෝනි 2යි
38. ක්ලේ ගෝනි 3යි
39. වයර් රිල් 1යි
40. උළුහාල් ගෝනි 1යි
41. මුංඇට ගෝනි 119යි
42. පාවිච්චි කළ වූල් රෙදි බේල් 1යි
43. ඩෙකරේෂන් සෙට් පෙට්ටි 2යි
44. පැන්සල් උල්කරනයන් කාටූන් 14යි
45. ප්ලාස්ටික් ටෝච් පෙට්ටි 1යි
46. පාවිච්චි කළ රෙදි බේල් 1යි
47. නෙස්ටෝමෝල්ට් කාටූන් 1යි
48. ප්ලාස්ටික් ටෝච් පැරටස් කාටූන් 1යි

9–107 —69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ කච්චේරිය—තුවක්කු වෙන්දේසිය

රජය සතුව ඇති තුවක්කු සහ රයිපල් තොගයක් 1969 ඔක්තෝබර් මස 1 වැනි දින පෙරවරු 10 ට කොළඹ කච්චේරියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වෙන්දේසියේදී ඉල්ලීමට අවසර ලැබෙන්නේ තුවක්කු මිළදී ගැනීමට බලපත්‍ර ඇති අයවළුන්ට පමණකි.

3. වෙන්දේසිය පිණිස ඇති තුවක්කු සහ රයිපල් 1969 සැප්තැම්බර් මස 28 වැනි දින සිට 30 වැනි දින දක්වා ඇති කාලය තුළ පස්වරු 3 සිට 4.30 දක්වා මෙම කාර්යාලයේදී පරීක්ෂාකර බැලිය හැක.

4. වෙන්දේසිය පවත්වන ස්ථානයට ඇතුල්විය හැක්කේ තුවක්කු ලබා ගැනීමට අවසර පත්‍ර ලබාගෙන ඇති අයවලුන්ට හෝ ඔවුන් විසින් ලියමන කින් බලය පවරන ලද නියෝජිතයින්ට පමණකි.

ඩී. ආර්. උමගිලිය,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1969 අගෝස්තු මස 26 වැනිද,
කොළඹ දිසාපති කාර්යාලයේදී ය.

9–103—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුව

පාවිච්චියට නුසුදුසු පහත සඳහන් බඩු 1969 සැප්තැම්බර් මස 19 වෙනි දින පෙරවරු 9.30 ට අවිස්සාවේල්ල පොලිස් බඩු ගබඩාවේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේ විකුණන බඩු—

(1) සපත්තු බුරුසු 16
(2) ඇඳුම් බුරුසු 5
(3) හම් සපත්තු කුට්ටම් 373
(4) කලු දිග මේස් 12
(5) බූට් සපත්තු කුට්ටම් 69
(6) හම් පටි 27
(7) බෙරේ තොප්පි 3
(8) කැන්වස් සපත්තු කුට්ටම් 14
(9) කාකි හට කබා 55
(10) කාකි කොට කලිසම් 75
(11) කාකි කැලැ කබා 34
(12) හට කබා වි.පො. හට 4
(13) හට කාකි දිග කලිසම් 7
(14) කාකි වැහි කබා 2
(15) කිඹ රග් කට්ටල් 8
(16) ගුදිරි 24
(17) ඇල තොප්පි 162
(18) පරණ පා පැදි 8
(19) හිස් ගැලොම් ටින් 34
(20) ගැලොම් 45හේ හිස් ටින් 4
(21) ගැලොම් 24රේ හිස් ටින් 3
(22) ගැලොම් 4රේ හිස් ටින් 16
(23) බෙලියර්ඩ් මේස 1
(24) ප්‍රථමාධාර ලාංඡන 2
(25) ගුවන් විදුලි යන්තර 2
(26) සට්ටන තොප්පි 4
(27) සර්ජ් පටිස් කුට්ටම 38
(28) රබර් වැහි කබා 7
(29) සර්ජ් වැහි කබා 10
(30) වානේ තොප්පි 4
(31) පොලිස් නලා සහ දම්වැල් 13

වෙන්දේසියට පෙර දින අවිස්සාවේල්ල සහකාර පොලිස් අධිකාරින්ගේ බඩු ගබඩාවේ දී මෙම බඩු පරීක්ෂා කර බැලිය හැකිය. වෙන්දේසිය අවසාන වූ විගසම මුදල් ගෙවා බඩු ඉවත්කර ගැනීම කළ යුතුය.

ඒ. එම්. ඊ. ජයසේන,
සහකාර පොලිස් අධිකාරි,
අවිස්සාවේල්ල,

පොලිස් කාර්යාලය,
අවිස්සාවේල්ල,
69.8.24.

9–74—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

## පොලිස් දෙපාර්තමේන්තුව

### සේවයට අයෝග්‍ය මෝටර් රථවාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සේවයට අයෝග්‍ය මෝටර් රථවාහන, වර්ෂ 1969 සැප්තැම්බර් මස 12 වෙනි සිකුරාද පෙරවරු 9 ට, කොළඹ 5—නාරාහේන්පිට, පොලිස් මධ්‍යම ගරාජයේදී, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දනුම් දෙමි. මෝටර් රථවාහනවල ලියා පදිංචි අංක පහත සඳහන් වේ :—

| බෙඩ් ෆෝර්ඩ් සැහැල්ලු වාහන | විලිස් ජීප් රථ | ට්‍රැම්ප් මෝටර් බයිසිකල් |
|---|---|---|
| සී.වී. 6165 | ඊ.ඇන්. 5263 | ඊ.ඇල්. 5409 |
| සී.වී. 6167 | ඊ.ඇන්. 5265 | ඊ.ඇන් 4278 |
| සී.වී. 6171 | ඊ.ඇන්. 5266 | ඊ.ඇන්. 5213 |
| සී.වී. 6172 | ඊ.ඇන්. 5282 | ඊ.ඇන්. 5214 |
| සී.වී. 6587 | | |
| සී.වී. 6589 | සන්බීම් ටැල්බට් කාර් | |
| සී.වී. 6810 | ඊ.වයි. 2816 | |
| සී.වී. 6811 | | |

මෝටර් රථ වාහන, කොළඹ 5—නාරාහේන්පිට, පොලිස් මධ්‍යම ගරාජයේදී වර්ෂ 1969 සැප්තැම්බර් මස 11 වෙනි බ්‍රහස්පතින්ද පෙරවරු 9 සිට පස්වරු 4 දක්වා කාලය තුළ බලා ගැනීමට තබනවා ඇත.

මිළට ගනු ලබන මෝටර් රථ වාහනවලට ගෙවිය යුතු මිළ මුදලින් එවේලේම ගෙවා, වර්ෂ 1969 සැප්තැම්බර් මස 12 වෙනි සිකුරාද පස්වරු 4 ට පෙර පිටපත්කර ගෙන යා යුතුවේ. මිළට ගනු ලැබූ යම් වාහනයක් ඉහත සඳහන් වේලාවෙන් පෙර පිටත් කරගෙන යනු නොලබා තිබුවොත්, ඒ වාහන සම්බන්ධයෙන් වගකීමක් මේ දෙපාර්තමේන්තුව භාර නොගන්නවා ඇත.

ජී. ජයසිංහ,
පොලිස් අධිකාරී, ප්‍රවාහණ අංශය.

1969 අගෝස්තු මස 16 වෙනි දින,
කොළඹ 5, නාරාහේන්පිට
පොලිස් ප්‍රවාහණ කාර්යාලයේදී ය.

8–44—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුව

### වෙන්දේසියේ විකිණීමයි

මෙහි පහත දක්වෙන දෑ, පැරණිබඩු, 1969.9.11 දින අ.භා. 2 ට කුලියාපිටිය සහකාර පොලිස් අධිකාරි කායඃාලයේ දී, වෙන්දේසියේ විකුණනු ලැබේ :—

| අංකය | බඩුවල විස්තර | ප්‍රමාණය |
|---|---|---|
| 1. | බූට් සපත්තු කුට්ටම් ... | 35 |
| 2. | හම් පටි ... ... | 28 |
| 3. | බෙරට් තොප්පි ... ... | 2 |
| 4. | කොහු ගුදිරි මෙට්ටා ... | 29 |
| 5. | පීක් කැප් ... ... | 1 |
| 6. | කාකි හට කබා ... ... | 24 |
| 7. | කාකි කැලෑ කබා ... | 7 |
| 8. | කාකි කොට කලිසම් ... | 37 |
| 9. | නිල පලස් ... ... | 12 |
| 10. | කාකි දිග කලිසම් ... | 4 |
| 11. | කාකි කැලෑ කබා පො.ප. ... | 3 |
| 12. | කාකි හට කබා පො.ප. ... | 1 |
| 13. | හම් පටි පො.ප. ... | 1 |
| 14. | වැහි කබා කලු ... ... | 7 |
| 15. | වැහි කබා පටි ... ... | 4 |
| 16. | වැහි කබා රබර් ... | 1 |
| 17. | වැහි කබා කාකි ... ... | 5 |
| 18. | හම් සපත්තු පො.කො. ... | 211 |
| 19. | කැන්වස් සපත්තු ... | 5 |
| 20. | ඇල තොප්පි ... ... | 123 |
| 21. | ගැලොම් හතරේ හිස් ටින් ... | 34 |
| 22. | ගැලොම් එකේ හිස් ටින් ... | 22 |
| 23. | යතුරු ලියනය (ඉංග්‍රීසි) ... | 1 |

ඉහත සඳහන් බඩු 1969.9.11 දින පූ.භා. 9 සිට අ.භා. 1 දක්වා කාලය ඇතුලත කුලියාපිටිය සහකාර පොලිස් අධිකාරිගේ කායඃාලයේදී බැලිය හැක.

කු. සිරිසේන,
සහකාර පොලිස් අධිකාරි, කුලියාපිටිය.

1969 අගෝස්තු මස 24 වැනි දින,
කුලියාපිටිය, පොලිස් කායඃාලයේ දී ය.

9–119—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වවුනියා අඩවියේ වවුනියා දැව ගබඩාව, පොම්පමඩු හන්දිය සහ වේලන් කුලම් යන ස්ථානවල ඇති ඝන අඩි 41·9 යුත් 1 වැනි පංතියේ ඉරූ දැව කැලි 61 සහ ඝන අඩි 1030·9 යුත් 1 වැනි පංතියේ කඳන් 127 වවුනියාවේ දිසා වන නිලධාරි විසින් 1969.9.16 දින පෙ.ව. 10 ට පොම්පමඩු හන්දියේදී වෙන්දේසි කරනු ලැබේ. (51/4 සැතපුම් කණුව, වවුනියාව–මන්නාරම පාර).

මෙම දැව වෙන්දේසිය කිරීමට ප්‍රථම පරීක්ෂාකර බලන ලෙස වෙන්දේසියෙන් දැව ගැනීමට අපේක්ෂාකරන සියලුදෙනාගෙන්ම කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වැඩි විස්තර මෙහි පහත අත්සන්කර ඇති අයගෙන් හෝ වවුනියා අඩවි වන නිලධාරින්ගෙන් ලබාගත හැකිය.

ඇම්. රත්වත්ත,
දිසා වන නිලධාරී—වවුනියාව.

දිසා වන කාර්යාලය,
වවුනියාව,
1969.8.17.

9–135—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

### මහනුවර දිස්ත්‍රික්කයේ 1969–70 වර්ෂයේ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්දයන් නැවත විකිණීම

මහනුවර දිස්ත්‍රික්කයේ 1969–70 වර්ෂයේ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවමින් මවිසින් අංක 14,862 සහ 1969 ජූලි මස 11 වෙනි දින දරණ ගැසට් පත්‍රයේ පළ කළ දැන්වීමේ සඳහන් කොන්දේසි සහ නියමයන් යටතේ පහත සඳහන් විදේශීය මත්පැන් තැබෑරුම්වල රේන්ද නැවත විකිණීම සඳහා 1969 සැප්තැම්බර් මස 12 වෙනි දින ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීම අවසන් කරන වේලාව පහත දක්වේ.

| විදේශීය මත්පැන් තැබෑරුමේ අංකය සහ නම | | ටෙන්ඩර් භාරගැනීම අවසන් කරන දිනය සහ වේලාව |
|---|---|---|
| අංක 3—පට්ටියගම | ... | 1969 සැප්තැම්බර් 12 වෙනිද පෙරවරු 10.00ට |
| අංක 4—සුස්සැල්ලාව | ... | 1969 සැප්තැම්බර් 12 වෙනිද පෙරවරු 10.30ට |

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත

1969 අගෝස්තු මස 23 වෙනි දින,
මහනුවර කච්චේරියේදී ය.

9–32—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

## කළුතර දිස්ත්‍රික්කයේ ඇලරේන්ද විකිණීම

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 දින තෙක් පහත සඳහන් ඇල වෙනුවෙන් රේන්ද ගාස්තු අය කිරීමේ හා එකතු කිරීමේ තනි අයිතිවාසිකම් මිළට ගැනීම සඳහා කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් කළුතර කච්චේරියේදී 1969 සැප්තැම්බර් මස 19 වැනි දින පෙරවරු 10 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කැපූ ඇල පිහිටි කළුතර පුරාණ ඇල සහ මෝදර ඇල සහ ගල්තුඩේ පිහිටි ඇල එක් රේන්ද පලකදී එකම දිනක් ඇතුලත රේන්ද ගාස්තු අය කිරීමෙන් අනිකුත් රේන්ද ගාස්තු ගෙවීම් වලින් නිදහස් වනු ඇත. (හතර මෝදර පිහිටි කළුතර අළුත් ඇල.)

3. එක් එක් ටෙන්ඩර් පත්‍රය කවරයක බහ සීල්/මුද්‍රා තබා, ඒ කවරයේ ඉහල වම් කෙළවරෙහි " කළුතර දිස්ත්‍රික්කයේ 1969–70 ඇල රේන්ද සඳහා ටෙන්ඩර් " යන්න සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර 1969 සැප්තැම්බර් මස 19 වැනි දින පෙරවරු 10 ට කලින් කළුතර දිසාපති වෙත ලැබිය යුතුයි. එම වේලාවේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ටෙන්ඩර්කරුවන් කළුතර කච්චේරියට පැමිණ සිටිය යුතුයි.

4. පත්කරනු ලැබූ ටෙන්ඩර්කරු ඇල රේන්ද විකුණූ දිනයේ එනම්, 1969 සැප්තැම්බර් මස 19 වැනි දින ගැණුම් මුදලෙන් තුනෙන් පංගුවක් එවේලේම කච්චේරියෙහි මුදලින් තැන්පත් කොට රේන්ද විකුණුම් කොන්දේසි පත්‍රය අත්සන් කළ යුතුය.

5. රු. 50 ක් තැන්පත් කළ බවට කච්චේරියකින් ලබාගත් කුවිතාන්සියක් එක් එක් ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතු බව ද, පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුවා එයට නියමිත කොන්දේසි පත්‍ර අත්සන් නොකර රේන්දයට ගෙවිය යුතු ඉහත සඳහන් නියමිත ඇප මුදල එවේලේම කච්චේරියේ තැන්පත් කළ නොහැකි වුවහොත් ඔහු විසින් ටෙන්ඩර් පත්‍රය භාර ගැනීම සඳහා තැන්පත් කරන ලද රු. 50 රාජසන්තක කිරීම සහ ඔහුට ඉන්පසු ආණ්ඩුවේ කොන්ත්‍රාත් ගැනීම අහිමි කිරීමට ක්‍රියා කරනු ලැබේ. පත් කරන ලද ටෙන්ඩර්කරු ගිවිසුම් පත අත්සන් කළාට පසු තැන්පත් කළ රු. 50 ඒ ඒ ටෙන්ඩර්කරුවන්ට ආපසු ගෙවනු ලැබේ.

6. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති වෙත පැවරී ඇත.

7. මේ පිළිබඳ වැඩි විස්තර කළුතර කච්චේරියෙන් දැන ගත හැක.

ලීල් ගුණසේකර,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති.

1969 අගෝස්තු මස 23 වැනි දින,
කළුතර දිසාපති කාර්යාලයේ දීය.

9–12—69.9.5 දින අංක 14,870 දරන ගැසට් පත්‍රය

---

## විවිධ දැන්වීම්

### ලක්සල—කොළඹ

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය, 1968–69**

ඉහත සඳහන් ආයතනය වාර්ෂික තොග ගණන් ගැනීම පිණිස 1969 සැප්තැම්බර් 26 වැනි දින සිට 1969 සැප්තැම්බර් 30 වැනි දින දක්වා (දෙදිනම ඇතුළුව) වසා තබනු ලැබේ.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක.

ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1969 සැප්තැම්බර් 5 වැනි ද.

9-38—69.9.5 දින අංක 14.870 දරන ගැසට් පත්‍රය

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ.**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ.)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දින වලට පෙරදින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමඟම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත " පිටපත " කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන් කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිතැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට | | පිටරට |
|---|---|---|---|
| | රු. ශ. | | රු. ශ. |
| එක් කොටසක් ... ... ... | 46 0 | ... | 60 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 0 | ... | 42 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 43 50 | ... | 51 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ | | තැපැල් ගාස්තු මෙරට |
|---|---|---|---|
| | රු. ශ. | | රු. ශ. |
| (අ) i ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලතදී එක කොටසක් ... ... ... | 0 50 | ... | 0 20 |
| ii ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 0 | | 0 20 |
| (ආ) i ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 30 | ... | 0 15 |
| ii ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 60 | ... | 0 15 |

දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

උපලේඛනය

**1969**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ජූනි | ... 69. 6. 6 සිකුරාද | ... 69. 5.30 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.13 සිකුරාද | ... 69. 6. 6 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.20 සිකුරාද | ... 69. 6.13 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.27 සිකුරාද | ... 69. 6.20 සිකුරාද | ප.ව. 3.30 |
| ජූලි | ... 69. 7. 4 සිකුරාද | ... 69. 6.27 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.11 සිකුරාද | ... 69. 7. 4 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.18 සිකුරාද | ... 69. 7.11 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.25 සිකුරාද | ... 69. 7.18 සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු | ... 69. 8. 1 සිකුරාද | ... 69. 7.25 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8. 8 සිකුරාද | ... 69. 8. 1 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.15 සිකුරාද | ... 69. 8. 8 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.22 සිකුරාද | ... 69. 8.15 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.29 සිකුරාද | ... 69. 8.22 සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් | ... 69. 9. 5 සිකුරාද | ... 69. 8.29 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.12 සිකුරාද | ... 69. 9. 5 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.19 සිකුරාද | ... 69. 9.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.26 සිකුරාද | ... 69. 9.19 සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | ... 69.10. 2 බ්‍රහස්පතින්ද | ... 69. 9.26 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.10. 9 බ්‍රහස්පතින්ද | ... 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.17 සිකුරාද | ... 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.24 සිකුරාද | ... 69.10.17 සිකුරාද | දවල් 12.00 |
| | 69.10.31 සිකුරාද | ... 69.10.24 සිකුරාද | දවල් 12.00 |
| නොවැම්බර් | ... 69.11. 7 සිකුරාද | ... 69.10.31 සිකුරාද | දවල් 12.00 |
| | 69.11.14 සිකුරාද | ... 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.11.21 සිකුරාද | ... 69.11.14 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.11.28 සිකුරාද | ... 69.11.21 සිකුරාද | ප.ව. 3.30 |
| දෙසැම්බර් | ... 69.12. 5 සිකුරාද | ... 69.11.28 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.12 සිකුරාද | ... 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 69.12.19 සිකුරාද | ... 69.12.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.26 සිකුරාද | ... 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි